# දෙසතිය

පුවත් සඟරාව
2025 ජුනි




# පොලිමර මෙල්ලය

# අලුත් අහස්යාත්‍රාව



ජාතික ගුවන් සේවයක ඇණියට පුළුල් බඳ සහිත ගුවන් යානා (Wide-body Aμrcraft) වැඩිපුර තිබෙන තරමට සාර්ථක, සුවපහසු සහ පුළුල් අන්තර්ජාතික මගී ප්‍රවාහන සේවාවක් පවත්වාගෙන යාම පහසු වනවා. 4R-ALT ලියාපදිංචිය සහිත Air Bus-A330-200 යානය කටුනායක ගුවන්තොටට සේන්දු වුණේ මේ අවශ්‍යතාව නිසා.

ප්‍රංශයේ පැරිස් නුවර සිට පැමිණි මේ ගුවන් යානය කොළඹ වෙරළ තීරය දිගේ පියාසර උස අඩි 1,500ක් පමණ වන අඩු උන්නතාංශයක, වරාය නගරයේ දකුණු කෙළවරේ සිට මොරටුව දක්වා ද කටුනායක ගුවන්තොටුපොළ ප්‍රදේශය හරහා ද ගොඩබෑමට පෙර ගුවන් පාලමක් නිරූපණය කරමින් (Flyover) ගුවන් සේවා ලෝලීන්ට සහ මහජනතාවට ආස්වාදනීය අවස්ථාවක් උදා කළා. ගුවන් තොටේදී සාම්ප්‍රදායානුකූල ව යානය පිළිගැනුණේ ජල ආචාරයෙන් (Ceremonial Water Salute).





මේ අලුත් සාමාජිකයා ද සමග ශ්‍රී ලංකන් ගුවන් යානා පවුල යානා 23ක් දක්වා වර්ධනය වනවා. ඒ, පුළුල් බඳ සහිත යානා 10ක් සහ පටු බඳ සහිත යානා 13ක් වශයෙන්. මේ වසර අවසන් වීමට මත්තෙන් තවත් අලුත් සමාජිකයන් දෙදෙනකුවත් එකතු කර ගැනීමටයි 'ශ්‍රී ලන්කන්' බලාපොරොත්තුව.

මේ අනුව පෙනී යන්නේ බිම දිගේ ඇදී ගිය ශ්‍රී ලංකන් ගුවන් සේවය තිරසර ලාභදායිතාවකුත් ආරක්ෂිත අනාගතයකුත් කරා ඉහළට පියාසර කරවන්නට රජයට තිබෙන ඕනෑකම. ලොව ආර්ථික සහ අන්තර්ජාතික සබඳතා අතින් සමෘද්ධිමත් රටකට මෙවැනි ගුවන් යානයක් පොඩි දෙයක් වුණාට බංකොලොත් ව තිබී නැංවෙන රටකට එවැන්නක් ලොකු දෙයක්.

(http://www.srilankan.com)

**කටු**

# දෙසතිය

පුවත් සඟරාව

වෙළුම 47, කලාපය 06,
2025 ජුනි

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කරණ මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීම - ප්‍රකාශන කාර්යාංශය
දු. අ. 011 - 2512759

උපදේශක සංස්කාරක
**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛක
**රංගිකා අබේසේකර**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

**හිතවත් පාඨකයිනි,**

47 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**

මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.

## කවරයේ කතාව




22



15
ලී ජේ-මියුං මුල් පුටුවට



03
අධිෂ්ඨාන දේශයේ රාජ්‍ය සංචාරය



32
මහින්දාගමනයේ සංදේශය



12
ජවිපෙට 60



40
පිබිදෙන රග්බි

# දෙසතිය
පුවත් සඟරාව

# වසංගතවලට පිළියම පිරිසිදු පරිසරය

නිරෝගිකම තරම් වටිනා වෙනත් සම්පතක් කිසි ම ජීවියකුට නැහැ. 'ආරෝග්‍යා පරමා ලාභා' යන බුදු වදනේ අරුත ද එයමයි. මානව වර්ගයාගේ පැවැත්ම තීරණය වීමේ ප්‍රධාන නිර්ණායකයක් ද වන්නේ නිරෝගිකම.

ගෝලීය ව අසන්නට, දකින්නට ලැබෙන රෝග, වසංගත නිමක් නොවන තරම්. මේ තත්ත්වයට හේතු විමසා බැලීම විශේෂයෙන් වෛද්‍ය වෘත්තිකයන් ඇතුළු ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ කාර්යය වුවත් ඒ පිළිබඳ දැනුවත් ව සිටීම එයින් ආරක්ෂා වීමට පොදු ජනයා වශයෙන් අපට ඉතා වැදගත් වනවා. එසේ ම ඒ සඳහා කළ හැකි පහසුම කාර්යය වූ නිවැරදි සෞඛ්‍ය පුරුදු අනුගමනය කිරීමටත් එය ප්‍රයෝජනවත්.

මේ දිනවල ගෝලීය ව මෙන් ම ශ්‍රී ලංකාවේ ද පැතිරෙමින් තිබෙන චිකුන්ගුන්‍යා (Chakungunya) රෝගය පිළිබඳ ජනතා භීතියක් ඇති ව තිබුණත් වෛද්‍ය අංශ අනාවරණය කරන්නේ එය එසේ නොවිය යුතු බව සහ ඩෙංගු රෝගය මෙන් චිකුන්ගුන්‍යා රෝගය මාරාන්තික නොවන බව.

මේ රෝගය පැතිරීමට අවශ්‍ය පාරිසරික සාධක එනම් විශේෂයෙන් වර්ෂාපතනය සමග මදුරු ගහනය වැඩිවීම වැනි හේතු නිසා මේ තත්ත්වය උද්ගත වී තිබෙනවා. වයිරසයකින් ඇති වන චිකුන්ගුන්‍යා රෝගයේ වාහක මදුරුවන් වන්නේ ඊඩිස් ඊජිප්ටයි (Aedes aegypti) සහ ඊඩිස් ඇල්බොපික්ටස් (Aedes albopictus). මේ මදුරුවන් ඩෙංගු රෝගයේ ද වාහකයන්.

හෙළි වන ආකාරයට මුලින් ම චිකුන්ගුන්‍යා රෝගය හඳුනාගෙන ඇත්තේ අප්‍රිකානු රටක් වන ටැන්සානියාවෙන්. එය මේ වන විට රටවල් 100කට අධික ව ව්‍යාප්ත වී තිබෙනවා.

මේ රෝගයේ වාහක මදුරුවන් වැඩි වශයෙන් දෂ්ට කරන්නේ රාත්‍රී කාලයට වඩා දිවා කාලයේ. මදුරුවන් දෂ්ට කිරීමෙන්, ගර්භිණී මවකගෙන් තම දරුවාට බෝවීමෙන්, රුධිරය හා රුධිර සංඝටක පාරවිලනයෙන් යන ආකාර ත්‍රිත්වයෙන් පැතිරෙන මේ රෝගයේ ලක්ෂණ වන්නේ අධික උණ තත්ත්වය, හන්දිපත් වේදනාව හා ඉදිමීම, සමෙහි ඇතිවන කුෂ්ඨ, හිසරදය, ඇස යට කැක්කුම, මස් පිඩු වේදනාව, අධික තෙහෙට්ටුව, ආහාර අරුචිය, මුඛය ආශ්‍රිත ව ඇති වන තුවාල යනාදිය බව වෛද්‍යවරුන් පවසනවා. මේ රෝගයට විශේෂිත ඖෂධයක් නැහැ. වෛද්‍යවරු ප්‍රතිකාර කරන්නේ රෝග ලක්ෂණ මත. මේ නිසා රෝගයෙන් වැළකී සිටීමයි වැදගත්.

ඒ සඳහා මදුරුවන් බෝවන ස්ථාන ඉවත් කිරීම මෙන් ම මදුරුවන් දෂ්ට කිරීම වැළැක්වීම වැනි ක්‍රම අනුගමනය කිරීම සාර්ථක වන බවයි සෞඛ්‍ය අංශවල අවධාරණය. ගෙවතු ආශ්‍රිත ව මදුරුවන් බෝවන කානු, වැහි පීලි, මල් පෝච්චි වැනි ස්ථාන පිරිසිදු කිරීමත් විශේෂයෙන් වැඩබිම්, කාර්යාල පරිශ්‍ර යනාදී ස්ථාන පිරිසිදු ව තබා ගැනීමත් කළ යුත්තක්.

එහෙත් මේ සම්බන්ධයෙන් මහජනතාව කොතෙක් දැනුවත් කළත් එවැනි යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරන්නේ නීතියෙන් බේරී සිටීමට පමණක් නම් එහි අනිටු ඵල විපාක විඳීමට සිදු වනු ඇත්තේ ඔවුන්ට ම. විටෙක මහජනතාව සිතන්නේ පරිසර සුරක්ෂිතතාව යනු පළාත් පාලන ආයතනවල හෝ රජයේ කාර්යයක් මිස තමන් ඊට දයක වීම අත්‍යාවශ්‍ය කාර්යයක් නොවන බව. එසේ සිතන තාක් මහජනතාවට ජීවිතවලින් වන්දි ගෙවීමට සිදු වීම වැළැක්විය නොහැකි වනු ඇති. මේ නිසා ආකල්ප සංවර්ධනයකින් පරිසරයට ආදරය කරන පුරවැසියන් බවට පත් වීමයි කළ යුත්තේ.

මාලා මල්කාන්ති තරණගමගේ

\- සංස්කාරක -

## දෙසතිය සඟරා දායකත්වය

වාර්ෂික දායකත්වය රු. 1500.00
අර්ධ වාර්ෂික දායකත්වය රු. 750.00

**මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ මුදල් තැන්පත් කිරීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ, ගිණුම් අංක 119100109026220 -මහජන බැංකුව, නාරාහේන්පිට' ගිණුමට මුදල් තැන්පත් කර ඔබගේ ගෙවීම තහවුරු කිරීමට අදාළ බැංකු බැරපත හා සඟරා දායකත්ව කූපන්පත 071-9303111 අංකයට Whatsapp කරන්න. (Remarks/Decription යන ස්ථානයේ 'Desathiya' ලෙස සටහන් කරන්න)

**මුදල් ඇණවුම් එවීමේදී**

'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා ගෙවන තැපැල් කාර්යාලය 'කම්කරු මහලේකම් කාර්යාලය, නාරාහේන්පිට' ලෙස යොමු කර රජයේ ප්‍රකාශන කාර්යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට එවන්න. අංකය සහ දිනය සහිත චෙක්පත් ද 'රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ' නමට ලියා මෙම ලිපිනයට යොමු කරන්න. විමසීම් - 0112512759

## දෙසතිය

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ..........
Address ..........
ID Number .......... Tel / Mobile ..........
Signature .......... Date ..........



# අධිෂ්ඨාන දේශයේ රාජ්‍ය සංචාරය

චන්දන මාරසිංහ

මෙදෙරට රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවල 55 වැනි සංවත්සරය (1970-2025) නිමිති කරගෙන වියට්නාම ජනාධිපති Luong Cuongගේ ආරාධනයකට අනුව ශ්‍රී ලංකා ජනාධිපති අනුර කුමාර දිසානායක වියට්නාමයේ තෙදින (මැයි 04-06) රාජ්‍ය සංචාරයක නියැළුණා. සංචාරය අතරතුර ද්විපාර්ශ්වික, කලාපීය සහ ජාත්‍යන්තර වශයෙන් වැදගත් වන කාරණා රැසක් කෙරෙහි අවධානය යොමු කෙරුණා. ශ්‍රී ලංකා ජනාධිපතිවරයාට එක්සත් ජාතීන්ගේ වෙසක් දින උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වීමට ඇරයුම් ලැබීම මේ සංචාරයේ සුවිශේෂත්වයක්.

වියට්නාමයේ නෝයි බායි (Noi Bai) ජාත්‍යන්තර ගුවන්තොටුපොළේදී වියට්නාම කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කමිටු සාමාජිකයකු සහ විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය Nguyen Manh Cuong ඇතුළු රාජ්‍ය නියෝජිතයන් විසින් ශ්‍රී ලංකා ජනාධිපතිවරයා ප්‍රමුඛ දූත පිරිස පිළිගනු ලැබුවා. එම අවස්ථාවට ශ්‍රී ලංකාවේ වියට්නාම තානාපති Trinh Thi Tam, වියට්නාමයේ ශ්‍රී ලංකා තානාපති පෝෂිත පෙරේරා එක් ව සිටියා. මේ සංචාරයට විදේශ කටයුතු අමාත්‍ය විජිත හේරත් ද එක් වුණා.

වියට්නාම ජනාධිපති මන්දිරයේදී ශ්‍රී ලංකා ජනාධිපතිවරයා පිළිගැනුණේ ත්‍රිවිධ හමුදා උත්තමාචාර මැද මහත්හරසරින්. ජනාධිපති Luong Cuong, අගමැති Pham Minh Chinh, වියට්නාම කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් To Lam සහ ජාතික සභාවේ සභාපති Tran Thanh Man සමග ශ්‍රී ලංකා ජනාධිපතිවරයා ද්විපාර්ශ්වික සාකච්ඡාවල නිරත වුණා. එම සාකච්ඡාවලදී දෙරටේ ප්‍රගති සමාලෝචන සහ අනාගත සහයෝගිතාව පිළිබඳ අවධානය යොමු වූ අතර දේශපාලන විශ්වාසය වැඩිදියුණු කිරීම මෙන් ම දෙරට අතර විවිධ අංශ මගින් ප්‍රායෝගික හා ඵලදායී සහයෝගිතාව වර්ධනය කිරීමට මේ සාකච්ඡා ඉවහල් වීම ඉතා වැදගත්.

1970 ජූලි 21 දින රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා ඇතිවීමෙන් අනතුරු ව දෙරට අතර ශක්තිමත් සබඳතා පැවතුණා. ශ්‍රී ලංකාව සහ වියට්නාමය අතර වාර්ෂික ද්විපාර්ශ්වික වෙළෙඳාම ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 200ක්. ඉදිරි වසරවලදී එය ඇමරිකානු ඩොලර් බිලියනය දක්වා වර්ධනය කිරීම සැලසුම වී තිබෙනවා. දෙරට අතර ශක්තිමත් ආයෝජන ප්‍රවාහ වැඩිදියුණු කිරීමට නායකයන් එකඟ වුණා. 2025 මාර්තු 31 දින වන විට ඇමරිකානු ඩොලර් මිලියන 43කට වඩා වැඩි ලේඛනගත ප්‍රාග්ධනයක් සහිත ව්‍යාපෘති 33ක් සඳහා ශ්‍රී ලංකාව විසින් කරන ලද ආයෝජන පිළිබඳ වියට්නාම පාර්ශ්වයේ ඇගයුම හිමි වීම විශේෂත්වයක්.


ප්‍රධාන දේශනය පවත්වමින්

**මැයි 6 දින වියට්නාමයේ හෝ චී මින් නගරයේදී පැවැත්වුණු එක්සත් ජාතීන්ගේ 20 වැනි වෙසක් දින උත්සවයේදී 'මානව ගරුත්වය සඳහා සහයෝගිතාව සහ ඉවසීම, ලෝක සාමය සහ තිරසර සංවර්ධනය සඳහා බෞද්ධ අවබෝධය' යන තේමාවෙන් එහි ප්‍රධාන දේශනය පැවැත්වීමට ජනාධිපති අනුර කුමාර දිසානායක එක් වුණා. ඉන්දියාව, නේපාලය, ලාඕසය සහ කාම්බෝජය යන රටවල ඉහළ පෙළේ නියෝජිතයන් ඇතුළු ව 2800ක පමණ පිරිසක් මේ සමුළුවට සහභාගි වී සිටියා.**



වියට්නාමයේ නෝයි බායි (Noi Bai) ජාත්‍යන්තර ගුවන්තොටුපොළේදී ශ්‍රී ලංකා දූත පිරිස පිළිගනිමින්

ශ්‍රී ලංකා ජනාධිපතිවරයා වියට්නාම සංචාරයෙදී දෙරටේ සාම්ප්‍රදායික මිත්‍රත්වයට ශ්‍රී ලංකාව දක්වන කැපවීම අවධාරණය කළා. ඩිජිටල් පරිවර්තනය, ඩිජිටල් ආර්ථිකය, බලශක්ති සංක්‍රාන්තිය මෙන් ම කෘත්‍රිම බුද්ධිය සම්බන්ධයෙන් ද මේ සංචාරයේදී අවධානය යොමු වුණා.

මෙහිදී අත්සන් තැබුණේ ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර අවබෝධතා ගිවිසුම් 04කට. දෙරටේ රේගු කටයුතු පිළිබඳ සහයෝගිතා ගිවිසුම, යන්ත්‍ර උපකරණ නිෂ්පාදන සහයෝගිතාව පිළිබඳ අවබෝධතා ගිවිසුම, කෘෂිකර්ම සහයෝගිතා පිළිබඳ අවබෝධතා ගිවිසුම, වියට්නාම වෙළෙඳ ප්‍රවර්ධන නියෝජිත ආයතනය හා ශ්‍රී ලංකා ආපනයන සංවර්ධන මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුම ඊට අයත්. මේ ගිවිසුම්වලින් රටවල් දෙකට ම හිමිවන්නේ වරප්‍රසාද රැසක්. දෙරටේ විශේෂඥතාව බෙදා ගැනීම මෙන් ම රාජ්‍ය තාන්ත්‍රිකයන්, විද්වතුන්, නිලධාරින් සහ පර්යේෂකයන් හුවමාරු කර ගැනීමත් අධ්‍යයනය හා පර්යේෂණ වැඩසටහන් පැවැත්වීමත්



ත්‍රිවිධ හමුදා උත්තමාචාර මැද මහත් හරසරින් පිළිගත් මොහොත



වියට්නාම ජනාධිපති Luong Cuong සමග ශ්‍රී ලංකා ජනාධිපති

ඒ අතර වනවා. පුහුණුවීම්වලට අදාළ කරුණු සංවිධානය කිරීමටත් බලධාරීන්ගේ අවධානය යොමු වුණා. පුළුල් පරාසයක වෙළෙඳ ක්‍රියාකාරකම්වලට ද මේ අවබෝධතා ගිවිසුම්වලින් පහසුකම් සැලසෙනවා. වෙළෙඳපොළ බුද්ධිමය තොරතුරු හුවමාරු කර ගැනීම, ප්‍රදර්ශන සහ ප්‍රවර්ධනය වෙනුවෙන් ඒකාබද්ධ සහයෝගිතාව ඇති කිරීම සහ ව්‍යාපාරික නියෝජිතයන් අතර සාකච්ඡා සංවිධාන කිරීම ද මෙහිදී කැපී පෙනෙනවා. ආහාර, ධීවර සහ ඇඟලුම් අංශවල අවස්ථා දෙරටට ම ලබා ගැනීමටත් මේ ගිවිසුම්වලින් පහසුකම් සැලසීම ඉතා වැදගත්.

වියට්නාම ව්‍යාපාරික ප්‍රජාව එක් ව පැවැත් වූ සාකච්ඡා සඳහා ශ්‍රී ලංකා ජනාධිපතිවරයා සමග දේපළ වෙළෙඳාම් සහ සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ආයෝජකයන්, ආකර්ෂණීය උද්‍යාන සංවර්ධනයේ ප්‍රමුඛතම ආයතන නියෝජිතයන් මෙන් ම ඩිජිටල් පරිවර්තනයේ පුරෝගාමී ආයතන නියෝජිතයන් ද සහභාගි වී සිටියා.

මැයි 05 දින ජනාධිපති මන්දිරයේ හෝ චි මින් අනුස්මරණ භූමිය නැරඹීමට එක් වූ ශ්‍රී ලංකා ජනාධිපතිවරයා හෝ චි මින් සොහොන් ගැබට සහ යුද විරු ස්මාරකයට පුෂ්පෝපහාර දැක්වූවා. අග්නිදිග ආසියාවේ විශාලතම බෞද්ධ විහාරස්ථාන අතර තිබෙන බායි ඩිං (Bai Dinh) විහාරස්ථානයට පැමිණි ජනාධිපතිවරයා ආගමික වතාවත්වල නිරත වෙමින් ආශීර්වාද ලබා ගත්තා. විහාරස්ථාන භූමියේ පිහිටි බෝධීන් වහන්සේ 2023 වසරේදී ශ්‍රී ලංකාවෙන් පූජා කළ අනුරාධපුර ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛාවක්. මෙරට මධ්‍යම සංස්කෘතික අරමුදලේ තාක්ෂණික මඟ පෙන්වීම යටතේ බෝධීන් වහන්සේ වටා ඉදිකරන ලද ප්‍රාකාරය ද ජනාධිපතිවරයා විසින් විවෘත කරනු ලැබුවා.

මැයි 6 දින වියට්නාමයේ හෝ චී මින් නගරයේදී පැවැත්වුණු එක්සත් ජාතීන්ගේ 20 වැනි වෙසක් දින උත්සවයේදී 'මානව ගරුත්වය සඳහා සහයෝගිතාව සහ ඉවසීම, ලෝක සාමය සහ තිරසර සංවර්ධනය සඳහා බෞද්ධ අවබෝධය' යන තේමාවෙන් එහි ප්‍රධාන දේශනය පැවැත්වීමට ජනාධිපති අනුර කුමාර දිසානායක එක් වුණා. ඉන්දියාව, නේපාලය, ලාඕසය සහ කාම්බෝජය යන රටවල ඉහළ පෙළේ නියෝජිතයන් ඇතුළු ව 2800ක පමණ පිරිසක් මේ සමුළුවට සහභාගි වී සිටියා.

"නොපසුබට උත්සාහය, අසාමාන්‍ය අධිෂ්ඨානය, නිශ්චිත කැපවීම, උපායමාර්ගික ඉලක්කය හා අද්විතීය ප්‍රතිඵල ගෙන දෙන, වේගයෙන් සහ ආදර්ශයෙන් නැගී සිටින රටක පැවැත්වෙන එක්සත් ජාතීන්ගේ වෙසක් දින සැමරුම් උත්සවයේ ප්‍රධාන දේශනය සිදු කිරීමට ලැබීම සම්බන්ධයෙන් මම බෙහෙවින් සතුටට පත් වෙමි.

වසර සිය ගණනක් පුරා ඉකිබිඳිමින් හඬන්නට සිදුවන වේදනාබර අත්දැකීම් තිබියදී, ඒ සියල්ල පරදා ධෛර්යය සම්පන්න ලෙස නැගී සිටීමේ මාර්ගය සකස්කර ගත් විශ්මයජනක රට වියට්නාම් දේශයයි. ඉතිහාසයේ දරුණුතම රසායනික අවි ප්‍රහාරවලින් කුරිරු ම අසාධාරණයට ලක් වී පන්නරය ලැබූ ඔබේ රට ලබාගත් ජයග්‍රහණ සම්බන්ධයෙන් අපට ඇත්තේ මහත් ආඩම්බරයකි. එනයින් මම ඔබේ රට අධිෂ්ඨානයේ දේශය නමින් ද හඳුන්වා දීමට කැමැත්තෙමි."

මෙලෙසින් සිය දේශනයට ප්‍රවේශය ලබා ගත් ශ්‍රී ලංකා ජනාධිපතිවරයා යුද්ධයෙන් පසු බොහෝ අයට ඉතිරි



අවබෝධතා ගිවිසුම්වලට එළඹි මොහොත



හෝ චි මින් සොහොන් ගැබට සහ යුද විරු ස්මාරකයට පුෂ්පෝපහාර දක්වමින්



වියට්නාම කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් To Lam සමග



ව්‍යාපාරික ප්‍රජාව සමග සාකච්ඡා පවත්වමින්

වන්නේ බේදවාචකයක් සහ වේදනාවක් පමණක් බවත් එම වේදනාව වළක්වා ගත හැක්කේ සාමය සහ හික්මීමෙන් පමණක් බවත් එහිදී පෙන්වා දුන්නා.

1999 වසරේ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේදී වෙසක් දිනය ජාත්‍යන්තර ව පිළිගත් දිනයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට යෝජනාව ඉදිරිපත් කළේ ශ්‍රී ලංකාවේ හිටපු විදේශ අමාත්‍ය දිවංගත ලක්ෂ්මන් කදිරගාමර්. ඉන්පසු එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් ජාත්‍යන්තර වෙසක් දිනය ප්‍රකාශයට පත් කරනු ලැබුවා. සාමයෙන් හා හික්මීමෙන් කටයුතු කිරීමේ අගය, මීට වසර දෙදහස් පන්සියයකට පෙර බුදුන් වහන්සේ අනුදැන වදාළ එහි වටිනාකම ශ්‍රී ලාංකික ජාතියක් ලෙස අප උකහා ගත් බවත් මාපිය දූ දරු සබඳතා, නෑ හිතවත් සබඳතා, ගුරු සිසු සබඳතා පොහොසත් ලෙස අප රටට හිමි ව තිබෙන බවත් තමන්ගේ රුධිරය තවත් කෙනකුගේ ජීවිතයක් බේරා ගැනීමට දානයක් ලෙස ලබා දෙන ලොව වෙනත් කිසිදු රටක් පිළිබඳ ව නොදන්නා බවත් ජනාධිපතිවරයා එහිදී අවධාරණය කළා. බුදු දහමින් පෝෂණය වූ යුද ගිනි නිවී සාමය පිරුණු ලෝකයක්, ආදරයෙන් පිරුණු සමාජයක් සහ කරුණාවෙන් පිරුණු ජීවිතයක් වෙනුවෙන් මෙන් ම සියලු ජාතීන් සහ සියලු මිනිසුන් අතර සාමය, සංවර්ධනය සහ ගෞරවය ඇති කිරීම සඳහා බුදුන් වහන්සේ අනුදැන වදාළ දහමේත් බෞද්ධ දර්ශනයේත් ආභාසය ලබා ගන්නා ලෙසටත් ජනාධිපතිවරයා සිය දේශනය අවසානයේදී සියලු දෙනාට ආරාධනා කළා.

මේ ඔස්සේ දෙරට අතර බෞද්ධ සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමට අවකාශ ලැබුණු අතර වසර 55ක් ශ්‍රී ලංකාව හා වියට්නාමය අතර ගොඩනැගුණු ඉහළ මට්ටමේ දේශපාලන විශ්වාසය මෙන් ම සාම්ප්‍රදායික මිත්‍රත්වය සහ බහුවිධ සහයෝගිතාව වර්ධනය කර ගැනීමටත් මේ සංචාරයේදී හැකියාව ලැබුණා. ජාතික සංවර්ධනයේදී දෙරට අතර ඇති සමීප මිත්‍රත්වය මෙන් ම සහයෝගය ඉදිරියේදී වඩාත් ශක්තිමත් ව පවත්වාගෙන යාමටත් මේ සම්බන්ධතා ඉවහල් වනු ඇති.

# ගොවි බිමට පුනරුදය

**කාංචනා සිරිවර්ධන**

රටේ දිළිඳු බව තුරන් කිරීම නව රජයේ මූලික අරමුණක්. ඒ අනුව මහවැලි කලාපවල දිළිඳු බව තුරන් කරමින් මහවැලි ප්‍රජාවගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික හා ආධ්‍යාත්මික සංවර්ධනය ඇති කිරීමට කඩිනම් සැලසුමක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව වටහා ගනිමින්, 'ගොවිබිමට පුනරුදය' ජාතික වැඩසටහන ආරම්භ කෙරුණේ මහවැලි අධිකාරියේ පරිපාලන ව්‍යුහය යටතේ පවතින ගොවි සංවිධාන පද්ධතිය සම්බන්ධ කරගනිමින්.

මේ වැඩසටහන මහවැලි අධිකාරිය ක්‍රියාත්මක කරන්නේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ උපදෙස් මත. මහවැලි කලාපවල ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීම වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් වෙන් කෙරෙන ප්‍රතිපාදන බෙදාදීමේදී මෙවර 'ගොවිබිමට පුනරුදය' වැඩසටහන ක්‍රියාත්මක කිරීමට වැඩි ප්‍රමුඛත්වයක් ලබා දී තිබීම ඉතා වැදගත්. 'එක මිටට ගොවි බිමට' සහ 'වාරි මහිම' අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ මහවැලි අධිකාරිය ක්‍රියාත්මක කරන අනෙකුත් ව්‍යාපෘති.

'ගොවි බිමට පුනරුදය' ජාතික වැඩසටහනෙහි සමාරම්භය මැයි 15 දින මහවැලි අධිකාරියේ බිසෝපුර මහවැලි කලාපයෙන් සනිටුහන් වුණා. ඒ, මහවැලි ඩී කලාපයේ බිසෝපුර නේවාසික ව්‍යාපාර කළමනාකාර කාර්යාලයේදී. සමාරම්භක වැඩසටහන යටතේ මහවැලි ඩී කලාපයේ බිසෝපුර ගොවි සංවිධාන 15කට, එක් සංවිධානයකට රුපියල් මිලියනය බැගින් මූල්‍යාධාර පිරිනැමුණේ තෝරා ගත් ව්‍යාපෘති 15ක් ක්‍රියාත්මක කිරීමට.

ඒ අනුව තෝරාගත් ගොවි සංවිධාන 1000කට ව්‍යාපෘති 1000ක් සඳහා රුපියල් මිලියන 1000ක් මේ යටතේ ප්‍රදානය කෙරෙනවා. ව්‍යාපෘතිය තෝරාගැනීම, ව්‍යාපෘති පිළිබඳ විශේෂ සංවර්ධන කමිටු සාකච්ඡාව, සංශෝධන සිදු කිරීම හා ගොවි සංවිධාන මහා සභාවේ අනුමැතිය ලබාගැනීම, විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් අනුමැතිය ලබාදීම හා කාර්යය ආරම්භ කිරීම යන මූලික පියවර ඔස්සේයි මේ වැඩසටහන ක්‍රියාත්මක වන්නේ.

අදාළ ගොවි සංවිධාන බල ප්‍රදේශයේ ප්‍රජාවගේ දිළිඳුභාවය තුරන් කිරීම ප්‍රමුඛ අරමුණ කර ගත් මේ වැඩසටහන යටතේ සෑම ගොවි සංවිධානයක ම කාලීන හා ප්‍රජාවට සෘජු ප්‍රතිලාභ අත්වන අත්‍යාවශ්‍ය සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට උපරිම වශයෙන් රුපියල් මිලියනයක් හිමි වුව ද ඒ සඳහා උපරිම ශ්‍රම දායකත්වයක් ලබාගැනීමෙන් ග්‍රාමීය සංවර්ධනයක් ඇති කිරීම අරමුණු කෙරෙනවා. මෙහිදී උපරිම ප්‍රමිතියකින් යුතු ව හා ඉහළ සාමාජික සහභාගිත්වයකින් යුතු ව නියමිත සංවර්ධන කාර්යය ඉටු කරවා ගැනීම, ගොවි සංවිධාන සාමාජික සාමාජිකාවන් තුළ වඩාත් සමීප සම්බන්ධතාවක් ඇති කිරීමට හා සාමූහික වශයෙන් පොදු කටයුතුවල නිරත වීමට ගොවියන් උනන්දු කරවීම, ගොවි සංවිධානය විසින් ම පමණක් එම කාර්යය නිම කිරීම යන කාරණා මේ වැඩසටහනේ පැහැදිලි ව අන්තර්ගත වනවා.

මේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මහවැලි අධ්‍යක්ෂ ජනරාල් එච් එම් ජේ කේ හේරත් දක්වා සිටියේ මෙබඳු අදහසක්. ඔහු; "ගොවිබිමට පුනරුදය යනු ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මහවැලි කලාප 10යේ ක්‍රියාකාරී ගොවි සංවිධාන ආර්ථික හා සමාජීය වශයෙන් ශක්තිමත් කරන වැඩසටහනක්. ගොවි සංවිධානවලින් තමන්ගේ බල ප්‍රදේශයේ පොදු යහපත පිණිස වන ඉදිකිරීම් ගණයේ ව්‍යාපෘති යෝජනා කැඳවීමක් අප මෙහිදී සිදු කළා. ඒ අතරින් තෝරාගත් ව්‍යාපෘති 1000කට මහවැලි අධිකාරියෙන් ඇස්තමේන්තු සකස් කර උපරිම රුපියල් මිලියනයක් දක්වා මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙන අතර ම තාක්ෂණික සහයත් ලබා දෙනවා. කොන්ත්‍රාත්තුව දෙන්නේ ගොවි සංවිධානයට. ගොවි සංවිධානය ඔවුන්ගේ ශ්‍රමය සහ උපකරණ යොදාගෙන ව්‍යාපෘතිය අවසන් කළ යුතු යි. කම්කරු ශ්‍රමය ගොවි සංවිධානයේ සාමාජිකයන් ස්වෙච්ඡාවෙන් දිය යුතුයි. කොන්ත්‍රාත් පිටස්තර පුද්ගලයන්ට ලබාදීම තහනම්. ව්‍යාපෘතියෙන් යම් ලාභයක් ලැබෙනවා නම් ඒ ලාබය ගොවි සංවිධානයේ අරමුදලට එකතු විය යුතු යි."

මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ (සැලසුම්) ලංකා බණ්ඩාර පවසන ආකාරයට මහවැලි අධිකාරියේ මහවැලි කලාප 10 යටතේ ගොවි සංවිධාන තිබෙනවා 1082ක්. මහවැලිය මූලික ව ම කෘෂිකර්මාන්තය මත පදනම් වූ ව්‍යාපාරයක්. මීට අදාළ ව මීන් පෙර සංවර්ධන සහ ප්‍රතිසංස්කරණ බොහෝ විට සම්පූර්ණයෙන් ම සිදු කරනු ලැබුවේ රජය විසින්. එහෙත් 'ගොවි බිමට පුනරුදය' වැඩසටහන යටතේ වැව්, ග්‍රාමීය මාර්ග, වාරි ඇළ පද්ධති පුනරුත්ථාපනය වැනි තෝරාගත් ව්‍යාපෘති 1000 සඳහා ශ්‍රම දායකත්වය ලබාදෙන්නේ ගොවි සංවිධාන නිසා ප්‍රජාපාදක ව්‍යාපෘතියක් ලෙස ග්‍රාමීය සංවර්ධනයට මෙහි ඉහළ ප්‍රතිඵල අත්කර ගැනීමට හැකි වීම ඉතා වැදගත්.

ගොවියාට පමණක් නොව රටට ම සුබසෙත සැලසීමේ මුඛ්‍ය පරමාර්ථය ඇති ව ආරම්භ කරන ලද මෙහි නිසි ඵල නෙළා ගැනීම කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය මත තීරණය වනු ඇති.





# අපේ බදු අපටමයි

දීප්ත කුමාර බටගොඩ

මල නොතලා රොන් ගන්නා බඹරකු නිසා, මලටත් බඹරාටත් ප්‍රයෝජන අත්වන්නේ යම් සේ ද, එවැනි වූ ජාතික බදු ප්‍රතිපත්තියකින් පුරවැසියාටත් රටටත් යහපතක් ම උදා වනු ඇති.

මිනිසා 'රාජ්‍ය' බිහි කර ගත් දින සිට ම බදු සංකල්පය ද ආරම්භ වූ බවයි සැලකෙන්නේ. අප රජයක් බිහි කර ගන්නේ ඇයි? රජයක් බිහිකර ගැනීමේ අරමුණු මොනවා ද? එම අරමුණු ඉටු කර ගැනීම සඳහා රජය මුදල් සපයා ගන්නේ කෙසේ ද? මේ ප්‍රශ්න සඳහා පිළිතුරු සෙවීමට අතීතයේ පටන් අද දක්වා ම ලෝකයේ දේශපාලඥයන්, ආර්ථික විද්‍යාඥයන් සහ විවිධ ජන කණ්ඩායම් සාකච්ඡා කර තිබෙනවා. අධික බදු බර නිසාත් නුසුදුසු බදු සහන නිසාත් රටක ආර්ථිකය කඩා වැටුණු උදාහරණ ලෝකයේ ඕනෑ තරම්.

ජීවිතය හා දේපළ පිළිබඳ සුරක්ෂාව තහවුරු කිරීම, නීතිය හා සාමය පවත්වා ගැනීම, ව්‍යාපාරයේ සංවර්ධනය වෙනුවෙන් මහාමාර්ග හා සන්නිවේදනය වැනි යටිතල පහසුකම් සැපයීම යනාදී කරුණු පිළිබඳ රජයකට වගකීමක් ඇති බව විශ්වාස කරනවානම් ඒ සඳහා වන පිරිවැය රජයක් සපයා ගන්නේ කුමනාකාරයෙන් ද?. රජය ආර්ථිකයේ ව්‍යාපාර අවස්ථා අත්පත් කරගෙන ලබන ලාභයෙන් ද?. එසේ නැතහොත් රජය ජනතාවගෙන් අය කරන බදු මුදලින් ද?. රජය ආර්ථිකයේ ව්‍යාපාර අවස්ථා හිමි කර ගනිමින් ලාභ ලැබීම අරමුණු කරන්නේනම් එයින් ඔබට ඇති ව්‍යාපාරික අවස්ථා අහිමි වනු ඇති. ඔබට ව්‍යාපාරික අවස්ථාවල අයිතිය ලබා දී ලාභ ලැබීමට රජය අවස්ථාව සපයන්නේනම් රජයකින් ඔබ බලාපොරොත්තුවන අරමුණු ඉටු කිරීමට ඔබෙන් බදු අය කිරීමට සිදු වනු ඇති. එසේත් නැතහොත් රජයට ණය ලබාගෙන ඔබ වෙනුවෙන් වියදම් කිරීමට සිදු වනු ඇති. එහෙත් අවසන් වශයෙන් එම ණය ගෙවිය යුතු වන්නේ ඔබ ම මිස අන් කවරෙක් ද?.

> 'බදු ශක්ති' වැඩසටහනෙන් ජනතාව ගෙවන බදු මුදල් රටේ සංවර්ධනයට යොදවන ආකාරයත් ඒවායින් ජනතාවට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳවත් දැනුවත් කෙරෙනු ඇති. බදු ශක්ති වැඩසටහනේ තේමාව වන්නේ 'ඔබේ බදු ඔබ වෙනුවෙන්' යන්න. ඒ අනුව සකස් කර කරන ලද ක්‍රියාකාරී සැලැස්ම දේශීය ආදායම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව හා සුරා බදු දෙපාර්තමේන්තුව එක් ව ක්‍රියාත්මක කෙරෙනවා.

මේ අනුව පෙනී යන්නේ රජයක් එම රාජ්‍යයේ පුරවැසියන්ගෙන් බදු අය කරන්නේ පුරවැසියන් රජයෙන් බලාපොරොත්තු වන අරමුණු ඉටු කිරීම සඳහා බව පෙනී යනවා. එසේනම් රජයක් බදු අය කරනවාට බොහෝ පිරිස් අකමැත්තක් දක්වන්නේ ඇයි? තමන් බදු වශයෙන් ගෙවන මුදල නැවත තමන්ට ම වෙනත් ආකාරයකින් ලැබෙනවානම් සහ එසේ ලැබෙන බව ජනතාවට පැහැදිලි ව පෙනෙනවානම් සාධාරණ බදු අය කිරීමකදී විරෝධයක් ඇති විය නොහැකියි. එසේ වුවත් බදු වශයෙන් ගෙවන මුදල් නැවත තමන් වෙත නොලැබෙනවානම්, රජය එම මුදල් තමන් වෙනුවෙන් වියදම් කළ අකාරය විනිවිද බවකින් යුතු ව නොකරවානම් එවැනි අවස්ථාවකදී බදු අය කිරීම පිළිබඳ විරෝධයක් දැක්වීම හෝ තමන් ගෙවිය යුතු බදු මුදල් නොගෙවා පැහැර හැරීම ස්වාභාවික තත්ත්වයක්. ශ්‍රී ලංකා ඉතිහාසයේ එවැනි බදු අක්‍රමිකතා සහ රාජ්‍ය වියදම් පිළිබඳ වූ සැඟවුණු ස්වභාවය හේතුවෙන් රාජ්‍ය බදු පිළිබඳ ශ්‍රී ලාංකියන්ට යම් ආකාරයක සෘණාත්මක ආකල්පයක් ඇති ව තිබෙන බව පෙනී යන කරුණක්.

මේ පිළිබඳ අවධානය යොමු කර වත්මන් රජය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙන්නේ රජයේ බදු ප්‍රතිපත්තිය සහ එහි විනිවිදභාවය පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීමට. ඒ, පවතින සෘණාත්මක ආකල්පය ධනාත්මක ආකල්පයක් බවට පරිවර්තනය කර, බදු පදනම පුළුල් කර ගනිමින් රාජ්‍ය අදායම ඉහළ මට්ටමකට ගෙන ඒමට. ඒ වෙනුවෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේ අභිනවයෙන් ස්ථාපිත කරන ලද ආදායම් පරිපාලන, ප්‍රතිසංස්කරණ හා නවීකරණ කාර්යාංශය, මුදල් අමාත්‍යාංශයේ ද සහයෝගය ඇති ව 'බදු ශක්ති' නමින් ජාතික බදු සතියක් ප්‍රකාශයට පත් කර තිබෙනවා.

මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී මූලික වන්නේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම් උත්පාදනයෙන් සියයට 90ක පමණ ආදායමක් උත්පාදනය කරදෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව හා සුරාබදු දෙපාර්තමේන්තුව.

'බදු ශක්ති' වැඩසටහනෙන් ජනතාව ගෙවන බදු මුදල් රටේ සංවර්ධනයට යොදවන ආකාරයත් ඒවායින් ජනතාවට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳවත් දැනුවත් කෙරෙනු ඇති. බදු ශක්ති වැඩසටහනේ තේමාව වන්නේ 'ඔබේ බදු ඔබ වෙනුවෙන්' යන්න. ඒ අනුව සකස් කර කරන ලද ක්‍රියාකාරි සැලැස්ම දේශීය ආදායම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව හා සුරා බදු දෙපාර්තමේන්තුව එක් ව ක්‍රියාත්මක කරනවා.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2025 වර්ෂය සඳහා රුපියල් බිලියන 2195ක ආදායම් ඉලක්කයක් සපුරා ගත යුතු ව තිබෙනවා. එය ඉතිහාසගත වන ආදායම් ඉලක්කයක් බවයි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් ආර්. පී. ජී. එච්. ප්‍රනාන්දු පවසන්නේ. ඒ අනුව බදු ශක්ති වැඩසටහන ක්‍රියාත්මක වන කාලයේ බදු අනුකූලතාව ඉහළ නංවා ගැනීමටත් ඒ යටතේ බදු ගෙවන්නන්ගේ ලියාපදිංචි වීම ඉහළ නංවා ගැනීමටත් බදු පදනම පුළුල් කර ගැනීමටත් විශේෂ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වනු ඇති. එහිදී පළමුවෙන් ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවත් එහි ප්‍රාදේශීය කාර්යාල 20ක් සමග ඒකාබද්ධ ව පූර්වයෙන් හඳුනාගත් ස්ථානවලදී බදු ගෙවන්නන්, බදු උපදේශකවරුන් හා රාජ්‍ය නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහනක් දිවයින ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමට නියමිත ව තිබෙනවා. එහිදී බදු වාර්තා සම්පූර්ණ කිරීම පිළිබඳ ව මහජනතාවට දැනුවත් වීමේ හැකියාව ලැබෙන අතර රටේ පවතින නීතිය අනුව බදු ගෙවිය යුතු වුවත් නොදැනුවත්භාවය නිසා බදු නොගෙවා සිටින පිරිස් දැනුවත් කිරීමත් දැනටමත් බදු ගෙවීම සිදු කළත් නිවැරදි බදු මුදල නොගෙවන පිරිස් දැනුවත් කිරීමත් සිදු කෙරෙන බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පවසනවා.

මෙය 2025 ජුනි මස 03 දින ක්‍රියාත්මක වනු ඇති. ජුනි 04 දින වීථි සංචාරය කරමින් බදු ගෙවන්නන් අභියසට ගොස් ඔවුන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙළක් තිබෙනවා. එයට අමතර ව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු සම්බන්ධ කාර්ය ප්‍රධාන කාර්යාලයේ එක ම ස්ථානයකින් ඉටු කර ගැනීමට අවශ්‍ය පහසුකම් සලසා ඇති අතර ප්‍රාදේශීය කාර්යාලවල ද එම පහසුකම් ඉදිරියේදී ක්‍රියාත්මක වනු ඇති. 'බදු ශක්ති' වැඩසටහන ආරම්භ වන දින සිට ඉදිරියට මේ පහසුකම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අඛණ්ඩ ව ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සලසන බවයි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අවධාරණය.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව 'බදු ශක්ති' වැඩසටහනට සමගාමී ව ඔවුන්ගේ මූලික අරමුණු ද්විත්වයක් ඉටු කර ගැනීමට අපේක්ෂා කරනවා. එහි අධ්‍යක්ෂ ජනරාල් පී. බී. එන්. සී. නෝනිස් පවසන්නේ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ අරමුණු අතර ආදායම් රැස් කිරීම මෙන් ම වෙළෙඳාම සඳහා පහසුකම් සැපයීම ප්‍රධාන වන බවත් එම අරමුණු සාක්ෂාත් කර ගැනීම මේ වැඩසටහනෙන් අපේක්ෂා කරන බවත්. ඒ අනුව ජුනි මස 02 දින සිට 08 දින දක්වා ක්‍රියාත්මක බදු ශක්ති වැඩසටහන එම අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් ක්‍රියාත්මක වනු ඇති. ශ්‍රී ලංකා රේගුව 2024 වර්ෂයේ අපේක්ෂිත ආදායම් ඉලක්කය වන රුපියල් බිලියන 1533ක ඉලක්කය ද අභිභවමින් රුපියල් බිලියන 1535ක ආදායමක් රජයට උපයා දුන් බව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා පවසන්නේ 2025 වර්ෂය සඳහා ද රුපියල් බිලියන 2115ක ඉලක්කයක් පවතින බව පෙන්වා දෙමින්.

රේගු බදු පැහැර හරින්නන් සහ රේගුවේ බදු අය කිරීම හා වෙළෙඳ පහසුකම් සැපයීමට සම්බන්ධ වෙනත් රාජ්‍ය ආයතන මේ බදු සතියේදී දැනුවත් කෙරෙන අතර රේගු බදු පැහැර හරින්නන් හඳුනා ගැනීම සඳහා ජනතා සහය ලබා ගැනීමට ජනතාව දැනුවත් කිරීමටත් මෙහිදී පියවර ගැනෙනු ඇති. රේගුවේ විශේෂ විමර්ශන අංශයට තොරතුරු දෙන්නන්ට ලබාදෙන ප්‍රසාද දීමනා පිළිබඳවත් මෙහිදී දැනුවත් කිරීමට නියමිත ව තිබෙනවා.

ශ්‍රී ලංකා රේගුව බදු සතියට සමගාමී ව ක්‍රියාත්මක කරනු ඇත්තේ පස්වැදෑරුම් වැඩපිළිවෙළක්. ජාත්‍යන්තර වෙළෙඳාම පහසු කිරීම සඳහා ආනයන හා අපනයනකරුවන්ට ඔවුන්ගේ කාර්ය පහසු කිරීම සඳහා ඩිජටල් තාක්ෂණය භාවිත කිරීමට අවස්ථාව සලසා තිබෙනවා. එයින්

රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීමේදී සහ අය වැය හිඟය අවම කර ගැනීමට දරන උත්සාහයේදී රජය සතු ව පවතින ප්‍රධාන අභියෝගය වන්නේ නීත්‍යානුකූල බදු සීමා අනුව බදු නොගෙවා සිටින පිරිස් බහුල වීම (බදු පදනම පටු පරාසයක විහිදී තිබීම), බදු ගෙවමින් සිටින පිරිස් නිවැරදි බදු ප්‍රමාණය නොගෙවීමේ ගැටලුව, බදු ගෙවීම් පැහැර හැරීම සහ බදු ප්‍රතිපත්තියේ විනිවිද ස්වභාවය යනාදී ගැටලු. සිදු වූවා යැයි සැලකෙන දූෂණ හා අක්‍රමිකතා හේතුවෙන් බදු ගෙවීම පිළිබඳ ජනතාවට ඇත්තේ සෘණාත්මක ආකල්පයක්. මේ නිසා 'ඔබේ බදු මුදල් ඔබ වෙනුවෙන්මයි' යන තේමා පාඨය අනුව යමින් බදු අය කිරීම සහ බදු මුදල් වියදම් කිරීම පිළිබඳ ව පූර්ණ විනිවිදභාවයකින් ක්‍රියා කිරීමේ රජයේ කැපවීම ජනතාවට පෙන්වා දෙමින් සාධාරණත්වයේ මූලධර්මය පදනම් ව බදු අය කිරීම කාලෝචිත ක්‍රියාවක්.

ආනයනකරුවන්ට ඉතා ඉක්මනින් භාණ්ඩ නිෂ්කාසනය කිරීමට හැකියාව ලැබෙන අතර ඔවුන්ගේ භාණ්ඩ නිෂ්කාසනය කිරීම කුමන පියවරක තිබෙනවාද? යන්න නිවසේ සිට ම පරීක්ෂා කර ගැනීමේ පහසුකම ලැබීමත් මෙහි විශේෂත්වයක්. මේ සඳහා මෘදුකාංග කිහිපයක් ද රේගු දෙපාර්තමේන්තුව හඳුන්වා දීමට නියමිත ව තිබෙනවා.

සුරාබදු දෙපාර්තමේන්තුවේ අතිරේක කොමසාරිස් ජනරාල් රෝහණ සේනාරත්න පවසන ආකාරයට සුරා බදු ආඥා පනත හා දුම්කොළ උප බදු පනත කාර්යක්ෂම ව ක්‍රියාත්මක කිරීමෙන් ඵලදායී බදු ආදායමක් ලබා ගැනීමයි සුරාබදු දෙපාර්තමේන්තුවේ අරමුණ. විශේෂයෙන් ජාතික දුම්කොළ හා මද්‍යසාර අධිකාරියේ ජාතික පනත අනුව බදු අය කර ගන්නා නිෂ්පාදන පිළිබඳ ව ප්‍රචාරණය කළ නොහැකියි. බදු සතියට සමගාමී ව නීති විරෝධි මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් නීතිය බලාත්මක කිරීම සහ එමගින් නීති විරෝධි මත්ද්‍රව්‍ය පාලනය කිරීමෙන් ආදායම් වර්ධනය කර ගැනීමට බලාපොරොත්තු වන බව ඔහු පෙන්වා දෙනවා. බීඩි නිෂ්පාදනය හා සම්බන්ධ බදු රැස් කිරීම සහ බීඩි නිෂ්පාදකයන් ලියාපදිංචි කිරීම, නීති විරෝධී අමුද්‍රව්‍ය පාලනය සඳහා වැටලීම් වැනි ක්‍රියාමාර්ග බදු ශක්ති වැඩසටහනට සමගාමී ව දිවයින ම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීමටයි නියමිත. මේ සඳහා 1913 දුරකතන අංකය මාර්ගයෙන් ජනතාවගෙන් නීති විරෝධි මත්ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු ලබා ගැනීම ප්‍රවර්ධනය හා පාසල් ළමයින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටත් සැලසුම් කර තිබෙනවා. සුරා බදු දෙපාර්තමේන්තුවේ මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් රොෂාන් පෙරේරා පවසන්නේ ජනතාවට ප්‍රමිතිගත මත්පැන් පරිභෝජනය තහවුරු කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් ද ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බව. සුරා බදු දෙපාර්තමේන්තුවේ බදු රැස් කිරීම සහ එහි අරමුණු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා රේගුවේ බදු අය කිරීමේ ප්‍රතිපත්තියෙන් සහ අරමුණුවලින් වෙනස් වූවක්. සුරා බදු දෙපාර්තමේන්තුවේ බදු අය කිරීම නිෂ්පාදනය අධෛර්යමත් කිරීමෙන් ආදායම් උත්පාදනය කිරීම. නිෂ්පාදනය වන අවස්ථාවේ ම බදු අය කිරීමේ හැකියාව සුරා බදු දෙපාර්තමේන්තුවට පවතිනවා.

**නීත්‍යානුකූල ව තමන්ට නියම වූ බද්ධ රජයට ගෙවීම ජනතාව සතු යුතුකමක් සහ වගකීමක් වනවා මෙන් ම බදු ගෙවිය යුතු යම් පුද්ගලයකු බදු ගෙවීම පැහැර හරිනවානම් ඒ පිළිබඳ ව අදාළ රාජ්‍ය ආයතනවලට දැනුම් දීම බදු ගෙවන සෑම පුද්ගලයකුගේ ම යුතුකමක් නොව එය එම පුද්ගලයා සතු අයිතිවාසිකමක් ද වෙනවා. මක්නිසාද යත් බදු නොගෙවන පුද්ගලයන් ද නොමිල රාජ්‍ය සේවා ලබාගන්නේ බදු ගෙවන පුද්ගලයා දැරූ වියදම නිසා.**

පසුගිය කාලයේ ලෝකයේ දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පහළ ම බදු ආදායමක් ලබන රටක් වශයෙනුයි ශ්‍රී ලංකාව සැලකුණේ. ඇතැම් අවස්ථාවලදී එය දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 8 දක්වා පහළ ගොස් තිබුණා. ආර්ථික අර්බුදත් සමග රාජ්‍ය ආදායම ඉහළ නංවා ගත යුතු බව බොහෝ විද්වතුන්ගේ අදහස වුණා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි අතර ප්‍රධානතම කොන්දේසියක් වූයේ ද රාජ්‍ය ආදායම ක්‍රමයෙන් ඉහළ මට්ටමක පවත්වා ගැනීමට රජය ක්‍රියා කළ යුතු බව. ඒ අතර ම රාජ්‍ය අය වැය හිඟය අවම කිරීමේ අභියෝගය ද පවතිනවා. ශ්‍රී ලංකාව වැනි රටක රාජ්‍ය වියදම් කප්පාදු කිරීම පහසු කාර්යයක් වන්නේ නැහැ. බොහෝ රාජ්‍ය වියදම් පවත්වාගෙන යන්නේ අත්‍යාවශ්‍ය කාර්ය සඳහා. රජයේ ණය බර ද විශාල අගයක් ගන්නවා. රාජ්‍ය අංශයේ දූෂණ හා බදු මුදල් අවභාවිතය පිළිබඳ ව ද පසුගිය කාලයේ සමාජයේ බොහෝ සෙයින් කතාබහට ලක් වූ මාතෘකාවක් වුණා. රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීමේදී සහ අය වැය හිඟය අවම කර ගැනීමට දරන උත්සාහයේදී රජය සතු ව පවතින ප්‍රධාන අභියෝගය වන්නේ නීත්‍යානුකූල බදු සීමා අනුව බදු නොගෙවා සිටින පිරිස් බහුල වීම (බදු පදනම පටු පරාසයක විහිදී තිබීම), බදු ගෙවමින් සිටින පිරිස් නිවැරදි බදු ප්‍රමාණය නොගෙවීමේ ගැටලුව, බදු ගෙවීම් පැහැර හැරීම සහ බදු ප්‍රතිපත්තියේ විනිවිද ස්වභාවය යනාදී ගැටලු. සිදු වූවා යැයි සැලකෙන දූෂණ හා අක්‍රමිකතා හේතුවෙන් බදු ගෙවීම පිළිබඳ ජනතාවට ඇත්තේ ඍණාත්මක ආකල්පයක්. මේ නිසා 'ඔබේ බදු මුදල් ඔබ වෙනුවෙන්මයි' යන තේමා පාඨය අනුව යමින් බදු අය කිරීම සහ බදු මුදල් වියදම් කිරීම පිළිබඳ ව පූර්ණ විනිවිදභාවයකින් ක්‍රියා කිරීමේ රජයේ කැපවීම ජනතාවට පෙන්වා දෙමින් සාධාරණත්වයේ මූලධර්මය පදනම් ව බදු අය කිරීම කාලෝචිත ක්‍රියාවක්.

නීත්‍යානුකූල ව තමන්ට නියම වූ බද්ධ රජයට ගෙවීම ජනතාව සතු යුතුකමක් සහ වගකීමක් වනවා මෙන් ම බදු ගෙවිය යුතු යම් පුද්ගලයකු බදු ගෙවීම පැහැර හරිනවානම් ඒ පිළිබඳ ව අදාළ රාජ්‍ය ආයතනවලට දැනුම් දීම බදු ගෙවන සෑම පුද්ගලයකුගේ ම යුතුකමක් නොව එය එම පුද්ගලයා සතු අයිතිවාසිකමක් ද වෙනවා. මක්නිසාද යත් බදු නොගෙවන පුද්ගලයන් ද නොමිල රාජ්‍ය සේවා ලබාගන්නේ බදු ගෙවන පුද්ගලයා දැරූ වියදම නිසා.

# ප්‍රාදේශීය ආණ්ඩුකරණය

**කාංචනා සිරිවර්ධන**

පළාත් පාලන මැතිවරණය පසුගිය දිනවල බොහෝ සෙයින් කතාබහට ලක්වූ මාතෘකාවක්. 2025 මැයි 06 දින මහ නගර සභා 28ක්, නගර සභා 36ක්, ප්‍රාදේශීය සභා 275ක් සඳහා නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, සභාපති, නියෝජ්‍ය සභාපති ඇතුළු සභිකයන් තෝරා පත් කර ගැනීමට මෙරට 17 වැනි පළාත් පාලන මැතිවරණය පැවැත්වුණා. පළාත් පාලන මැතිවරණයක් පැවැත්විය යුත්තේ ඇයි? කුමක්ද එහි වැදගත්කම? මේ, ඒ සම්බන්ධයෙන් පැවැත් වූ විද්වත් කතාබහක්.



ආචාර්ය
**ප්‍රියන්ත මුදලිගේ**
අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරී
පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය

**ප්‍රශ්නය; පළාත් පාලන මැතිවරණයක් පැවැත්වීමේ වැදගත්කම සහ අවශ්‍යතාව පැහැදිලි කළොත් ?**

**පිළිතුර;** ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණයක් වන්නේ කලින් කලට මැතිවරණ පැවැත්වීම. මැතිවරණ යනු රටක ප්‍රජාතන්ත්‍රවාදය මැන බලන දර්ශකයක්. සර්වජන ඡන්ද බලය සහිත රාජ්‍යයක් වන ශ්‍රී ලංකාවේ ජාතික මට්ටම, උප ජාතික මට්ටම, ප්‍රාදේශීය මට්ටම ලෙස ප්‍රධාන වශයෙන් දේශපාලන ස්ථර තුනක් දක්නට ලැබෙනවා. ජාතික මට්ටමේදී පාර්ලිමේන්තුව, උප ජාතික මට්ටමේදී පළාත් සභා නවය, ප්‍රාදේශීය මට්ටමේදී මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා හමුවනවා. ප්‍රාදේශීය ආණ්ඩු ලෙසත් මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා හඳුන්වනවා. පළාත් පාලන ආයතන හෙවත් ප්‍රාදේශීය ආණ්ඩු මැතිවරණයයි පසුගිය කාලයේ පැවැත්වුණේ. පුද්ගලයන්ගේ උපතේ සිට මරණය දක්වා ගනුදෙනු කරන මේ ප්‍රාදේශීය ආණ්ඩු ලෝකයේ සෑම ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක තිබෙනවා. මැතිවරණයක් පවත්වා මහජන නියෝජිතයන් තෝරාගෙන, ජනතාව සමග පාලනය ගෙන යෑම ගැටුම් අවම කරන්නත් පාලන කටයුතු කාර්යක්ෂම ව පැහැදිලි ව විධිමත් ව පවත්වාගෙන යන්නත් හේතුවනවා.

**ප්‍රශ්නය; අනෙකුත් මැතිවරණවලින් පළාත් පාලන මැතිවරණයක් වෙනස් වන්නේ කෙසේද?**

**පිළිතුර;** ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා මැතිවරණය යන මැතිවරණවලට වඩා පළාත් පාලන මැතිවරණය වෙනස්. ඒ, පළාත් පාලන මැතිවරණයෙන් රටේ පුංචි ආණ්ඩු ගොඩක් නිර්මාණය වන නිසා. මේ පුංචි ආණ්ඩුවලින් බිහි වන්නේ ගමේ ප්‍රශ්න හඳුනන, ගමේ ජනතාව සමග ජීවත් වන, ගමේ සම්පත් ගමේ භාවිතයට යොමු කරන්නට පුළුවන් පාලක සහ පාලිත පිරිසක්. පළාත් පාලන මැතිවරණයකින් රටේ ආණ්ඩු වෙනස් වීමක් සිදු වන්නේ නැහැ. ගමේ පාලනය විධිමත්කරණයට පිරිසක් තෝරා ගැනීමයි සිදු වන්නේ. මේ පිරිසට (මහජන නියෝජිතයන්ට) වගකීම බාර දුන් පසු මහජනතාවටත් සෘජු ව ම සම්බන්ධ වී පාලන කටයුතු කරගෙන යන්න අවස්ථාවක් ලැබෙනවා. එය අනෙක් මැතිවරණවලට වඩා මේ මැතිවරණය සුවිශේෂ වීමට හේතුවක්.

**ප්‍රශ්නය; පැවැති පළාත් පාලන මැතිවරණයේදී ජනතාව ලබා දුන් තීන්දුව ගැන ඔබේ අදහස ?**

**පිළිතුර;** ජනතාවට අවශ්‍ය වන්නේ තම ප්‍රදේශයේ සංවර්ධනය, ගැටලු කළමනාකරණය සහ ඒ වෙනුවෙන් අදහස් ඉදිරිපත් කිරීම, එවැනි ගැටලු මහජන නියෝජිතයන්ට දන්වා ඊට විසඳුම් ලබා ගැනීම ආදිය. මේ නිසා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ ජනතාව දුන් මතයට අප ගරු කළ යුතුයි. එය ආරක්ෂා කළ යුතුයි. ජනතාව දුන් අවස්ථාව, අවස්ථාවක් කරගෙන ගමේ ප්‍රශ්න විසඳීමයි මෙහිදී වැදගත් වන්නේ. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය තුළ වාද විවාද කර, ප්‍රතිපත්ති පිළිබඳ අදහස් උදහස් ගැටී, එයින් යම් වැදගත් අදහසක් මතු කරගෙන ඒ අනුව ක්‍රියා කිරීමයි කළ යුත්තේ.

**ප්‍රශ්නය; ලැබුණු ජනතා තීන්දුවත් සමග රටේ ප්‍රාදේශීය සංවර්ධනයේ ඉදිරි ගමන කුමනාකාර වෙයි ද?**

**පිළිතුර;** ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු සහ පළාත් සභා මැතිවරණ යන මැතිවරණ තුනේ ප්‍රතිඵල දෙස බලන විට පෙනී යන්නේ දීර්ඝ කාලයක් පැවති තමන්ගේ දේශපාලන මතය රැඩිකල් ලෙස වෙනස් කර ඇති බව. පැවති ක්‍රමවේදවල අඩුපාඩු ඊට බලපා තිබෙනවා. දැන් ජනතාව බලාපොරොත්තු වන්නේ අලුත් ක්‍රමයක්. ඒ සඳහායි මහජන නියෝජිතයන්ට බලය ලබා දී තිබෙන්නේ. ඔවුන්ගේ වගකීම ජනතා අපේක්ෂා ඉටු කිරීම. ඊට අවශ්‍ය පරිසරය තිබිය යුතුයි. දැන් නිලධාරින්ටත් නිදහස දී තිබෙනවා තීරණ ගන්න සහ තීරණ ක්‍රියාත්මක කරන්න. මහජන නියෝජිතයන්ටත් මැතිවරණයකින් බලය දී තිබෙනවා තමන්ගේ කාර්යභාරය ඉටු කරන්න.

මෙලෙස ප්‍රාදේශීය මට්ටමේ ගැටලු ප්‍රාදේශීය මට්ටමේදී ම නිරාකරණය කර ගැනීමට අවස්ථාව දීමෙන් අපට පෙනෙනවා ප්‍රාදේශීය සංවර්ධනයට අවශ්‍ය පදනමක් නිර්මාණය වී ඇති බව. වෙනදා මෙන් නොව අද වන විට

මහජන විගණනය ඉදිරියට පැමිණ තිබෙනවා. ගමේ නියෝජිතයන්ට මහජනතාවගේ සමාජ විගණනයෙන් පැන යන්නට බැහැ. හොරකමට, පොරොන්දු කඩකිරීමට ඉඩක් නැහැ. විශේෂයෙන් මාධ්‍ය, සමාජ මාධ්‍ය ඔස්සේ එල්ල වන පීඩනය හමුවේ ප්‍රදේශයේ දියුණුව වෙනුවෙන් මහජන නියෝජිතයන්ට හා නිලධාරින්ට වැඩ කරන්නට සිදු වනවා. මෙතෙක්කල් ජනතාවගෙන් ඈත් ව පැවති ප්‍රාදේශීය ආණ්ඩු ජනතාවට සමීප කිරීමේ සංස්කෘතියක් නිර්මාණය වූ බවක් පැවැති මැතිවරණ ප්‍රතිඵලවලින් පෙනෙනවා. දේශපාලන පක්ෂ, නිලධාරින් සහ ජනතාව දැන් යම් සම්මුතියක සිටින බවත් පෙනෙනවා. මේ සෑම පාර්ශ්වයක ම වගකීමක් වනවා ප්‍රාදේශීය සංවර්ධනය වෙනුවෙන් කැපවීමට.

ප්‍රශ්නය; පළාත් පාලන මැතිවරණයකදී තේරී පත්වන නියෝජිතයන් ඔවුන්ගේ කාර්යය වඩා හොඳින් ඉටු කිරීම සඳහා බලගන්වන්නේ කෙසේ ද?

පිළිතුර; ප්‍රාදේශීය ආණ්ඩුවලට තෝරාපත් කරගෙන ඇති නියෝජිතයන් ගණන ආසන්න වශයෙන් 8500ක් පමණ වනවා. මෙයින් වැඩි පිරිසක් දේශපාලනයට නවකයන්. පළාත් පාලන ආයතන යනු මහ ආණ්ඩුවට සමාන වන පුංචි ආණ්ඩු විශේෂයක්. මේවා අවතක්සේරු කරන්නට බැහැ. තීරණ ගැනීම, තීරණ ක්‍රියාත්මක කිරීම, ඒවා නියාමනය, පවතින නීතිය යටතේ ක්‍රියා කිරීම පුංචි ආණ්ඩුවලට පැවරෙන කාර්ය. නිදසුන් ලෙස ප්‍රසම්පාදනය, විගණන කටයුතු, සභාවේ කටයුතු, සමාජ සුභ සාධනය, අණපනත්වලින් දුන් බලතල ක්‍රියාත්මක කිරීම පෙන්වා දෙන්නට පුළුවන්. ප්‍රාදේශීය ආණ්ඩු ජනතාව වෙනුවෙන් පැය 24 ම අවදියෙන් සිටිය යුතුයි.

ප්‍රාදේශීය ආණ්ඩුවලට පත් වූ නවක මහජන නියෝජිතයන්ට මුදල්, පළාත් පාලන ආයතන සහ ජනවරම ලැබී තිබෙනවා. මෙහි කාර්ය කළමනාකරණය කරන්නටනම් ඔවුන් බලගැන්විය යුතුයි. පවතින නීති රීති, මහජන අවශ්‍යතා, මධ්‍යම ආණ්ඩුවේ ප්‍රතිපත්ති හා පරිසරය පිළිබඳ දැනුමෙන් සන්නද්ධ කිරීමත් පුහුණුව සහ මග පෙන්වීම ලබා දීමත් කළ යුත්තක්. මධ්‍යම ආණ්ඩුවට පළාත් පාලන ආයතනවලින් වෙන් ව හෝ පළාත් පාලන ආයතනවලට මධ්‍යම ආණ්ඩුවෙන් වෙන් ව හෝ කටයුතු කරන්නට බැහැ. මේ සහසම්බන්ධතාව තුළ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන් දැනුමෙන් බල ගැන්විය යුතුයි. පරිසර සැලසුම්කරණය, ඩිජිටල්කරණය වැනි ජනතාවට කඩිනම් සේවයක් ලබාදීමට අවශ්‍ය කරන යාන්ත්‍රණ පිළිබඳ කුසලතා වැඩිදියුණු කිරීම, ඒ සඳහා අවශ්‍ය විශේෂඥ සහය ලබා දීම, කුසලතා වර්ධනය, ආකල්පමය වෙනසක් ඇති කිරීම මෙහිදී වැදගත්. තමන්ගේ ප්‍රදේශයේ පාරක් අබලන් වී ඇත්නම්, වසංගත තත්ත්වයක් පවතීනම්, ජලය අපවිත්‍ර වී ඇත්නම්, ප්‍රදේශයේ සම්පත් සංවර්ධන කටයුත්තකට අදාළ සම්බන්ධීකරණයක් සිදු කරන්න අවශ්‍යනම් ඊට පක්ෂ, විපක්ෂ භේද නොසලකා මැදිහත් විය හැකි තරමට ආකල්ප දියුණු කර ගත යුතුයි. සාම්ප්‍රදායික මතවාදවල සිර වී එය කළ නොහැකියි. ජාති, ආගම්, කුල, පක්ෂ, පාට භේද නොතකා ප්‍රදේශයේ සියලු පුරවැසියන්ට තමන්ගේ සේවය ලබා දීම මහජන නියෝජිතයන්ගේ වගකීමක්. එය කළ යුත්තේ පවතින සංස්කෘතියට, සම්ප්‍රදායට, සාරධර්මවලට, ඇතැම් ප්‍රජා සංවිධානවල අදහස්වලට, නීති රීතිවලට ගරු කරමින්.

**ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු සහ පළාත් සභා මැතිවරණ යන මැතිවරණ තුනේ ප්‍රතිඵල දෙස බලන විට පෙනී යන්නේ දීර්ඝ කාලයක් පැවති තමන්ගේ දේශපාලන මතය රැඩිකල් ලෙස වෙනස් කර ඇති බව. පැවති ක්‍රමවේදවල අඩුපාඩු ඊට බලපා තිබෙනවා. දැන් ජනතාව බලාපොරොත්තු වන්නේ අලුත් ක්‍රමයක්. ඒ සඳහායි මහජන නියෝජිතයන්ට බලය ලබා දී තිබෙන්නේ. ඔවුන්ගේ වගකීම ජනතා අපේක්ෂා ඉටු කිරීම. ඊට අවශ්‍ය පරිසරය තිබිය යුතුයි. දැන් නිලධාරින්ටත් නිදහස දී තිබෙනවා තීරණ ගන්න සහ තීරණ ක්‍රියාත්මක කරන්න. මහජන නියෝජිතයන්ටත් මැතිවරණයකින් බලය දී තිබෙනවා තමන්ගේ කාර්යභාරය ඉටු කරන්න.**

මෙතෙක් සිදු වී තිබෙන්නේ පුංචි ආණ්ඩුවල වැදගත්කම වුවමනාවෙන් අමතක කර දැමීම, වටිනාකම නොදැන සිටීම හෝ ඊට ප්‍රමුඛත්වයක් නොදීම. එහෙත් අද වන විට පුංචි ආණ්ඩුවල වැදගත්කම වෙන කවරදාටත් වඩා ඉස්මතු වී තිබෙනවා. රටේ සංවර්ධනය වෙනුවෙන් මහජන නියෝජිතයන් නිසි අයුරින් බල ගැන්වුවහොත් ඔවුන් ඊට යොමු කරන්න පුළුවන්. මෙහිදී මධ්‍යම ආණ්ඩුවටත් පළාත් පාලන ආයතනවලටත් මේ සම්බන්ධයෙන් ප්‍රතිපත්ති තීන්දු ගන්නා පාර්ශ්වවලටත් පැවරී තිබෙන්නේ විශාල කාර්යභාරයක්.

ප්‍රාදේශීය ආණ්ඩු පවත්වාගෙන යෑමේදී පනතෙන් ලබා දී ඇති කාරණාවලට අමතර ව අනුනීති හෙවත් අතුරු ව්‍යවස්ථා සකසා ගන්නත් පළාත් පාලන ආයතනවලට අවසර තිබෙනවා. මේ අනුනීති සකස් කිරීමෙන් පසු අවසාන වශයෙන් පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාගත යුතුයි. මේ පිළිබඳ පළාත් පාලන නියෝජිතයන් දැනුවත් කරනවානම් ප්‍රාදේශීය මට්ටමේ බොහෝ ගැටලු නිරාකරණය කර ගන්න පුළුවන්. ඒ, දැනට පවතින ඇතැම් නීති යල් පැන ගොස් ඇති නිසා.

පසුගිය කාලයේ වරිපනම් ගෙවන්නත් ප්‍රාදේශීය සභාවේ පැය ගණනක් පෝලිමේ සිටින්නට වුණා. එසේ නොවීමට ක්‍රමවේද සකස් කළ යුතුයි. පළාත් පාලන ආයතන සහ මහජනතාව අතර තියෙන දුරස්ථ සම්බන්ධතාව, සමීප සම්බන්ධතාවක් බවට පත් කළ යුතුයි. ජපානය වැනි රටක පවා අතිනාගරික මට්ටමේදීත් මහජනතාවයි පළාත් පාලන ආයතනයි අතර සැකසී තිබෙන්නේ සමීප සම්බන්ධතාවක්. ශ්‍රී ලංකාවේත් පළාත් පාලන ආයතන ආරක්ෂා කිරීම සහ බලගැන්වීම ඔස්සේ ජනතාවට වඩාත් යහපත්, සමීපස්ථ සේවාවක් ලබා ගන්නට හැකි වනු ඇති.

# ජවිපෙට 60

**වසන්ත දිසානායක**

අද ආණ්ඩු බලයේ සුක්කානම මෙහෙයවන්නා බවට පත් ව සිටින ජවිපෙ 2025 මැයි 14 දින විහාර මහාදේවී උද්‍යානයේදී එහි 60 වැනි සංවත්සරය උත්කර්ෂයෙන් සැමරුවා. ජවිපෙට අනුව එහි සමාරම්භය සනිටුහන් වූයේ වසර 60කට පෙර 1965 මැයි මාසයේ 14 දින. එදින අක්මීමන ඩබ්ලිව්. ටී. කරුණාරත්න හෙවත් ඉන්කම්ටැක්ස්කරුගේ නිවසේදී පැවති සාකච්ඡාවකදී. එම සාකච්ඡාවට සහභාගි වී ඇත්තේ විජේවීර, විජේසේන විතාරණ හෙවත් සනත්, කඩවත මිල්ටන්, විල්සන් දැදිගම, ඩබ්ලිව්.ටී. කරුණාරත්න, දෙල්ගොඩ රාජා හා සිරිපාල අබේගුණවර්ධන යන හත්දෙනා. ඔහු හැරුණු විට සාකච්ඡාවට සහභාගි වූ අනෙක් අය මාක්ස් ලෙනින්වාදී දැනුම අතින් ඉතා අඩු මට්ටමක සිටි, දේශපාලනික ව, ප්‍රතිසංස්කරණවාදී පැරණි සංවිධාන ක්‍රමවලට ඇබ්බැහි වූ පැරණි වාමාංශික ව්‍යාපාරයේ පරාභවගතවී මැරී යන අංග ලක්ෂණ උරුම කර ගත් අය. (බලන්න, "අත්දැකීම් කිහිපයක්" - රෝහණ විජේවීර)

මේ වන විට මොස්කව්හි ලුමුම්බා මිත්‍රත්ව විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය හදාරමින් සිටි විජේවීරට සෝවියට් හා චීන කොමියුනිස්ට් පක්ෂ අතර පැවති උග්‍ර මතවාදී අරගලයේ උණුසුම තදින් ම දැනී තිබූ අතර ඔහු සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ ස්ථාවරයෙන් කැඩී වෙන් වී චීන කොමියුනිස්ට් පක්ෂයේ ස්ථාවරය සමග එක් වුණා. ලුමුම්බා සරසවියේ චීන කොමියුනිස්ට් පක්ෂයේ සථාවරය ගත් සිසුන් පිරිසක් අතර කැපී පෙනෙන චරිත කිහිපයක් වූයේ විජේවීර, ඉන්දුනීසියානු කොමියුනිස්ට් පක්ෂයේ නායක ඩී.එන්. අයිදිත්ගේ බාල සෙහොයුරු මොරාඩ් අයිදිත් හා සැන්සිබාරයේ ෂීක් අබ්දුල්ලා කාසිම් හංගා වැනි කිහිපදෙනෙක්. විජේවීර මොවුන් අතර වඩාත් ම කැපී පෙනෙන චරිතය වී තිබෙනවා.

නිවාඩුවක් සඳහා ලංකාවට පැමිණ සිටි විජේවීරට අධ්‍යාපනය සඳහා පෙරළා මොස්කව් යාමට සෝවියට් තානාපති කාර්යාලයෙන් වීසා නොලැබීම විජේවීරගේ ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යයක්. එය මෙරට දේශපාලනයේ විපර්යාසකාරී හැරවුමකට ද මග පෑදූ බව කිව හැකියි. මේ වන විට ඔහු විප්ලවවාදී මතවාදියකු බවට පත් ව සිටියා. මෙවැනි පසුබිමක ඔහු ලංකා කොමියුනිස්ට් පක්ෂයේ සෝවියට් පිලෙන් වෙන් ව ලංකා කොමියුනිස්ට් පක්ෂයේ චීන පිල සමග එක් ව වැඩ කරන්නට වුණා. එම පක්ෂයේ මතවාද ඔහුගේ මතවාද සමග ගැළපුණු අතර ආරම්භයේදී ඔහුට එම පක්ෂය සමග කිසිදු මත ගැටුමක් තිබුණේ නැහැ. උද්‍යෝගිමත් හා උන්තිකාමී තරුණයකු වූ ඔහුට එම පක්ෂයට එක් වූ ගමන් ම ලැබුණේ පක්ෂයේ තරුණ සමිති සම්මේලනයේ උප ලේකම් ධුරය. එවකට එම පක්ෂයේ ප්‍රබල නායකයකු වූ ප්‍රේමලාල් කුමාරසිරිගේ සමීප සබඳතාව ද ඊට බලපාන්නට ඇති. ටික කලකදී ෂන් ප්‍රමුඛ පක්ෂ නායකත්වය කතාවෙන් මිස භාවිතයෙන් විප්ලවවාදී වූයේ නැති බවට වූ ඔහුගේ වටහා ගැනීම පක්ෂයේ වෙනස් මගක් ගැනීමට ඔහු ව පොළඹවා තිබෙනවා. ඔහුට අනුව ඒ පෙළඹවීම ඔහු ව මෙහෙයවා තිබෙන්නේ ලංකා කොමියුනිස්ට් පක්ෂය (චීන පිල) විප්ලවීය පක්ෂයක් බවට පරිවර්තනය කිරීම කරා. ඒ සඳහා



පළමු ව පක්ෂ නායකත්වය එනම් ෂන්ගේ නායකත්වය වෙනස් කළ යුතු බව ඔහුගේ අදහස වී තිබුණා. එහෙත් පක්ෂය තුළ ෂන්ගේ නායකත්වය තහවුරුව පැවති නිසා එය කළ හැක්කක් වූයේ නැහැ.

පක්ෂයේ නායකත්වය ෂන් වෙතින් අත්පත් කරගෙන එම පක්ෂය 'විප්ලවීය' පක්ෂයක් බවට පරිවර්තනය කිරීම විජේවීරගේ ප්‍රමුඛ අරමුණ බවට පත් ව තිබිණා. ඔහුගේ අදහස වූයේ මේ අරමුණ ඉටු කර ගත හැකි වන්නේ පක්ෂය තුළ ම රහසිගත ව වැඩ කරමින් තමන්ගේ ම කණ්ඩායමක් ගොඩ නගා

ලුමුම්බා සරසවියේ චීන කොමියුනිස්ට් පක්ෂයේ ස්ථාවරය ගත් සිසුන් පිරිසක් අතර කැපී පෙනෙන චරිත කිහිපයක් වූයේ විජේවීර, ඉන්දුනීසියානු කොමියුනිස්ට් පක්ෂයේ නායක ඩී.එන්. අයිදිත්ගේ බාල සහෝයුරු මොරාඩ් අයිදිත් හා සැන්සිබාරයේ ශීක් අබ්දුල්ලා කාසිම් හංගා වැනි කිහිපදෙනෙක්. විජේවීර මොවුන් අතර වඩාත් ම කැපී පෙනෙන චරිතය වී තිබෙනවා.

ගැනීමෙන් බව. අක්මීමන සාකච්ඡාවේදී සැබවින් ම සිදු වූයේ පක්ෂයේ බලය අල්ලා ගැනීම සඳහා වූ කණ්ඩායමක් ගොඩ නැගීම සඳහා මුල පිරීමක් මිස නව විප්ලවීය පක්ෂයක් ගොඩ නැගීමට මුල පිරීමක් නොවෙයි.

අක්මීමන මේ සාකච්ඡාව වන විට නව මතවාදයක් හා ක්‍රියාමාර්ගයක් පිළිබඳ නිරවුල් අදහසක් තිබී නැහැ. ජවිපෙ මතවාදය හා ක්‍රියාමාර්ගය වශයෙන් පසු කාලයේ ප්‍රකාශයට පත් වූ මතවාදය හා ක්‍රියාමාර්ගය නිර්මාණය කෙරුණේ පක්ෂය තුළ රහසිගත ව වැඩ කිරීම ආරම්භ කිරීමෙන් පසුව ක්‍රමික ව.

මෙහිදී ෂන්මුගදාසන් පක්ෂ නායකත්වයට නුසුදුසු බව ඒත්තු ගැන්වීමට ඉදිරිපත් කරන ලද ප්‍රකාශිත කරුණු කිහිපයක් තිබෙනවා. ඔහු කතාවෙන් මිස ක්‍රියාවෙන් විප්ලවවාදියකු නොවීම, "දේශපාලන බලය වැඩෙන්නේ තුවක්කුවේ කඳ තුළින් ය" යි පක්ෂයේ පුවත්පතේ ලීවාට පක්ෂය පරණ පුරුදු ප්‍රතිසංස්කරණවාදී මාවතේ ම ගෙන යාම, පක්ෂය තුළ නිලධාරිවාදී ලෙස ක්‍රියා කිරීම හා පක්ෂය තුළ ඔහුගේ සමීපතමයන්ට වරප්‍රසාද දෙමින් ඔවුන් පක්ෂයේ වගකිව යුතු තැන්වලට පත් කර ගැනීම, ලංකාවේ පීඩිත ම බලවේගයක් වූ හේන් ගොවියන් වැනි සුවිශාල පීඩිත ජනතාවක් නොසලකා හැරීම, දෙමළ වතුකම්කරුවන් ලාංකික විප්ලවයේ පෙරමුණු බලඇණිය ලෙස නිර්වචනය කිරීම ඉන් කිහිපයක්. (පසු කාලයේ එහි සුප්‍රකට පංති පහ නිර්මාණය කිරීමේදී එහි තුන්වැනි පංතිය වූ ඉන්දියානු ව්‍යාප්තවාදයනම් පංතියේදී කියා සිටියේ දෙමළ වතු කම්කරුවන් ඉන්දියානු ව්‍යාප්තවාදයේ අතකොලුවක් බවට පත් ව සිටින බවත් ඔවුන් ලාංකික විප්ලවයේදී විප්ලවීය බලවේගයක් වීමට ඉඩක් නොමැති බවත්).

විජේවීර පක්ෂය තුළ මෙසේ කණ්ඩායමක් ගොඩ නගමින් පක්ෂ නායකත්වය අල්ලා ගැනීමට ක්‍රියා කරන බව මේ සාකච්ඡාවලට සම්බන්ධවූවකුගෙන් (නිහාල් ඩයස්) විස්තරාත්මක ව ෂන්ට වාර්තා වීමෙන් පසු ෂන් නොපමා ව ම විජේවීර පක්ෂයෙන් නෙරපා දැම්මා. ඒ, විජේවීරගේ කණ්ඩායමට අයත් යැයි හෙළි වූ ගණනාවක් ද පක්ෂයෙන් නෙරපා දමමින්.

ඉන්පසු යම් බලාපොරොත්තු කඩවීමකට මුහුණදුන්න ද අපේක්ෂා අත් නොහරින්නකු වූ විජේවීරගේ ඊළඟ පියවර වූයේ ස්වාධීන ව නව විප්ලවීය ව්‍යාපාරයක් ගොඩ නැගීමට ක්‍රියා කිරීම. මෙහිදී ඒ වන විට පක්ෂයෙන් පමණක් නොව දේශපාලන ක්‍රියාකාරිත්වයෙන් ද ඉවත් ව සිටි එහෙත් මතවාදී වශයෙන් තවමත් විප්ලවීය ස්ථාවරයට සමු දී



නොසිටි විජේවීරගේ සමීපතමයකු වූ ප්‍රේමලාල් කුමාරසිරි නව පක්ෂයක් ගොඩ නැගීමට ක්‍රියා කරන්නැයි විජේවීරට දුන් උපදෙස මෙහිදී ඔහුට අමතර දිරි ගැන්වීමක් වුණා. සැබවින් ම ජවිපෙ නමින් පසු කාලයේ ගොඩ නැගුණු දේශපාලන ව්‍යාපාරයේ සැබෑ ආරම්භය සලකුණු වන්නේ එතැන් සිට. එනම් 1966 ජූලි මාසයෙන් පසුව.

1973 පමණ සිර ගෙදර සිට ලියූ 'අත්දැකීම් කිහිපයක්' නමැති ඔහුගේ පොත් පිංචෙහි (මුලින් ම 1973දී ද පසුව 2011 නොවැම්බරයේදී ද මුද්‍රිත) පවසන පරිදි ඔවුන් 1969 දක්වා ම පක්ෂ සංවිධානයක් ගොඩ නගා නැහැ. 1964-1969 දක්වා තමන් විසින් කරන ලද්දේ තනිකර ම ධනේශ්වර මතවාදයට එරෙහි ව විප්ලවීය මතවාදය ජයග්‍රහණය කිරීම සඳහා පමණක්" අරගල කිරීම.

මේ කෘතියට අනුව මතවාදී අරගලය සඳහා වූ මූලික පංති පහ මුලින් ම හැදුණේ නැහැ. ඒවා ගොඩ නැගුණේ ඓතිහාසික ක්‍රියාවලියක. ජනතාව සමග ජනතාවගේ සමාජ ප්‍රශ්න සාකච්ඡා කරමින්, ඒවා ද්විඝටනාත්මක ලෙස විශ්ලේෂණය කරමින් බිහිවී වර්ධනය වුණා. එම සමාජ ප්‍රශ්නවල උපතට හේතුත් තත්කාලයේ ඒවායේ පවතින සැබෑ තත්ත්වයත් ඒවා ඉදිරියට වර්ධනය වන ආකාරයත් සාකච්ඡා කිරීමේ ක්‍රියාවලියකයි පැවැතුණේ.

සංවිධානය ගොඩ නැගෙන්නේ මේ ක්‍රියාවලියේ ඉදිරි පියවරක් ලෙස 1969දී පමණ. එතෙක් තිබුණේ කුඩා කණ්ඩායමක් වූ සංවිධායක මණ්ඩලයක්. මුල් සංවිධායක කමිටුව තැනුණේ ඉහත කී දුර්වලයන් හා ඉතාමත් පරාභවගත වූවන් ද ඇතුළත් ව. පසුව එවැන්නන් ඉවත් කර අලුත් අය එකතුකර ගනිමින් ද පැරණි සංවිධාන කමිටුව විසුරුවා හැර නව සංවිධාන කමිටු ගොඩ නගමින් ද ඉදිරියට ගොස් තිබෙනවා. මක් නිසා ද ඒ සඳහා වර්ධනය වූ අය, උචිත අය හිඟ වීම නිසා. මේ සංවිධාන කමිටු වශයෙන් පැවති ක්‍රියාකාරිත්වය තවමත් ජනතා විමුක්ති පෙරමුණ වුණේ නැහැ. මේ ක්‍රියාකාරිත්වයට කීවේ ව්‍යාපාරය කියා.

මේ ව්‍යාපාරයට 1969 පමණ වන විට විවිධ පැරණි වාමාංශික දේශපාලන කණ්ඩායම්වලින් නානා කණ්ඩායම් දිනා ගන්නා බවත් මේවා එකිනෙක තුළ මතවාදීවත් සංවිධානාත්මකවත් ගුලි ගැසීම් හෙවත් විශේෂ බැඳීම් පැවතුණ බවත් කියන විජේවීර 'ධනේශ්වර ක්‍රමයක් තුළ පැවතීමත් පැරණි වාමාංශික ව්‍යාපාරයෙන් හින්න වීමේදී මේ සුළු ධනේශ්වර ගුණාංග තවත් කලකට පවතින බවත් තේරුම්ගෙන' ඒ කොටස් ද සම්බන්ධකර ගෙන ව්‍යාපාරය ගොඩ නැගීමට ක්‍රියා කළ බව පවසනවා. තවත් අවස්ථාවක ඔහු කියා තිබුණේ

1973 පමණ සිර ගෙදර සිට ලියූ 'අත්දැකීම් කිහිපයක්' නමැති ඔහුගේ පොත් පිංචෙහි (මුලින් ම 1973දී ද පසුව 2011 නොවැම්බරයේදී ද මුද්‍රිත) පවසන පරිදි ඔවුන් 1969 දක්වා ම පක්ෂ සංවිධානයක් ගොඩ නගා නැහැ. 1964-1969 දක්වා තමන් විසින් කරන ලද්දේ තනිකර ම ධනේශ්වර මතවාදයට එරෙහි ව විප්ලවීය මතවාදය ජයග්‍රහණය කිරීම සඳහා පමණක්" අරගල කිරීම.

පක්ෂයක් වශයෙන් නොව පැරණි වමෙන් කැඩී විප්ලවීය කණ්ඩායම් ලෙස වැඩ කරමින් සිටියාවූ ද ජවිපෙ ගොඩ නැගීමේ පුරෝගාමී 'ව්‍යාපාරය' සමග එකඟත්වයකට පැමිණ සිටියාවූ ද කණ්ඩායම්වල එකතුවක් නැතහොත් පෙරමුණක් වශයෙන් ජවිපෙ ගොඩ නැගූ බව. 'ජනතා විමුක්ති පෙරමුණ' යන නම යොදන්නට එක් හේතුවක් වූයේ ද එහි ඒ පෙරමුණු ස්වභාවය බව.

ඔහුට අනුව මෙහිදී ප්‍රමුඛ අරමුණ වූයේ වැඩ කිරීමෙන් ඔවුන් නිවැරදි කරගෙන, ඒ ඔස්සේ ඉතා දියුණු, ඉතා සංකීර්ණ ලෙනින්වාදී බොල්ෂෙවික් පක්ෂයක්, අව්‍යාජ විප්ලවකාරී බහුජන කොමියුනිස්ට් පක්ෂයක් ගොඩ නැගීමේ අරමුණ ඇති ව එහි සංවිධානාත්මක ප්‍රාරම්භක පියවර වශයෙන් ජනතා විමුක්ති පෙරමුණ ආරම්භ කිරීම. එය නිර්ධන පංති විප්ලවීය පක්ෂයක් නොව පක්ෂයක් ගොඩ නැගීම සඳහා වූ පක්ෂ පාසලක්. එහෙත් 1971 හා 1973 මේ පොත් පිංච ලිවීමට පෙර කිසිදු සාකච්ඡාවකදී කිසිදු ලියවිල්ලකදී එම අදහස ඉදිරිපත් කෙරුණේ නැහැ. අනෙක් අතට ජනතා විමුක්ති පෙරමුණ ම 2011 නොවැම්බරයේදී පළ කළ 'අත්දැකීම් කිහිපයක්' යන විජේවීරගේ පොත් පිංචේ ජනතා විමුක්ති පෙරමුණ යනු පක්ෂයක් නොව අනාගතයේදී ගොඩ නැගෙන කොමියුනිස්ට් පක්ෂයක් සඳහා වූ පක්ෂ පාසලකැයි තිර කොට කියා තිබෙනවා.

එහෙත් 1976 පමණ සිට ජවිපෙ තමන් අර්ධ අවස්ථාවාදී පක්ෂයක් වූ බව කියා සිටියා. තමන් බිහි වූයේ නිර්ධන පංති විරෝධී අවස්ථාවාදී අර්ධ ස්ටාලින්වාදී හා අර්ධ මාඕවාදී ගර්භාෂයෙන් බවත් තමන් එසේ අර්ධ අවස්ථාවාදී පක්ෂයක් වූයේ ඒ නිසා බවත් කියා සිටියා. දේශප්‍රේමය මෙන්ෂෙවික්වාදී නිර්ධන පංති ද්‍රෝහි ධනේශ්වර පංති සංකල්පයක් බවත් දේශප්‍රේමය පිළිගැනීම ද්‍රෝහිකමක් බවත් කියා සිටියා. (බලන්න, අවස්ථාවාදය ද නිර්ධන පංති ජාත්‍යන්තරවාදය ද? - රෝහණ විජේවීර) ඉන්පසු මෙන්ෂෙවික්වාදී ජනතා විමුක්ති පෙරමුණ වෙනුවට නූතන බොල්ෂෙවික් පක්ෂය පිහිටුවූවා.

මේ දේශපාලන ව්‍යාපාරය ගොඩ නැගීමෙහිලා විජේවීරගේ කැපවීම තීරණාත්මක වූවක්. ඔහුගෙන් විචාරාත්මක ව උගත යුතු දෑ බොහෝ තිබෙනවා. බ්‍රිතාන්‍ය අග්‍රගණ්‍ය ධනපති නායකයකු හා අගමැතිවරයකු වූ ලොයිඩ් ජෝර්ජ්ගෙන් ඉගෙන ගත්තාට පව් නැතැයි වරක් ලෙනින් පැවසුවා. එසේ කල රෝහණ විජේවීර වැනි සුවිශේෂ මිනිසකුගෙන් ඉගෙන ගත්තාට කමක් නැතැයි කීමෙහි වරදක් නැහැ.

# ලී ජේ-මියුං මුල් පුටුවට

නිහාල් පීරිස්

ඉතා දුෂ්කර ළමා වියක් ගත කර, වරක් සියදිවි නසා ගැනීමට පවා උත්සාහ කළ කෙනකු පසුව කෙමෙන් ජීවිතය ජයගෙන තම රටේ ජනාධිපති පදවියට පවා පත්වීමට සමත් වුවහොත් එය අපූරු කාරණයක්. මෙවැනි අපූරු පුද්ගලයකු ගැන පසුගිය දිනවල දකුණු කොරියාවෙන් වාර්තා වුණා.

2025 ජුනි 03 දින දකුණු කොරියාවේ හදිසි ජනාධිපතිවරණයක් පැවැත්වුණු අතර එයින් ජය ගත්තේ ඒ වන විට එරට විරුද්ධ පක්ෂ නායකයා ව සිටි ලී ජේ-මියුං. ඔහු දකුණු කොරියාවේ 14 වැනි ජනාධිපතිවරයා ලෙස ජුනි 04 දින දිවුරුම් දුන්නා.

ලී ජේ-මියුං දේශපාලන ක්ෂේත්‍රයේ සාර්ථක ගමනක් පැමිණියකු ලෙස හැඳින්විය හැකි වුවත් ඔහු ජීවිතයේ බොහෝ අභියෝගවලට මුහුණදුන් පුද්ගලයෙක්. 1963 වසරේ ඔහු උපත ලැබුවේ ඇන්ඩොං නැමැති ප්‍රදේශයේ ඉතා දිළිඳු පවුලක. ඔහුගේ පියා සූදුවට ඇබ්බැහි වී මුදල් නාස්ති කළ අයෙක් බව ද සඳහන්.



ලී ජේ-මියුං

මෙවැනි පසුබිමක ලී ජේ-මියුං හැදී වැඩී තිබුණේ බොහෝ ආර්ථික අපහසුකම් මධ්‍යයේ. ප්‍රාථමික අධ්‍යාපනයෙන් පසු ඔහුට අධ්‍යාපනය ලැබීම සඳහා මුදල් නොතිබුණෙන් ළමා ශ්‍රමිකයකු ලෙස කර්මාන්ත ශාලා කිහිපයක රැකියා කරන්නට සිදු වුණා. මේ කාලයේ කිසියම් යන්ත්‍රයකට හසුවීමෙන් ඔහුගේ අතක් දරුණු ලෙස ආබාධයකට ලක් වී ඇති අතර ලී ජේ-මියුං ආබාධිත පුද්ගලයකු ලෙස ද ලියාපදිංචි වී සිටි අයෙක්. වරක් ඔහු ජීවිතය නැති කර ගැනීමට පවා උත්සාහ ගෙන තිබුණා. එහෙත් පසු කාලයේ ඉතා උත්සාහවන්ත පුද්ගලයකු බවට පත් වූ ලී ශිෂ්‍යත්ව ලබමින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය පවා ලබන්නට සමත් වූ අතර නීතිඥ වෘත්තියට ද පිවිසියා.

2005 වසරේ මුල්වරට දේශපාලන ක්ෂේත්‍රයට පිවිස එහි සාර්ථක ගමනක් පැමිණි ලී 2022 වසරේ දකුණු කොරියාවේ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායකත්වයට පත් වනවා. එම පක්ෂයේ අපේක්ෂකයා ලෙස නොබෝද ජනාධිපතිවරණයට ඉදිරිපත් වූ ඔහු එයින් හිමි කර ගන්නේ විශිෂ්ට ජයක්.

දකුණු කොරියාවේ මීළඟ ජනාධිපතිවරණය පැවැත්වීමට නියමිත ව තිබුණේ 2027 වසරේ. එහෙත් ඊට පෙර හදිසි ජනාධිපතිවරණයක් කැඳවන්නට සිදු වූයේ ඉතා ආන්දෝලනාත්මක සිදුවීම් පෙළකින් පසු එරට හිටපු ජනාධිපති යූන් සුක් යෝල් දෝෂාභියෝගයකින් ධුරයෙන් පහ කිරීම නිසා.

හිටපු ජනාධිපතිවරයාට එරෙහි ව මේ ආකාරයේ දෝෂාභියෝගයකට මග පෑදුණේ ඔහු හදිසියේ ම රටේ යුද නීතිය පැනවීමේ සිද්ධියක් හේතුවෙන්. මේ ආකාරයෙන් රටක යුද නීතිය පැන වූ විට ක්‍රියාත්මක වන්නේ හමුදා පාලනයකට සමාන තත්ත්වයක්. එය ප්‍රජාතන්ත්‍රවාදී පාලනයකට බරපතළ තර්ජනයක්. යූන් සුක් යෝල් මේ ආකාරයෙන් යුද නීතිය ප්‍රකාශයට පත් කළේ 2024 දෙසැම්බර් 03 දින.

යුද නීතිය පැනවීමට හේතුව ලෙස ඔහු සඳහන් කළේ රටට සතුරු බලවේග හිස ඔසවමින් ඇතැයි යන්න. මේ බලවේග මර්දනය යුද නීතිය පැනවීමේ අරමුණ බවයි ඔහු පවසන්නේ. යූන් සුක් යෝල් මේ ආකාරයෙන් චෝදනා


ද යූන් සුක් යෝල්

එල්ල කළේ එරට විරුද්ධ පක්ෂවලට. මේ පක්ෂ දකුණු කොරියාවේ විශාල ම සතුරා ලෙස සැලකෙන උතුරු කොරියාවට හිතවත්කම් දක්වන බවට ද යූන් සුක් යෝල් චෝදනා කළා. ඔහු ප්‍රධාන වශයෙන් ම චෝදනා එල්ල කළේ ලී ජේ-මියුං නායකත්වය දැරූ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට.

කෙසේ වෙතත් යූන් සුක් යෝල් යුද නීතිය පැනවීමට සැබෑ හේතුව ඒ වනවිට විරුද්ධ පක්ෂ වෙතින් ඔහුගේ බලයට දැඩි තර්ජනයක් එල්ල වෙමින් තිබීම බවට අදහස් පළ වුණා. ඔහු අයත් වූයේ ජනතා බලය නැමැති පක්ෂයට වුවත් පාර්ලිමේන්තුවේ වැඩි බලයක් හිමි කරගෙන සිටියේ විරුද්ධ පක්ෂ. මේ නිසා යූන් සුක් යෝල්ට ඔහුගේ වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යාම බෙහෙවින් අසීරු වුණා.

ඔහුගේ බිරිඳ කිම් කෝන් හී. ඇයට එරෙහි ව යම් දූෂණ චෝදනා එල්ල වී තිබූ අතර විරුද්ධ පක්ෂ මේ පිටුපස ද පන්නමින් සිටියා. හිටපු ජනාධිපතිවරයා යුද නීතියක් පනවමින් මර්දනකාරී පාලනයකට සූදානම් වූයේ මෙවැනි පසුබිමක. එහෙත් විරුදධ පක්ෂ සහ ජනතාව වෙතින් එල්ල වූ දැඩි විරෝධය හමුවේ ඔහුට පැය කිහිපයකින් යුද නීතිය හකුළා ගන්නටයි සිදු වුණේ.

යූන් සුක් යෝල්ට එරෙහි දෝෂාභියෝගය පාර්ලිමේන්තුවේ සම්මත වූයේ 2024 වසරේ දෙසැම්බර් 14 දින. එයින් පසු 2025 අප්‍රේල් 04 දින දකුණු කොරියාවේ ව්‍යවස්ථාදායක අධිකරණය ද මේ දෝෂාභියෝගයට පක්ෂ ව තීන්දුවක් ලබා දීමෙන් අනතුරු ව යූන් සුක් යෝල් නිල වශයෙන් ම ධුරයෙන් ඉවත් කෙරුණා.

දකුණු කොරියාවේ ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයකු මේ ආකාරයෙන් ධුරයෙන් ඉවත් කර දින 60ක් ඇතුළත නැවත ජනාධිපතිවරණයක් පැවැත්විය යුතුයි. ජූනි 03 දින ජනාධිපතිවරණයට දින නියම වූයේ මේ ආකාරයෙන්.

මෙවර ජනාධිපතිවරණය සැලකෙන්නේ එරට මෑත ඉතිහාසයේ වැඩි ම ඡන්දදායකයන් ප්‍රතිශතයක් ඡන්දය භාවිත කළ ජනාධිපතිවරණයක් ලෙසින්. මෙහිදී ලියාපදිංචි ඡන්දදායකයන්ගෙන් සියයට 80කට ආසන්න ප්‍රතිශතයක් ඡන්දය පාවිච්චි කර තිබුණා. රටේ පසුගිය කාලයේ සිදු වූ අප්‍රසන්න සිදුවීම් නිසා ජනතාව තුළ වෙනසක් සඳහා දැඩි වුවමනාවක් තිබූ බව පෙනී ගිය කාරණයක්.

හිටපු ජනාධිපති යූන් සුක් යෝල් අයත් වූ ජනතා බලය පක්ෂයේ ජනප්‍රියත්වය බෙහෙවින් පිරිහී තිබූ අතර එම පසුබිමේ ලී ජේ-මියුං ජනාධිපතිවරණයෙන් පහසු ජයක් හිමි කරගනු ඇති බව ජනමත සමීක්ෂණවලින් ද පෙන්නුම් කර තිබුණා.

කෙසේ වෙතත් ඔහුට එරෙහි ව ද පසුගිය කාලයේ විවිධ චෝදනා එල්ල වූ බව සිහිපත් කළ යුත්තක්. අල්ලස් දූෂණ චෝදනා ද මේ අතර වුණා. එසේ වුවත් දකුණු කොරියාව දේශපාලන වශයෙන් මෙන් ම ආර්ථික වශයෙන් ද යම් යම් කැළඹීම්වලට මුහුණ දී ඇති කාලයක රටේ නායකත්වයට සුදුසු ම පුද්ගලයා ලී ජේ-මියුං බව එරට ජනතාව තීරණය කර තිබෙනවා.

පසුගිය කාලයේ දකුණු කොරියානු දේශපාලන ක්ෂේත්‍රයේ ඇති වූ පිල් බෙදීම් හේතුවෙන් බොහෝ ආතති හටගෙන තිබුණා. මේ ආතති සමනය කරමින් යම් සංහිඳියාවක් ඇති කිරීම නව ජනාධිපතිවරයා හමුවේ ඇති ප්‍රධාන අභියෝගයක්. ඒ අතර ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ආන්දෝලනාත්මක තීරු බදු ප්‍රතිපත්තිය නිසා දකුණු කොරියානු ආර්ථිකය ද යම් අවිනිශ්චිතතාවකට මුහුණ දී සිටිනවා. පසුගිය අප්‍රේල් මාසයේ ට්‍රම්ප් ලෝකයේ රටවල් රැසකට අදාළ ව ඉහළ තීරු බදු ප්‍රකාශයට පත් කළ අතර දකුණු කොරියාවෙන් ඇමරිකාවට ආනයනය කරන භාණ්ඩ වෙනුවෙන් ද සියයට 25ක තීරු බදු ප්‍රකාශයට පත් කළා.

මේ නිසා ඉදිරියේදී ඇති විය හැකි ආර්ථික ගැටලු නිසි පරිදි කළමනාකරණය කිරීමේ අභියෝගය ද ජනාධිපති ලී ජේ-මියුං හමුවේ පවතින්නක්.



# පාප්වරණය

සුගත්ප්‍රිය කුලතුංග ආරච්චි

2025 මැයි මස 08 දින රෝමයේ වතිකානු නගරයේ පාප් වහන්සේගේ නිල නිවස ලෙස සුප්‍රකට සිස්ටයින් දේවස්ථානයේ චිමිනියෙන් සුදු දුමාරයක් නැඟී ගියා. එය පාප්වරයකු තෝරා ගැනීමේ පූජක සම්මේලනයේ අවසානය සහ ඒ සමග නව පාප්වරයකු තෝරා පත් කර ගත් බව ලොවට ම සනිටුහන් කළ ජය සංකේතය වුණා.

නිදහස් ඇමරිකා එක්සත් ජනපදය පිහිටුවීමෙන් පසු පත් වූ පාප්වරු 17 දෙනාගෙන් කිසිවකු එරට නියෝජනය කළේ නැහැ. එහෙත් දකුණු චිකාගෝහි උපන් රොබට් ෆ්‍රැන්සිස් ප්‍රෙවොස්ට්, රෝමයේ ශාන්ත පීතර බැසිලිකාවේ බැල්කනියට පැමිණ ඉතාලි භාෂාවෙන් "ලා පේස් සියා කොන්ටුට්ටි වොයි" හෙවත් "ඔබ සැමට සාමය ලැබේවා" යන වචන ප්‍රකාශ කළ 2025 මැයි මස 08 දින ඒ ඉතිහාසය මුළුමනින් ම වෙනස් වුණා. ඔහු ඒ මොහොතේ පත් ව සිටියේ ලොව කතෝලිකයන් බිලියන 1.4කගේ පූජනීය නායකත්වයට.

ඔහු ඇමරිකා එක්සත් ජනපදයෙන් තෝරා ගත් පළමු වැනි පාප් වහන්සේ මෙන් ම සමස්ත ඇමරිකා මහාද්වීපයෙන් පැමිණි දෙවැනි පාප් වහන්සේ ලෙස ඉතිහාසයට එක් වුණා. නව පාප්තුමා ඇමරිකා එක්සත් ජනපදයේ ගත කර තිබුණේ තම ජීවිත කාලයෙන් 1/3ක් පමණ. ඔහු ඉතිරි කාලයෙන් වැඩි කොටසක් ගත කර ඇත්තේ යුරෝපයේ සහ ලතින් ඇමරිකාවේ පේරු රටේ.

2025 අප්‍රේල් 21 දින ෆ්‍රැන්සිස් පාප්තුමා මිය ගිය බව නිල වශයෙන් නිවේදනය කළ පසු නව පාප්වරයකු තෝරා ගැනීමට අවස්ථාව එළැඹුණා. මේ පාප්වරණයට සුදුසුකම්ලත් කාදිනල් ඡන්දදායකයන් 135 දෙනාගෙන් දෙදෙනකු හැර අන් සියල්ලන් ම සහභාගි වී සිටියා. ඒ සඳහා වූ සිව් වැනි ඡන්ද විමසීමේදී, සම්මේලනය ඒ වන විට බිෂොප්වරුන් සඳහා වූ ඩිකාස්ටරියේ ප්‍රධානියා සහ ලතින් ඇමරිකාව සඳහා වූ පොන්ටිෆිකල් කොමිසමේ සභාපති වූ කාදිනල් රොබට් ෆ්‍රැන්සිස් ප්‍රෙවොස්ට් තෝරා පත් කර ගත්තා. ඒ අනුව චිකාගෝහි උපත ලැබූ රොබට් ප්‍රෙවොස්ට් කාදිනල්වරයා කතෝලික පල්ලියේ නව ප්‍රධානියා ලෙස තේරී පත් වූ බව නිවේදනය කරන්නට යෙදුණා. ඔහු මේ පදවියට පත් වූයේ රෝමානු කතෝලික පල්ලියේ 267 වැනි පාප් වහන්සේ ලෙස. එතුමන් පසුවන්නේ 69 වැනි වියේ.

එතැන් සිට නව පාප් වහන්සේ ලෙස ඔහුගේ නාමය XIV වැනි ලියෝ ලෙස භාවිතයට තින්දු වුණා. ලියෝ ඔහුගේ පාප්වර නාමය ලබා ගත්තේ වර්ෂ 440 සිට වර්ෂ 461 දක්වා පල්ලියට නායකත්වය දුන් මහා ලියෝගෙන් ආරම්භ වූ පාප්වරුන්ගේ පෙළපතකින්. එම නම ගත් අවසන් පාප් වහන්සේ වන XIII ලියෝ වර්ෂ 1878 සිට වර්ෂ 1903 දක්වා රෝමානු කතෝලික පල්ලියේ මුලසුන දැරුවා.

විශේෂඥයන්ට අනුව, ලියෝ ඔහුගේ මේ පාප්වර නම තෝරා ගැනීමේදී ගතික සමාජ ගැටලු සඳහා කැපවීමක් ඔහු සතු ව ඇති බව පෙන්නුම් කර තිබෙනවා. නිදසුනක් ලෙස වර්ෂ 461දී පාප් පදවිය අවසන් වූ ලියෝ යන නම භාවිත කළ පළමු පාප්තුමා, හූන් ජාතික අධිරාජ්‍ය ආටිලා හමුවී රෝමයට පහර නොදෙන ලෙස ඔහුට ඒත්තු ගැන්වීමට ක්‍රියා කළ නිර්භීත චරිතයක්. එසේ ම අවසාන ලියෝ පාප් වහන්සේ කම්කරු අයිතිවාසිකම් පිළිබඳ බලගතු නිබන්ධනයක් ලියූ පෙරළිකාර චරිතයක්.

නව පාප්තුමා පත් වීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර වෙබ් අඩවියක සඳහන් වුණේ"ලෝකයේ මහා කැළඹිලි සහිත කාලයක, කාර්මික විප්ලවයේ සහ මාක්ස්වාදයේ ආරම්භය සිදුවුණු පුළුල් සංක්‍රමණ කාලයක පාප්තුමා ලෙස ක්‍රියා කළ XIII ලියෝ පාප්තුමා අනුගමනය කළ සමාජ සාධාරණත්වයේ උරුමය සමග පුළුල් ලෙස සම්බන්ධ වූ නමක් තෝරාගෙන ඇත"යනුවෙන්.

අනාගත බිෂොප්වරුන් හඳුනාගෙන ශුද්ධස්ථානයට නිර්දේශ කරන පරිපාලන ආයතනයක් වන බිෂොප්වරුන් සඳහා වූ ඩිකාස්ටරි ආයතනයට පළමු වරට කාන්තාවන්ට සම්බන්ධ වීමට අවසර දීමේ ෆ්‍රැන්සිස් පාප්තුමාගේ තීරණයට එවකට කාදිනල්වරයකු වූ XIV වන ලියෝ පාප්තුමා සහාය පළ කර තිබුණා. දේශගුණික විපර්යාස ගැන පසුගිය වසරේ කතා කරමින් එවකට කාදිනල් ප්‍රෙවොස්ට් පැවසුවේ 'වචන වලින් ක්‍රියාවට' යාමට කාලය පැමිණ ඇති බව. පරිසරය සමග 'අන්‍යෝන්‍ය සම්බන්ධතාවක්' ගොඩනඟා ගන්නා ලෙස ඔහු මානව වර්ගයාගෙන් ඉල්ලා සිටියා. ඔහු වතිකානුවේ සූර්ය පැනල සවි කිරීම සහ විදුලි වාහන භාවිත කිරීම ඇතුළු නවීකරණවාදී ප්‍රගතිශීලී පියවර ගැනත් කතා කර තිබුණා.

ඇමරිකා එක්සත් ජනපදයේ ලුසියානා ප්‍රාන්තයේ පෙළපත් විද්‍යාඥයකු සහ

ඉතිහාසඥයකු වන ජාරි හොනෝරා පැවසුවේ ලියෝට නිව් ඕර්ලියන්ස්හි කළු ප්‍රජාව සමග ශක්තිමත් පාරම්පරික සබඳතාවක් ඇති බව. ඓතිහාසික වාර්තාවල පාප් ලියෝගේ මිත්තණියන් සහ මුත්තණුවන් කළු හෝ මුලටෝ ජාතිකයන් ලෙස විස්තර කර ඇතත් ඔවුන් චිකාගෝ වෙත සංක්‍රමණය වන විට පවුලේ අනන්‍යතාව සුදු ජාතිකයන් ලෙස ලැයිස්තුගත කර ඇති බව හොනෝරා පවසනවා. එකල පැවැති වාර්ගික වෙන්වීමෙන් බේරීමට මගක් සෙවූ කළු ජාතික පවුල් අතර එය පොදු සිරිතක් ව තිබුණා.

නව XIV ලියෝ පාප් වහන්සේ ඔහුගේ පූර්වගාමියා වූ ෆ්‍රැන්සිස් පාප් වහන්සේ අනුව යමින් පෙරළිකාර අදහස් දරන්නකු ලෙස ප්‍රසිද්ධියට පත් වූවෙක්. ඔහු කිතුණු සමාජයේ සේවයට කැප වූ මුල් කාලයේ සිට සමාජයේ කොන් වීමට හා අසාධාරණයට ලක් ව සිටි ජනතාව අතර ගැවසුණු, ඔවුන් වෙනුවෙන් පෙනී සිටි අයෙක්.

වර්ෂ 1955දී චිකාගෝ ඉලිනොයිස්හීදි ස්පාඤ්ඤ සහ ෆ්‍රැන්කෝ-ඉතාලි සම්භවයක් ඇති මව්පියන්ට දාව රොබට් ෆ්‍රැන්සිස් ප්‍රෙවොස්ට් ලෙස උපත ලද ඔහු ගෝලීය කතෝලික ප්‍රජාව සමග සම්බන්ධ වීමට භාවිත කරන ඉංග්‍රීසි සහ ස්පාඤ්ඤ භාෂා සමගින් ඉතාලි, ප්‍රංශ සහ පෘතුගීසි භාෂා ද චතුර ලෙස භාවිතයට සමත් අයෙක්. කුඩා අවදියේ ලියෝ, අල්තාර සහයකයකු ලෙස සේවය කළ අතර වර්ෂ 1992දී පැවිදි බිමට එක් ව තිබෙනවා. කාලයක් ලොව පැතිර ගිය ඔගස්ටිනියානු නිකායේ ගෝලීය ප්‍රධානියා ලෙස ද සේවය කළ ඔහු එකල වතිකානුවේදී ගෝලීය ව සිදු කරන බිෂොප් පත්වීම් අධීක්ෂණයට ද එක් වුණා. ඒ අනුව ඔහු පළමු ඔගස්ටීනියානු නිකායික පාප් වහන්සේ ද වනවා.

මෙතුමා රෝමයේ ශාන්ත තෝමස් ඇක්වයිනාස්ගේ පොන්ටිෆිකල් විශ්වවිද්‍යාලයෙන් පූජකවර නීතිය පිළිබඳ ආචාර්ය උපාධියක් ද ලබා ගත් අයෙක්. වර්ෂ 1977දී විලානෝවා විශ්වවිද්‍යාලයෙන් ද ඔහු උපාධියක් ලබා ගත්තේ ගණිතය සහ දර්ශනය ද හැදෑරීමෙන්. පසුව විලානෝවා ඔහුට මානව ශාස්ත්‍ර පිළිබඳ ගෞරව ආචාර්ය උපාධියක් ද ප්‍රදානය කළා. වර්ෂ 1984දී පූජකවර බලපත්‍රය ලබා ගත් ඔහු 1985දී පේරුහි ඔගස්ටීනියානු දූත මෙහෙවරට යවන්නට යෙදුණා.

XIV වැනි ලියෝ පාප් වහන්සේ පේරුහි වසර 20කට ආසන්න කාලයක් මිෂනාරිවරයකු ලෙස ගත කළ අතර ඔහුගේ පූර්වගාමියා මෙන් ම පීඩාවට පත් දුගී දුප්පත් ප්‍රජාව අතර ගැවැසෙමින් ඔවුන් වෙත සිය සේවාව සැපැයුවා.

වර්ෂ 2015දී පේරුහි පුරවැසියකු බවට පත් වූ මෙතුමා එම වසරේ ම එරට චික්ලායෝහි බිෂොප්වරයා ලෙස නම් කරන්නට යෙදුණා. වර්ෂ 2023දී ෆ්‍රැන්සිස් පාප් වහන්සේ විසින් ලියෝ, කාදිනල් තනතුරට උසස් කරන ලද අතර ලොව බිෂොප්වරුන් පත් කිරීම සම්බන්ධයෙන් පාප් වහන්සේට උපදෙස් දීමේ කාර්යය පැවරී තිබූ බලගතු වතිකානු බිෂොප් ඩිකාස්ටරියේ පාලනය ඔහුට ලබා දුන්නා.

කුඩා කල සිට ම ආගමික ලැදියාවකින් යුතු ව නව පාප් වහන්සේ හැදී වැඩුණු බව ඔහුගේ සහෝදරයාගේ ප්‍රකාශයකින් එළිදරව් වනවා. ඔහු පවුලේ බාලයා. ඔහුට වැඩිමල් සහෝදරයන් දෙදෙනකු සිටියා. ළමා කාලයේ නිවසේදී ඔහු බොහෝවිට සිය සහෝදරයන් ඉදිරියේදි 'පූජකයකු' ලෙස රඟපෑ බව ඔහුගේ වැඩිමහල් සහෝදරයා වන ජෝන් ප්‍රෙවොස්ට් චිකාගෝ ට්‍රිබියුන් වෙත කියා තිබුණා. "ඔහු සුදු රෙද්දකින් මේසයක් ආවරණය කර අල්තාරයක් සේ සකස් කර යාච්ඤා කිව්වා. එය සම්පූර්ණයෙන් ම බැරෑරුම් ලෙස සැලකුවේ නැහැ. කිසිවිටෙක ක්‍රීඩාවක් ලෙස එය සිදුකළේ නැහැ," යනුවෙන් ජෝන් කියා තිබුණා. ඔහු මතකයට නැංවූයේ පුංචි ප්‍රෙවොස්ට්ට යන්තම් වයස අවුරුදු පහ පිරෙද්දී ඔවුන්ගේ අසල්වැසියකු මේ දරුවා යම් දිනක ලෝකය ම ආදරය කරන පාප් වහන්සේ බවට පත් වනු ඇතැයි අපූර්ව අනාවැකියක් ප්‍රකාශ කළ ආකාරය.

ඒ සියල්ල පරයන අපූරුව වූයේ ඔහුගේ සහෝදරයා සිනාසෙමින් විස්තර කළ ආකාරයට, සිය ජීවිතය සදහට ම වෙනස් කරන, පාප්වරණයට හෙවත් කොන්ක්ලේව් (Conclave) යාමට ටික වේලාවකට පෙර, පාප් ලියෝ 'Conclave' නරඹා අවසන් කිරීම. ඔව්, ඒ තමා පාප්වරයකු තෝරා පත් කර ගැනීම ගැන කියන ජනප්‍රිය චිත්‍රපටය.





චන්දන මාරසිංහ



## වනාන්තර අනතුරේ

පර්යේෂකයන් දක්වන ආකාරයට වනාන්තරවලින් වර්ග කිලෝමීටර් 67000ක් 2024 වසරේ අහිමි වී තිබෙනවා. එය අයර්ලන්ත ජනරජය තරම් විශාල බවයි ඔවුන් පවසන්නේ. වාර්තාගත නියඟය හමුවේ ලැව් ගිනි හට ගැනීම මීට ප්‍රධාන හේතුවක්. ඇමසන් වනාන්තරයට ද මේ බලපෑම් එල්ල වුණා. ගෝලීය උණුසුම 1.5$^{0}$C ඉක්මවා ගියහොත් ඇමර්සන් වනාන්තරයට ද දැඩි හානි සිදුවිය හැකි බවට විද්‍යාඥයන් අනතුරු අඟවනවා. ඇමසන් වනාන්තරය මෙතෙක් මුහුණදුන් දරුණුතම නියඟයට ලක් වූයේ 2023 2024 වසරවලදී. කෘෂිකර්මාන්තය සඳහා ඉඩම් එළිපෙහෙළි කිරීමත් තර්ජනයක්. අග්නිදිග ආසියාවේ බොහෝ රටවල වනාන්තර විනාශය අඩුවී තිබෙනවා. ඉන්දුනීසියාව වැනි රටවල එම තත්ත්වය දැකිය හැකි බවයි ගෝලීය වනාන්තර නිරීක්ෂණ ව්‍යාපෘතිය පවසන්නේ. එක්සත් ජාතීන්ගේ දේශගුණික සමුළුව මෙවර ඇමසන් වනාන්තරය ආශ්‍රිත ව පැවැත්වෙනු ඇති අතර වනාන්තර ආරක්ෂා කිරීමේ යෝජනා ක්‍රම බෙදා ගැනීමට එය වැදගත් විය හැකි බවයි පර්යේෂකයන්ගේ සඳහන.




## සමුගත් ලොව දුප්පත් ම ජනපති

උරුගුවේ හිටපු ජනාධිපති jose Mujica 2025 මැයි 13 දින මිය ගියා. පේපේ ලෙස හැඳින්වුණු ඔහුට මිය යන විට වයස අවුරුදු 89ක්. ජීවන රටාව හේතුවෙන් ලොව දුප්පත් ම ජනපති ලෙස හිටපු ජනාධිපති jose Mujica හඳුන්වා තිබෙනවා. වත්මන් ජනාධිපති Yamandu Orsi සඳහන් කළේ 'ඔබ අපට දුන් සියල්ලට සහ ජනතාව කෙරෙහි ඇති ඔබේ ගැඹුරු ප්‍රේමයට ස්තුතියි' යනුවෙන්. 1960 ගණන්වල ඔහු ජාතික විමුක්ති ව්‍යාපාරය පිහිටුවීමට උදව් කර තිබෙනවා. 1970 වසරේ සිරගත වීමට සිදු වූ ඔහුට උරුගුවේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතේ නිදහස ලැබෙන්නේ 1985 වසරේදී. 2005 වසරේ උරුගුවේ වාමාංශික සන්ධාන රජයේ ඇමැති ධුරයකට පත් වන ඔහු 2010 වසරේදී උරුගුවේ ජනාධිපති ධුරයට පත් වුණා. එතැන් සිට 2015 දක්වා එරට පාලනය කළ ඔහු දේශපාලනයෙන් සමු ගත්තේ 2020 වසරේදී. ඔහුගේ පාලන සමයේ වාර්ෂික ආර්ථික වර්ධනය 5.4%ක් වූ අතර දරිද්‍රතාව අඩු වී විරැකියාව ද අඩුවුණා. බලයේ සිටියදී ජනාධිපති මන්දිරයට යාම පවා ප්‍රතික්ෂේප කළ ඔහු තම වැටුපෙන් ද විශාල කොටසක් පරිත්‍යාග කර ඇති අතර ඔහුට දූෂණ චෝදනා කිසිවක් එල්ල වී නැහැ.



## ඊශ්‍රායලයේ හමාස් ඉලක්කය

හමාස් සංවිධානයේ නව නායකයා වූ Mohammed Sinwar ඝාතනය කළ බව ඊශ්‍රායල් අගමැති Benjamin Netanyahu සඳහන් කළා. හමාස් නායකයන් ලෙස ක්‍රියා කළ Yahiya Ibrahim සහ Hassan Sinwar මීට පෙර ඝාතනය වුණා. කාන් යුනිස් ආශ්‍රිත යුරෝපීය රෝහලකට ඊශ්‍රායලය එල්ල කළ දැවැන්ත ප්‍රහාරයක් හමුවේ පලස්තින ජාතිකයන් 28 දෙනකු මිය ගිය අතර 50කට වැඩි පිරිසක් තුවාල ලැබුවා. එම මිය ගිය අය අතර Mohammed Sinwar සිටින බවයි ඊශ්‍රායලය විශ්වාස කරන්නේ. ගසා තීරයේ කොටසක් අත්පත් කර ගැනීම ඊශ්‍රායල් අගමැතිගේ සැලසුම්වලට ඇතුළත්. යුද්ධය අවසන් කිරීමට ඔහු කොන්දේසි කිහිපයක් ඉදිරිපත් කළා. ඒ අතර සියලු ම සිරකරුවන් නිදහස් කිරීම, හමාස් සංවිධානය නිරායුධ කිරීම, එහි නායකයන් පිටුවහල් කිරීම සහ ගාසා තීරයෙන් පලස්තීන ජාතිකයන් ඉවත් කිරීම සඳහා වන ඇමරිකානු ජනාධිපතිවරයාගේ යෝජනාව පිළිගැනීම ද වනවා.



## අළු යට සැඟවුණු ගිනිපුපුරු

පාකිස්තානයේ Balochistanහි පාසල් බස් රථයකට මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල වුණා. ඉන් පාසල් සිසුන් 03 දෙනකු ඇතුළු පස් දෙනකු මිය ගිය අතර කුශ්බාර් නගරයේ හමුදා පොදු පාසලකට අයත් බස් රථය ධාවනය කරමින් තිබියදීයි මේ ප්‍රහාරය එල්ල කර තිබෙන්නේ. ප්‍රහාරය එල්ල වන විට බස් රථයේ සිසුන් 40 පමණ ගමන් කර තිබෙනවා. ප්‍රහාරයේ වගකීම කිසිදු සංවිධානයක් බාරගෙන නැහැ. කෙසේ වෙතත් පාකිස්තාන හමුදාව පැවසුවේ මේ ප්‍රහාරය ඉන්දියාවේ සැලසුමක් බව. එම චෝදනාව ඉන්දීය විදේශ අමාත්‍යාංශය ප්‍රතික්ෂේප කර තිබෙනවා. රටවල් දෙක අතර පැවති මතභේදාත්මක වාතාවරණය උත්සන්න වූයේ එකිනෙකා ප්‍රහාර එල්ල කර ගැනීම හේතුවෙන්. ඇති කරගත් සටන් විරාම යෝජනාව නිසා එය තරමක් සමථයකට පත් ව තිබෙනවා. ඉන්දීය අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක වන ත්‍රස්තවාදී කණ්ඩායමක් බස් රථයට ප්‍රහාර එල්ල කළ බව පාකිස්තාන රජයත් ප්‍රකාශ කර තිබෙනවා.



## ඇමතිකම අහිමි කළ සහල්

විහිළුවක් හේතුවෙන් ජපාන කෘෂිකර්ම අමාත්‍ය Taku Etoට (2025 මැයි 21) ඉල්ලා අස්වීමට සිදුවුණා." මගේ ආධාරකරුවන් මට ගොඩක් සහල් දෙනවා. අලෙවි කිරීමට ද හැකි තරම් ඒවා ගෙදර තිබෙනවා" යනුවෙන් ඔහු කළ ප්‍රකාශය ජපාන ජනතාවගේ විරෝධයට හේතු වුණා. මෙහිදී ජපාන ජනතාවගෙන් අයදිමින් අමාත්‍යවරයා සමාව ඉල්ලා තිබෙනවා.

ජපානයේ ප්‍රධාන ලෙස ම භාවිතයට ගන්නා සහල් මිල ඉහළ යාම හේතුවෙන් සහල් ආනයනය කිරීමට ද එරට අවධානය යොමු ව තිබෙනවා. ජීවන වියදම ඉහළ යාම හේතුවෙන් ජපාන රජයට දැඩි බලපෑමක් එල්ල වුණා. මේ කරුණු පදනම් කරගෙන ජපාන විපක්ෂය රජයට දැඩි ලෙස බලපෑම් එල්ල කර තිබෙන අතර එය ජපානයේ දේශපාලන ගැටලුවක් බවට ද පත්වුණා. මෙවැනි පසුබිමක කෘෂිකර්ම අමාත්‍ය Taku Eto කළ ප්‍රකාශය නිසා ඔහු ඉවත් කිරීමට එරට අගමැති පියවර ගත්තා. වාචික ප්‍රකාශයක් හේතුවෙන් ඇමතිවරයකු ඉවත් කිරීම නරක පූර්වාදර්ශයක් විය හැකි බව ජපානයේ ඇතැම් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ප්‍රකාශ කර තිබෙනවා.



## විශ්‍රාම වයස ඉහළට

විශ්‍රාම යන වයස අවුරුදු 70 දක්වා ඉහළ දැමීමට ඩෙන්මාර්කය තීරණය කළා. 2040 වසර වන විට එය ක්‍රියාත්මක කිරීමයි එරට සැලසුම. මේ නීතිය සම්මත කිරීමෙන් පසු යුරෝපයේ ඉහළ ම විශ්‍රාම යන වයස සහිත පුද්ගලයන් සිටින රට වන්නේ ඩෙන්මාර්කය. දැනට ඩෙන්මාර්කයේ විශ්‍රාම යාමේ වයස අවුරුදු 67 වන අතර 2030 වසරේදී එය 68 දක්වාත් 2035 වසරේදී 69 දක්වාත් එය වැඩි කෙරෙනු ඇති. මේ යෝජනාවට පක්ෂ ව ඡන්ද 81ක් හිමි වූ අතර විපක්ෂ ව ඡන්ද 21ක් ලැබී තිබෙනවා. වෘත්තීය සමිති මේ තීරණයට විරෝධය දක්වන්නේ ඉහළ විශ්‍රාම යන වයසක් හඳුන්වා දීමෙන් ජනතාවට ගෞරවනීය ජ්‍යෙෂ්ඨ ජීවිතයකට ඇති අයිතිය අහිමි කරන බව පවසමින්.




## බුකර් දිනූ කන්නඩ ලේඛිකාව

ඉන්දීය ලේඛිකාවක, නීතිඥවරියක සහ සමාජ ක්‍රියාකාරිනියක වන Banu Mushtaq ඇගේ කෙටිකතා සංග්‍රහය වන Heart Lamp සඳහා ජාත්‍යන්තර බුකර් සම්මානය ලබාගෙන එය ලබා ගත් පළමු කන්නඩ ලේඛිකාව ලෙස ඉතිහාසයට එක්වුණා. විනිශ්චය මණ්ඩලය සඳහන් කළේ ඇගේ කෙටිකතාවල චරිත පැවැත්මේ සහ ඔරොත්තු දීමේ හැකියාව විශ්මය තැනක පවතින ලෙස නිර්මාණය කර ඇති බව. 1990 වසරේ සිට 2023 වසර දක්වා ඇය රචනා කළ කෙටිකතා 12ක් මේ කෙටිකතා සංග්‍රහයට ඇතුළත්. දකුණු ඉන්දියාවේ ජීවත් වන මුස්ලිම් කාන්තාවන්ගේ දුෂ්කරතා ඉන් නිරූපණය වෙනවා. ස්වයං දැනුවත්භාවය හේතුවෙන් සියුම් චරිත ගොඩනැගීමට ඇයට හැකි වී ඇති බව විචාරකයන් සඳහන් කළා.

විශ්‍රාම යන වයස අවුරුදු 70 දක්වා ඉහළ දැමීමට ඩෙන්මාර්කය තීරණය කළා. 2040 වසර වන විට එය ක්‍රියාත්මක කිරීමයි එරට සැලසුම. මේ නීතිය සම්මත කිරීමෙන් පසු යුරෝපයේ ඉහළ ම විශ්‍රාම යන වයස සහිත පුද්ගලයන් සිටින රට වන්නේ ඩෙන්මාර්කය. දැනට ඩෙන්මාර්කයේ විශ්‍රාම යාමේ වයස අවුරුදු 67 වන අතර 2030 වසරේදී එය 68 දක්වාත් 2035 වසරේදී 69 දක්වාත් එය වැඩි කෙරෙනු ඇති. මේ යෝජනාවට පක්ෂ ව ඡන්ද 81ක් හිමි වූ අතර විපක්ෂ ව ඡන්ද 21ක් ලැබී තිබෙනවා.



## අලුත්වන හැරී පොටර්

J.K rowling කතා මාලාවක් ඇසුරින් නිර්මාණය වූ හැරී පොටර් (Harry Potter) සිනමා මාලාව මේ වන විට රූපවාහිනි කතා මාලාවක් ලෙස ඉදිරිපත් කිරීමට පියවර ගෙන ඇති බව HBO ආයතනය නිවේදනය කර තිබෙනවා. Dominic Mclaughlin, Arabella Stanton, Alastair Stout යන තිදෙනා පිළිවෙළින් Harry potter, Hermione සහ Ron Weasley ලෙස එහි රඟපානවා. ඔවුන් තුන්දෙනා චරිතවලට තෝරාගෙන තිබෙන්නේ අයදුම්පත්‍ර 30000කට වැඩි සංඛ්‍යාවකින්. බ්‍රිතාන්‍යයේ වෝර්නස් බ්‍රදර්ස්හි එහි රූගත කිරීම් සිදු කෙරෙනවා. Max නාලිකාව ඔස්සේ 2026 වසරේදී එය විකාශය කිරීමයි සැලැස්ම.



## පැන්ඩා පැටවුන්ට නම් තැබීම

Hong kong ocean park උද්‍යානයේ උපත ලැබූ පැන්ඩා පැටවුන් දෙදෙනාට නම් තබා තිබෙනවා. ඒ, ගැහැනු පැටවාට ජියා ජියා (jia jia) සහ පිරිමි පැටවාට ඩී ඩී (de de) යනුවෙන්. මේ සතුන් දෙදෙනාට නම් තැබීමට 35000ක පමණ නම් ලැබී තිබුණා. තරගයක් පවත්වා මේ නම් තෝරාගෙන ඇති බවයි මාධ්‍ය වාර්තා කළේ. ජියා ජියා යනු සහයෝගයේ පණිවිඩය වන අතර ඩී ඩී නමෙහි චීන තේරුම වන්නේ සෑම පාර්ශ්වයකින් ම සාර්ථකයි යන්න. මේ පැටවුන් දෙදෙනා බිහි කළ සතුන් ගෙනැවිත් තිබෙන්නේ චීනයේ සිට.

# පොලිමර් මෙල්ලය



බිනූ දිලාරා ගමගේ

**ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවර පැවති (1972) මානව පරිසරය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේදී සෑම වසරක ම ජුනි මස 05 දින ජගත් පරිසර දිනය ලෙස ප්‍රකාශයට පත් වීමත් සමග විශේෂිත තේමා යටතේ එම දිනය සැමරීමට ලෝක ප්‍රජාව ම එක් ව සිටිනවා. දිනෙන් දින උග්‍ර වන පාරිසරික ගැටලු හමුවේ ඒ පිළිබඳ ලෝකවාසී ජනතාව දැනුවත් කිරීමත් පරිසරය ආරක්ෂා කර ගැනීමත් අරමුණු කර ගනිමින් සැමරෙන එම දිනයේ මෙවර (2025) තේමාව ලෙස එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විසින් නම් කරනු ලැබ ඇත්තේ 'Ending Plastic Pollution' යන්න. ගෝලීය වශයෙන් ප්ලාස්ටික් භාවිතය නිසා සිදු වන දූෂණයට අවසන් විසඳුමක් අපේක්ෂාවෙන් ඊට සාමුහික ක්‍රියාමාර්ග වෙත යොමුවීමයි මෙහි අරමුණ. ඒ පිළිබඳ අවධානය යොමු කරමින් මෙවර 'දෙසතිය' කවරයේ කතාබහ සිදුවනවා.**

පරිසරය මත යැපීමකින් තොර ව මිනිසාට තමන්ගේ පැවැත්ම තහවුරු කර ගැනීමට හැකියාවක් නැහැ. වර්ෂ 1700කට පෙරාතුව ජීවත් වූ ආදි මානවයාගේ සිට මිනිසා තම සංස්කෘතික කාරණා පරිසරය සමග බද්ධ ව ගොඩ නඟා ගත් ආකාරය ඒ අනුව දකින්නට පුළුවන්. තමන්ට වුවමනා ආහාර පාන, වාසස්ථාන, ආරක්ෂාව සපයා ගැනීම සඳහා ඔවුන්ට පරිසරය මත යැපීමට සිදු වුණා. දඩයම් කර සතුන් අල්වා ගැනීමට පරිසරයෙන් ම සපයාගත් අමුද්‍රව්‍ය ආශ්‍රයෙන් ප්‍රාථමික තලයේ ආයුධ සහ මෙවලම් සකසා ගැනීමට සිදු වුණා. වටහා ගැනීමට නොහැකි වූ තමන්ට බිය එළවනසුලු පාරිසරික තත්ත්ව හා සිද්ධි හමුවේ ඒවාට දේවත්වයක් ආරෝපණය කිරීමට පෙළඹුණා. ඒවා පිළිබඳ විවිධ විශ්වාස, මිත්‍යා මත ගොඩ නඟා ගනිමින් අර්ථකථනය කර ගැනීමට උත්සාහ කළා. තමන්ට පරිසරයෙන් සිදුවන උපද්‍රවවලින් බේරීම සඳහා විවිධ චාරිත්‍ර ක්‍රම, අභිචාර විධි අනුගමනය කළා. මෙලෙසින් මිනිසා සතු ව පැවතුණු පරිසරය පිළිබඳ වූ කුතුහලය කාලයක් යත් ම පරිසරය තමන්ගේ වුවමනා සඳහා පාලනය, නතු කර ගැනීම දක්වා වර්ධනය වුණා. පුනරුදය සමයේදී ඉස්මතු වූ අදහස් අතර මානවයා සහ උත්තරීතරභාවය ස්වභාවධර්මය අභිභවා ගමන් කිරීමටත් මිනිසා ස්වභාවධර්මයේ පාලකයා බවට සිතීමටත් පෙළඹවූවා.

කාර්මික විප්ලවයත් සමග මේ තත්ත්වය තව තවත් වර්ධනය වීම දකින්නට ලැබෙනවා. පරිසරයත් සමග සහජීවනයෙන් ක්‍රියා කරනවා වෙනුවට තාක්ෂණය, කාර්මාන්තශාලා, යන්ත්‍රසූත්‍ර, විද්‍යාත්මක සොයා ගැනීම් මත පදනම් වූ නව යුගයක් වෙත මිනිසා ප්‍රමුඛත්වය දුන්නා. කර්මාන්ත ආශ්‍රිත ව සිදු වූ මානව ක්‍රියාකාරකම් පරිසර පද්ධතිවලට අහිතකර ලෙස බලපෑවා. එහි අහිතකර බලපෑම් නැවතත් මිනිසාට අත්විඳීමට සිදු වීමත් සමග 20 වැනි සියවස වන විට පරිසරය සංරක්ෂණය කිරීමේ වැදගත්කම පිළිබඳ ජනතාවගේ සහ ජගත් සංවිධානවල අවධානය යොමු වීමේ ප්‍රවණතා දකින්නට වුණා. මිනිසුන්ගේ නිරෝගිකම රැක ගැනීමට නම් පාරිසරික යහපැවැත්ම තහවුරු විය යුතු බව ඒ වන විට ජනතාවට අවබෝධ වී තිබුණා. පශ්චාත් දෙවැනි ලෝක යුද සමයේදී ප්‍රධාන වශයෙන් න්‍යෂ්ටික පිපුරුම් යනාදිය නිසා පරිසරයට සිදු වූ හානිය පිළිබඳ ජනතාවගේ සැලකිලිමත් වීම තවදුරටත් වර්ධනය වුණා. Rachel Carsonගේ 'Silent Spring (1962)' වැනි කෘතිවලින් අවධාරණය කරන ලද කෘමිනාශක හා පළිබෝධනාශක භාවිතයේ අහිතකර බලපෑම්, පාරිසරික කාරණා සම්බන්ධයෙන් ජනතා දැනුවත්භාවය වැඩිදියුණු කිරීමටත් ජන පිබිදීම් ඇති කිරීමට හේතු වුණා. එමෙන් ම දකුණු කැලිෆෝනියාවට ආසන්නයේ පිහිටි Santa Barbara මුහුදු තීරයේ ඒ වන විට සිදු වෙමින් පැවති විශාලතම තෙල් කාන්දුවත් සමග පාරිසරික පද්ධතිවලට සිදුවන හානියට එරෙහි ව ජනතාවගේ නැගිටීම වඩාත් උද්වේගකර ස්වභාවයක් ගත්තා.

## ගෝලීය ප්‍රවේශය

ඒ අනුව 1972 වසරේදී ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවර පවත්වන ලද මානව පරිසරය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව ගෝලීය පාරිසරික කාරණා

සම්බන්ධයෙන් පවත්වන ලද ලොව පළමු සමුළුව. මේ සමුළුවේදී එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන (United Nations Environment Programme - UNEP) හඳුන්වා දුන් අතර එමඟින් ගෝලීය පාරිසරික ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය සිදු වුණා. එමෙන් ම දේශගුණ තත්ත්ව වෙනස් වීම් (Climate Changes) පිළිබඳ විද්‍යාත්මක තක්සේරු කිරීම් ලෝකයට අනාවරණය කරන The Intergovernmental Panel on Climate Change (IPCC) සංවිධානය 1988 වසරේදීත් Convention on Biological Diversity සහ UN Framework Convention on Climate Change (UNFCC) ඒකාබද්ධ කොට 1992 වසරේදීත් (Rio Summit 1992) පිහිටුවූවා.

වර්තමානයේදී පවා පාරිසරික ගැටලු පිළිබඳ කතිකාවත් නිර්මාණය කරන ලොව විශාලතම ගෝලීය වේදිකා අතර ජගත් පරිසර දිනය (World Environment Day - WED) සඳහා හිමි වන්නේ සුවිශේෂ ස්ථානයක්. පාරිසරික ගැටලු පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට, පරිසරය සංරක්ෂණය සඳහා ගෝලීය, කලාපීය සහ ජාතික වශයෙන් ගත හැකි ක්‍රියාමාර්ග සඳහා ජනතාව දිරි ගැන්වීමට පරිසරය දිනය වැදගත්. වර්තමානයේදී මේ කතිකාවත් තත්කාලීන අවශ්‍යතාව පිළිබඳ සැලකිලිමත් වෙමින් ප්ලාස්ටික් නිසා සිදුවන දූෂණය (Plastic Pollution), වන වගාව දිරිමත් කිරීම (Restoration of ecosystem) සහ දේශගුණ වෙනස්වීම් (Climate Changes) සඳහා අනුගත වීම කෙරෙහි අවධානය යොමු කරමින් සිටිනවා.

1970 - 1980 දශකවලදී පළමු වරට ජාත්‍යන්තර අවධානයක් සහිත ව ජගත් පරිසර දින (WED) වේදිකාව මත ගොඩ නැගුණු සාකච්ඡාවලදී ප්‍රධාන වශයෙන් පරිසර දූෂණය පාලනය, වනජීවීන් සංරක්ෂණය සහ සෞඛ්‍ය සුරක්ෂිතභාවය යනාදිය තේමා කර ගනිමින් ඒ පිළිබඳ ජනතාවට මූලික දැනුම ලබා දීම සඳහා මඟ පෙන්වා තිබෙනවා. 1990 දශකය පමණ වනවිට පරිසරය පිළිබඳ කතිකාව තවදුරටත් සංවිධානගත වෙමින් දේශගුණ වෙනස් වීම් (Climate Changes), කාන්තාරකරණය (Desertification) වැනි මාතෘකා වෙත විතැන් වීම සහ ජාතික මට්ටමින් පරිසර දිනයට සමගාමී ව විවිධ උත්සව සංවිධානය කෙරුණා. 21 වැනි සියවසේ පළමු වැනි දශකය වන විට ඩිජිටල්කරණය වීම නිසා පරිසර දිනය සඳහා ගෝලීය පදනමකින් ජනතාවගේ සහභාගිත්වය අභිප්‍රේරණය කිරීම සිදු වුණා. එපමණක් නොව තිරසර සංවර්ධනය සඳහා ද වැඩි නැඹුරුවක් පෙන්වූවා. 2010 දශකය වැදගත් වන්නේ සමාජ මාධ්‍ය වේදිකා, පාරිසරික ගැටලු පිළිබඳ ජනතාව සවිඥානික කරවන ප්‍රධාන මෙවලම බවට පත්වීම නිසා. 2020 දශකය ආරම්භයේ සිට මෙතෙක් පරිසර දින තේමා ලෙසින් සාකච්ඡා වී තිබෙන්නේ ගෝලීය වශයෙන් කඩිනමින් පියවර ගැනීමට අවශ්‍ය පාරිසරික අර්බුද පිළිබඳ ව. එමෙන් ම සුපුරුදු පාරිසරික ගැටලු පිළිබඳ ජනතාව දැනුවත් කිරීමෙන් ඔබ්බට යමින් පාරිසරික ගැටලු අවම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති වෙනස් කිරීමට උත්ප්‍රේරක සැපයීම ද පරිසර දිනයේ වත්මන් කාර්යභාරයක් වී තිබෙනවා.

2010 දශකය වැදගත් වන්නේ සමාජ මාධ්‍ය වේදිකා, පාරිසරික ගැටලු පිළිබඳ ජනතාව සවිඥානික කරවන ප්‍රධාන මෙවලම බවට පත්වීම නිසා. 2020 දශකය ආරම්භයේ සිට මෙතෙක් පරිසර දින තේමා ලෙසින් සාකච්ඡා වී තිබෙන්නේ ගෝලීය වශයෙන් කඩිනමින් පියවර ගැනීමට අවශ්‍ය පාරිසරික අර්බුද පිළිබඳ ව. එමෙන් ම සුපුරුදු පාරිසරික ගැටලු පිළිබඳ ජනතාව දැනුවත් කිරීමෙන් ඔබ්බට යමින් පාරිසරික ගැටලු අවම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති වෙනස් කිරීමට උත්ප්‍රේරක සැපයීම ද පරිසර දිනයේ වත්මන් කාර්යභාරයක් වී තිබෙනවා.




පරිසර පද්ධතිවලට, වනසතුන්ට හා මානව සෞඛ්‍යයට හානි වන අයුරින් ප්ලාස්ටික් ද්‍රව්‍ය පරිසරයේ එක්රැස් වීම ප්ලාස්ටික් දූෂණය යනුවෙන් හඳුනාගත හැකි බව 'ජාත්‍යන්තර ස්වාභාවික සම්පත් සංරක්ෂණ සංගමය' (International Union for Conservation of Nature - IUCN) පවසනවා. පරිසරයේ ශීඝ්‍රයෙන් ඉහළ යන ප්ලාස්ටික් භාවිතය පාරිසරික, සමාජීය, ආර්ථික සහ සෞඛ්‍යමය මාන කෙරෙහි අහිතකර ලෙස බලපාන බරපතළ ගෝලීය පාරිසරික ගැටලුවක්.

## ප්ලාස්ටික් ව්‍යසනයේ ඇතුළු පැත්ත

මිනිස් පරිභෝජන රටාවේ ප්ලාස්ටික් භාවිතය අත්‍යවශ්‍ය අංගයක් බවට පත් ව තිබෙන්නා සේ ම පසුගිය දශක කිහිපයේ ප්ලාස්ටික් නිෂ්පාදනය ශීඝ්‍ර ලෙස වර්ධනය වී තිබෙනවා. එය ගෝලීය වශයෙන් දැනට වසරකට ටොන් මිලියන 430ක් පමණ වන බව එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනෙහි (United Nations Environment Programme - UNEP) සඳහන්. වසර 2030 වන විට මේ අගය දෙගුණ වනු ඇතැයි UNEP, ආර්ථික හා සමූහ සංවර්ධන සංවිධානය (Organization for Economic Cooperation and Development - OECD) අතුළු සංවිධාන ගණනාවක් අපේක්ෂා කරනවා. 2024 වසරේදී පමණක් ලොව මානව අවශ්‍යතා සඳහා ප්ලාස්ටික් ටොන් මිලියන 500කට අධික ප්‍රමාණයක් පරිභෝජනය කර තිබෙන බව පරිසර අමාත්‍යාංශය අනාවරණය කරන කාරණාවක්. වත්මන් ප්ලාස්ටික් පරිභෝජනයෙන් ටොන් මිලියන 400ක් පමණ අපද්‍රව්‍ය ලෙස පරිසරයට නැවතත්

බැහැර වන්නා සේ ම එය 2060 වසර වන විට ටොන් බිලියන 1.2ක් පමණ වනු ඇති බවටයි අනුමානය. එයින් ද 2/3ක ප්‍රමාණයක් එක් වරක් පමණක් භාවිත කර ඉවත දමන ප්ලාස්ටික් නිෂ්පාදන. මෙසේ ඉවත් කරන ප්ලාස්ටික්වලින් 10%ටත් අඩු ප්‍රමාණයක් ප්‍රතිචක්‍රීයකරණය සඳහා යොමුවන අතර 12%ක පමණ ප්‍රමාණයක් විවිධ හේතු මත ගිනි තැබීමත් ඉතිරිය ගොඩකිරීම්වලට බැහැර කිරීම සහ සාගර ඇතුළු ජල මාර්ගවලට මුදා හැරීමත් සිදු කරනවා.

සෑම වසරක ම ප්ලාස්ටික් මෙට්‍රික් ටොන් මිලියන 11ක ප්‍රමාණයක් සාගරයට එකතු වන බව ජෝර්ජියා විශ්වවිද්‍යාලයේ ජාතික පාරිසරික විශ්ලේෂණ හා සංශ්ලේෂණ මධ්‍යස්ථානය හා මුහුදු අධ්‍යාපන සංගමය (2015) අනාවරණය කර තිබෙනවා. 2040 වන විට සාගර වෙත ප්ලාස්ටික් බැහැර කිරීම මෙට්‍රික් ටොන් මිලියන 29ක් දක්වා තුන් ගුණයකින් ඉහළ යාමට හැකි බවයි The Pew Charitable Trustහි මතය. සමුද්‍ර අපද්‍රව්‍ය අතර වඩාත් විශාලතම, වඩාත් හානිකර සහ දිගු කාලයක් නොනැසී පවතින්නක් වන්නේ ප්ලාස්ටික්. එය අවම වශයෙන් සමස්ත සාගර අපද්‍රව්‍යවලින් 85%ක් පමණ වන බවට ගණනය වී තිබෙනවා. මෙවැනි අක්‍රමවත් ප්ලාස්ටික් අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් මේ වන විට ප්ලාස්ටික් හා ක්ෂුද්‍ර ප්ලාස්ටික් කැබලි ට්‍රිලියන 50 - 75ක් පමණ සාගරයේ එක්රැස් ව තිබෙනවා. ඒවා ආහාර, ජලය සහ වාතය ඔස්සේ ශරීරගත වන්නේ සෞඛ්‍ය ගැටලු රැසකට මුල පුරමින්. ඇස්තමේන්තු වී තිබෙන ආකාරයට පෘථිවියේ සෑම පුද්ගලයකු ම වසරකට ප්ලාස්ටික් අංශු 50,000කට වඩා පරිභෝජනය කරනවා.

ප්ලාස්ටික් නිසා සිදුවන පරිසර දූෂණයට විසඳුමක් සෙවීම සඳහා 2022 වසරේ කෙන්යාවේ නයිරෝබි නුවර පවත්වන ලද එක්සත් ජාතීන්ගේ පරිසර සමුළුවේ පස් වැනි සැසිවාරයක් (United Nations Environment Assembly - UNEA 5.2) පැවැත්වුණා. එහිදී ප්ලාස්ටික් නිෂ්පාදනය, ප්ලාස්ටික් බැහැර කිරීම, ප්‍රතිචක්‍රීයකරණය දක්වා වූ ප්ලාස්ටික් භාවිතයේ සම්පූර්ණ ජීවන චක්‍රය ම ආමන්ත්‍රණය වන පරිදි පුළුල් ප්‍රවේශයක් මත පදනම් වූ ගෝලීය ප්ලාස්ටික් දූෂණ ගිවිසුමක් (Global Plastic Pollution Treaty) සංවර්ධනය කිරීම සඳහා නව යෝජනාවක් ඉදිරිපත් කෙරුණා. ඊට අදාළ ව සාමාජික රටවල් නියෝජනය වන පරිදි අන්තර් රාජ්‍ය සාකච්ඡා කමිටුවක් (Intergovernmental Negotiating Committee) පිහිටුවීමත් සිදු වුණා. එහිදී 2024 වසර අවසන් වන විට ප්ලාස්ටික් පිළිබඳ ගෝලීය නීත්‍යානුකූල ගිවිසුමක් (legally-binding international agreement on plastic) කෙටුම්පත් කිරීමේ අරමුණින් 2022 වසරේදී උරුගුවේදී පළමුවන සැසියත් 2022 මැයි මාසයේ ප්‍රංශයේදී දෙවැනි සැසියත් 2023 වසරේ නයිරෝබි නුවරදී තුන්වන සැසියත් 2024 අප්‍රේල් මාසයේ කැනඩාවේදී සිව් වැනි සැසියත් 2024 වසරේ නොවැම්බර් මාසයේ දකුණු කොරියානු ජනපදයේදී පස් වැනි සැසියත් පැවැත්වුණා. එහි ප්‍රතිඵලය වූයේ 'ප්ලාස්ටික් දූෂණය අවසන් කරන්නඃ නීත්‍යානුකූල ව බැඳී පවත්නා ජාත්‍යන්තර මෙවලමක්' කරා (Ending Plastic Pollution: Towards an International Legally Binding Instrument) ගමන් කිරීම. තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිල වෙබ් අඩවිය සඳහන් කරන්නේ මෙවර පරිසර දින තේමාව වන 'ප්ලාස්ටික් නිසා සිදුවන දූෂණය අවසන් කිරීම' නිර්මාණය කෙරුණේ මේ ගෝලීය ප්ලාස්ටික් දූෂණ ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ අරමුණින් වන බව.

අප පරිභෝජනය කරන බොහෝ භාණ්ඩවල ක්ෂුද්‍ර ප්ලාස්ටික් අන්තර්ගත බව සඳහන් කරන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජගත් ප්‍රේමචන්ද්‍ර එහි අහිතකර බලපෑම පෙන්වා දෙන්නේ මෙලෙස. ඔහු; "අප අඳින ඇඳුම්වල කපු අන්තර්ගත වීම 35%ක් වන විට පොලියෙස්ටර් 65%ක් අන්තර්ගත වනවා. එම නිසා ප්ලාස්ටික් නිසි පරිදි කළමනාකරණය නොකළහොත් ඉන් පරිසරයට ඇති වන අහිතකර බලපෑම අතිමහත්. ප්‍රමාණාත්මක වශයෙන් ගත්විට 5mm - 1mm අතර පවතින ප්ලාස්ටික් ක්ෂුද්‍ර ප්ලාස්ටික් (Micro Plastic) ලෙස හඳුනා ගන්නවා. ප්ලාස්ටික්වලින් සකසන ලද භාණ්ඩ පරිහරණයේදීත් ඇතැම් භාණ්ඩ නිෂ්පාදනයේදී හිතාමතාත් නිසි කළමනාකරණයක් නොමැති ව ප්ලාස්ටික් බැහැර කිරීමේදීත් මේ ක්ෂුද්‍ර ප්ලාස්ටික් පරිසරයට එකතු වනවා. ඇමරිකාවේ ප්‍රින්ස් විශ්වවිද්‍යාලය පර්යේෂණයකින්

සෑම වසරක ම ප්ලාස්ටික් මෙට්‍රික් ටොන් මිලියන 11ක ප්‍රමාණයක් සාගරයට එකතු වන බව ජෝර්ජියා විශ්වවිද්‍යාලයේ ජාතික පාරිසරික විශ්ලේෂණ හා සංශ්ලේෂණ මධ්‍යස්ථානය හා මුහුදු අධ්‍යාපන සංගමය (2015) අනාවරණය කර තිබෙනවා. 2040 වන විට සාගර වෙත ප්ලාස්ටික් බැහැර කිරීම මෙට්‍රික් ටොන් මිලියන 29ක් දක්වා තුන් ගුණයකින් ඉහළ යාමට හැකි බවයි The Pew Charitable Trustys මතය. සමුද්‍ර අපද්‍රව්‍ය අතර වඩාත් විශාලතම, වඩාත් හානිකර සහ දිගු කාලයක් නොනැසී පවතින්නක් වන්නේ ප්ලාස්ටික්.



අනාවරණය කර තිබෙනවා සාගරයේ ඇති ක්ෂුද්‍ර ප්ලාස්ටික් මෙට්‍රික් ටොන් 100,000ක් පමණ වාර්ෂික ව වාතය සමග මුසු වන බව. එයින් විශාල පරිසර හානියක් සිදු කරනවා. රුහුණු විශ්වවිද්‍යාලය සහ ඇමරිකාවේ North Carolina විශ්වවිද්‍යාලය එක් ව හික්කඩුව ජාතික වනෝද්‍යානය වැනි සමුද්‍රාශ්‍රිත ජාතික වනෝද්‍යාන තෝරාගෙන 2021 වසරේදී සිදු කළ පර්යේෂණයකින් වෙරළබඩ රොන්මඩවල 1m$^2$ ක්ෂුද්‍ර ප්ලාස්ටික් අංශු 111ක්, ජලයේ 1m$^3$කට ක්ෂුද්‍ර ප්ලාස්ටික් 0.515ක් අන්තර්ගත ව තිබෙන බව හඳුනා ගැනුණා. මේ පර්යේෂණයට අනුව බූන්දල ජාතික වනෝද්‍යානයේ වෙරළබඩ රොන්මඩ 1m$^2$කට ක්ෂුද්‍ර ප්ලාස්ටික් අංශු 102ක් වනවා. එහි ජලය 1m$^3$කට 0.176ක් වන බවත් සොයා ගැනුණා. 2022 වසරේදී

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිදු කරන ලද පර්යේෂණයකින් නිවෙස් තුළ 1m³කට ක්ෂුද්‍ර ප්ලාස්ටික් අංශු 0.13 - 0.93ක් දක්වාත් නිවසින් පිටත පරිසරයේ 1m³කට ක්ෂුද්‍ර ප්ලාස්ටික් අංශු 0.23ක් පවතින බවත් සොයාගෙන තිබෙනවා. 2022 වසරේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිදු කරන ලද පර්යේෂණයකින් සොයා ගැනුණා ප්ලාස්ටික් බෝතල් ජලය ලීටර එකක ක්ෂුද්‍ර ප්ලාස්ටික් අංශු 3 - 19 ප්‍රමාණයක් පවතින බව.”

ඔහු සඳහන් කරන ආකාරයට ස්වසන පද්ධතිය ඔස්සේත් ආහාර පාන ගැනීමේදීත් සම හරහාත් ක්ෂුද්‍ර ප්ලාස්ටික් ශරීරගත විය හැකියි. ඇමරිකානු පර්යේෂණයකින් කුඩා පිරිමි දරුවකුට දිනකට ක්ෂුද්‍ර ප්ලාස්ටික් අංශු 110ක්, වැඩිහිටියකුට දිනකට ක්ෂුද්‍ර ප්ලාස්ටික් අංශු 170ක්, කුඩා ගැහැනු දරුවකුට දිනකට ක්ෂුද්‍ර ප්ලාස්ටික් අංශු 97ක්, වැඩුණු කාන්තාවකට දිනකට ක්ෂුද්‍ර ප්ලාස්ටික් අංශු 132ක් ආශ්වාසයේදී ශරීරගත වන බව සොයාගෙන තිබෙනවා.

පරිසර නියෝජ්‍ය අමාත්‍ය ඇන්ටන් ජයකොඩි පවසන්නේ ලෝක පරිසර දිනය සැමරීමේදී පරිසරයට සිදුවන විනාශය සහ අගතීන් පිළිබඳ සැලකිලිමත් වෙමින් ඊට අදාළ ව එක් එක් වසර සඳහා විවිධ තේමා හඳුන්වා දීම සිදු වන බව. 'ප්ලාස්ටික් නිසා සිදුවන දූෂණය අවසන් කිරීම' වැනි තේමාවක් පරිසර දිනය සඳහා ගෙන ඒමට ප්‍රධාන හේතු ගණනාවක් තිබෙනවා. මේ වන විට ප්ලාස්ටික් භාවිතය සහ ප්ලාස්ටික් නිෂ්පාදනය ශීඝ්‍ර ලෙස ඉහළ යමින් පවතිනවා. ප්ලාස්ටික් දූෂණය පොළොව මතුපිට ප්ලාස්ටික්, භූගත ප්ලාස්ටික් සහ සාගර ප්ලාස්ටික් නිසා සිදුවන අතර වැඩි ම තර්ජනයක් සිදු වන්නේ පරිසරයට එකතු වන ක්ෂුද්‍ර ප්ලාස්ටික් (Micro Plastic) නිසා. මේ ක්ෂුද්‍ර ප්ලාස්ටික් මේ වන විටත් ජීවීන්ගේ ආහාර දාම ඔස්සේ සෞඛ්‍යයට අහිතකර ලෙස ශරීරගතවයි තිබෙන්නේ. ප්ලාස්ටික් ජල මූලාශ්‍රවලට එකතු වීමේ ප්‍රතිඵලයක් ලෙස ජලජ ජීවීන්ගේ පැවැත්ම සහ ව්‍යාප්තිය සීමා වෙමින් පවතිනවා. මෙවැනි තත්ත්වයකදී පවා ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් 260,000ක් පමණ වසරකට නිෂ්පාදනය වනවා. ඒ අනුව දළ වශයෙන් සලකා බැලීමේදී ශ්‍රී ලංකාවේ එක් පුද්ගලයකු 12Kgක ප්ලාස්ටික් භාවිතයක් වසරකට සිදු කරන බව ඔහු පවසනවා.

ජාතික විගණන කාර්යාලයේ පරිසර විගණන අංශයේ වාර්තාවලට (2020) අනුව 2012 වසරේ සිට 2018 වසර දක්වා වූ කාලයේදී අමුද්‍රව්‍ය, නිමි භාණ්ඩ, ගෘහ භාණ්ඩ සහ සෙල්ලම් බඩු ලෙසින් මෙරටට ආනයනය කරන ලද ප්ලාස්ටික් ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 3353.9ක්. එයින් 30%ක් පමණ ප්‍රතිචක්‍රීයකරණය කෙරුණ ද 70%ක් පමණ වූ ප්ලාස්ටික් සෘජු හෝ වක්‍රාකාරයෙන් පරිසරයට බැහැර කෙරෙනවා. මේ නිසා පාරිසරික ගැටලු ගණනාවකට මුහුණදීමටයි වර්තමානයේදී ජනතාවට සිදු ව තිබෙන්නේ.



**ප්ලාස්ටික් නිසා සිදුවන පරිසර දූෂණයට විසඳුමක් සෙවීම සඳහා 2022 වසරේ කෙන්යාවේ නයිරෝබි නුවර පවත්වන ලද එක්සත් ජාතීන්ගේ පරිසර සමුළුවේ පස් වැනි සැසිවාරයක් (United Nations Environment Assembly - UNEA 5.2) පැවැත්වුණා. එහිදී ප්ලාස්ටික් නිෂ්පාදනය, ප්ලාස්ටික් බැහැර කිරීම, ප්‍රතිචක්‍රීයකරණය දක්වා වූ ප්ලාස්ටික් භාවිතයේ සම්පූර්ණ ජීවන චක්‍රය ම ආමන්ත්‍රණය වන පරිදි පුළුල් ප්‍රවේශයක් මත පදනම් වූ ගෝලීය ප්ලාස්ටික් දූෂණ ගිවිසුමක් (Global Plastic Pollution Treaty) සංවර්ධනය කිරීම සඳහා නව යෝජනාවක් ඉදිරිපත් කෙරුණා.**

## ජගත් පරිසර දින ජාතික සැමරුම

පරිසර අමාත්‍ය වෛද්‍ය දම්මික පටබැඳි පවසන පරිදි මෙවර ජගත් පරිසර දින තේමාව වූ ප්ලාස්ටික් නිසා සිදුවන දූෂණය අවසන් කිරීම පෙරදැරි ව ජාතික වැඩසටහන ක්‍රියාත්මක වූයේ 'දළුලන්න ඉඩ දෙන්න' යන තේමාව පදනම් කරගෙන. පරිසර පුනර්ජීවනයක් ඇති කිරීමට අවශ්‍ය කරන අවකාශය ලබා ගැනීම අරමුණු කරගත් මේ ජාතික වැඩසටහන යටතේ මැයි මස 30 දින සිට ජූනි මස 05 දින දක්වා 'ජාතික පරිසර සතියක්' ප්‍රකාශයට පත් කෙරුණා. එම පරිසර සතියේදී අවධානය යොමු කෙරුණේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය, වායු දූෂණයෙන් සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම, පරිසර පවිත්‍රතාව, ජෛව විවිධත්වය සංවර්ධනය, ජලය හා ජල මූලාශ්‍ර සංරක්ෂණය, වෙරළ කලාප පවිත්‍රකරණය සහ රුක්රෝපණය වැනි අංශ පිළිබඳ ව. මෙවර ජගත් පරිසර දිනය සැමරීමේ ජාතික වැඩසටහන කෑගලු දිස්ත්‍රික්කය මූලික කරගෙන සැමරුණා. එයට සමගාමී ව රජයේ පරිසර ප්‍රකාශනය වන 'කෑගලු ප්‍රකාශනය' (Kegalle Declaration) එළි දැක්වීමත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගාල්ල දිස්ත්‍රික්කයේ කොට්ටව, කෑගල්ල දිස්ත්‍රික්කයේ උඩුලියද්ද, තුල්හිරිය, සහ වේරහැන් කන්ද, මොණරාගල දිස්ත්‍රික්කයේ නිල්ගල වනය රක්ෂිත වනාන්තර බවට පත් කිරීමත් ඉදිරියේදී සිදු

වනු ඇති. මෙරටට පමණක් ආවේණික මත්ස්‍යය විශේෂයක් වන කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලපිටමඩ ප්‍රදේශයේ පමණක් දකින්නට ලැබෙන බන්දුලපෙතියා සංරක්ෂණය සඳහා එම ප්‍රදේශය වනජීවී අභය භූමියක් බවට පත් කිරීමත් ඉදිරි අරමුණක්. කෑගල්ල නගර ශාලා පරිශ්‍රයේ ජුනි 02 දින සිට 05 දින දක්වා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රදර්ශනයක් සංවිධානය කළේ මීට සමගාමී ව. මේ සියලු වැඩසටහන් පරිසර දිනයට සමගාමී ව සංවිධානය වන්නේ කාබන් ශූන්‍ය (Zero Carbon) ප්‍රතිපත්තිය යටතේ වීමත් විශේෂිත කරුණක්.

වර්තමාන රජයේ Clean Sri Lanka වැඩසටහනේ පරිසර කුලුන යටතේ පරිසරයට ආදරය කරන සමාජයක් බිහි කිරීමේ අපේක්ෂාවෙන් පරිසරය සුරැකීම හා තිරසාරභාවය පවත්වා ගැනීමට විවිධ ක්‍රියාකාරකම් සඳහා ජනතාව දායක කර ගැනුණා. එහි එක් පියවරක් ලෙස ලෝක පරිසර දිනය තේමාව හා එක්වෙමින් පරිසරය හා මානව සෞඛ්‍යයට දැඩි තර්ජනයක් වන ප්ලාස්ටික් භාවිතය සහ අනිසි ලෙස අපද්‍රව්‍ය බැහැර කිරීම පිළිබඳ අවධානය යොමු කෙරුණා. මේ අභියෝගයට සාර්ථක ව මුහුණ දීම සඳහා පුද්ගලයන්ගේ ජීවන රටාවේ වෙනසක් ඇති කරමින් ප්ලාස්ටික් භාවිතයේදී ඒ පිළිබඳ ව නැවත සිතීම (Rethink), ප්ලාස්ටික් භාවිතය ප්‍රතික්ෂේප කිරීම (Refuse), ප්ලාස්ටික් භාවිතය අඩු කිරීම (Reduce), නැවත භාවිත කිරීම (Reuse) සහ ප්‍රතිචක්‍රීයකරණය (Recycle) යන සංකල්ප ජනතාවට හඳුන්වා දීමත් සිදු කෙරෙනවා. මේ ආකල්පවලින් ප්ලාස්ටික් හා පොලිතින් නිෂ්පාදකයාගේ සිට ඒවා පරිභරණය කරන අවසාන පාරිභෝගිකයා දක්වා වූ පිරිස් පරිසර හිතකාමී නිෂ්පාදන වෙත නැඹුරු කිරීම හා ඒවා මිලදී ගැනීමට දිරි ගැන්වීම, සියලු පුරවැසියන් තමන් ජීවත් වන පරිසරය ආරක්ෂා කිරීමට පෙළඹවීම් ඇති කිරීමත් අරමුණු වනවා. ඒ අනුව පරිසර අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ රජයේ ආයතනවල මූලිකත්වයෙන් Clean Sri Lanka ලේකම් කාර්යාලය ද සම්බන්ධ කර ගනිමින් රාජ්‍ය ආයතන, පරිසර සංවිධාන, පරිසරවේදීන් ඇතුළු සමස්ත ජනතාවගේ ද සහභාගිත්වය ලබා ගනිමින් මෙවර ජගත් පරිසර දිනය සැමරීම සාධනීය තත්ත්වයක්.

# පරිසර දින සැමරුම
# ඒකාබද්ධ ප්‍රවේශයකින්

'ප්ලාස්ටික් නිසා සිදුවන දූෂණය අවසන් කිරීම' යන මේ වසරේ පරිසර දින තේමාව වඩාත් සුවිශේෂ වනවා. ඒ, ප්ලාස්ටික් දූෂණය අවම කිරීම වැනි තේමාවකින් ඔබ්බට යමින් එය අවසන් කිරීම වෙනුවෙන් ජනතා අවධානය කේන්ද්‍ර කර ගැනීම නිසා. ප්ලාස්ටික් නිසා සිදුවන දූෂණය ඉතා විනාශකාරී තත්ත්වයක්. ප්ලාස්ටික් සාමාන්‍ය භාවිතයක් පැවතීම පරිසරයට අහිතකර කරුණක් නොවෙයි. එහෙත් පරිසරයට දරාගත නොහැකි වන්නේ ප්ලාස්ටික් නිසි කළමනාකරණයක් නොමැති ව මිනිස් භාවිතයට එකතු කර ගැනීමත් සමග.

ප්ලාස්ටික් නිසා සිදුවන දූෂණය අවසන් කිරීමේ ප්‍රධාන ලෝක කතිකාව 2022 වසරේදී සිට ආරම්භ වූවක්. ඒ පිළිබඳ සමුළු කිහිපයක් පවත්වමින් ඊට ගත යුතු ක්‍රියාමාර්ග සාකච්ඡා කෙරුණා. 2024 වසරේ අගෝස්තු මාසයේදී පවත්වන ලද සමුළුවේදී ප්ලාස්ටික් නිසා සිදුවන දූෂණය අවසන් කළ යුතු බවට අවසන් පියවර සකස් කර ගත්තා. ඊට සමාගාමීවයි මෙවර පරිසර දිනය ප්ලාස්ටික් නිසා සිදුවන දූෂණය අවසන් කිරීම තේමා කර ගත්තේ.

2017 වසරට පෙරාතුව මෙරට පරිසර දිනය සැමරීම ජාතික උත්සවයක් වශයෙන් ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ වෙනුවට ලෝක පරිසර දින තේමාව යටතේ සංකේතමය වශයෙන් සැමරීමක් පමණක් සිදු කළේ. 2017 වසරේදී ජනාධිපති ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයකට අනුව පරිසර දිනය සැමරීම සඳහා සියලු අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සම්බන්ධ කර ගැනීමට ඒකාබද්ධ වැඩ පිළිවෙළකට මුලපිරුවා. ඒ අනුව මැයි මස 30 දින සිට ජුනි 05 දින දක්වා වූ කාල සීමාවේ පරිසර දිනය

ලෝක අර්බුදයක් බවට මේ වන විට පත් ව තිබෙන ප්ලාස්ටික් නිසා සිදුවන දූෂණය ශ්‍රී ලංකාවේ ආර්ථිකමය, පාරිසරිකමය, සෞඛ්‍යමය යනාදී වශයෙන් අහිතකර බලපෑම් ඇති කරනවා. ප්ලාස්ටික් මෙතරම් අහිතකර බලපෑමක් ඇති කිරීමට ප්‍රධාන කාරණාවක් වන්නේ ඒවා වියෝජනය වී විනාශ වන්නට අවුරුදු දහස් ගණනක් ගත වීම. එම නිසා ඒවා විනාශ වී යනතෙක් පරිසරයේ කුමානාකරයකින් හෝ අන්තර්ගත ව පවතිනවා. ප්ලාස්ටික් නිසා පරිසරයට, වෙරළ තීරයට සිදු වන හානිය මෙරට සංචාරක කර්මාන්තයටත් ධීවර කර්මාන්තයටත් යම් ආකාරයක අනිසි බලපෑමක් ඇති කිරීමට සමත්.

තේමා කරගෙන පරිසර අමාත්‍යාංශයට අමතර ව ඕනෑ ම ආකාරයේ පරිසර වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට ඒ ඒ අමාත්‍යාංශ මට්ටමින් අවස්ථාව සලස්වා දී තිබෙනවා.

විවිධ අමාත්‍යාංශ යටතේ පැවති පාරිසරික කටයුතු හා සම්බන්ධ දෙපාර්තමේන්තු 12ක් පරිසර අමාත්‍යාංශය යටතේ වඩාත් ශක්තිමත් ඒකාබද්ධ ප්‍රවේශයකින් පරිසර දිනය සැමරීම සඳහා එක් වීම තවත් විශේෂ කරුණක්. ඒ අනුව පරිසර දින සැමරුම වෙනුවෙන් 'පරිසර සතිය' ක්‍රියාත්මක කිරීම, ජූනි 05 දින ජාතික පරිසර දින උත්සවය ජනාධිපති අනුර කුමාර දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් කෑගල්ලේදී පැවැත්වීම මෙන් ම ජනාධිපති කාර්යාලයේ මැදිහත් වීම හා Clean Sri Lanka වැඩසටහනේ දායකත්වය සමග මෙය තවදුරටත් සංවිධානාත්මක ලෙස ඉදිරියට ගෙන යාම සිදු වුණා. එසේ ම රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය 2025 අප්‍රේල් 02 දින සියලු ම අමාත්‍යාංශවලට චක්‍රලේඛයක් නිකුත් කරමින් ප්ලාස්ටික් භාවිතය රාජ්‍ය ආයතනවල අවම කිරීමේ අරමුණින් ඝන අපද්‍රව්‍ය නිසි පරිදි කළමනාකරණය කිරීමේ මාර්ගෝපදේශයක් හඳුන්වා දුන්නා.

ලෝක අර්බුදයක් බවට මේ වන විට පත් ව තිබෙන ප්ලාස්ටික් නිසා සිදුවන දූෂණය ශ්‍රී ලංකාවේ ආර්ථිකමය, පාරිසරිකමය, සෞඛ්‍යමය යනාදී වශයෙන් අහිතකර බලපෑම් ඇති කරනවා. ප්ලාස්ටික් මෙතරම් අහිතකර බලපෑමක් ඇති කිරීමට ප්‍රධාන කාරණාවක් වන්නේ ඒවා වියෝජනය වී විනාශ වන්නට අවුරුදු දහස් ගණනක් ගත වීම. එම නිසා ඒවා විනාශ වී යන තෙක් පරිසරයේ ක්‍රමානාකරයකින් හෝ අන්තර්ගත ව පවතිනවා.



**කේ. ආර් උඩුවාවෙල**
ලේකම්
පරිසර අමාත්‍යාංශය

ප්ලාස්ටික් නිසා පරිසරයට, වෙරළ තීරයට සිදු වන හානිය මෙරට සංචාරක කර්මාන්තයටත් ධීවර කර්මාන්තයටත් යම් ආකාරයක අනිසි බලපෑමක් ඇති කිරීමට සමත්.

ප්ලාස්ටික් ඉතා අඩු මිලකට වෙළෙඳපොළෙන් මිල දී ගැනීමට ඇති හැකියාව නිසාත් දහනය කිරීම වඩාත් පහසු අපද්‍රව්‍යක් ලෙසින් සලකන නිසාත් මින් සිදුවන අහිතකර සෞඛ්‍යමය, පාරිසරික තත්ත්ව පිළිබඳ ව නොසලකා වැඩි වශයෙන් ඉල්ලුම් කිරීමට පෙළඹෙනවා. ඒ අනුව ප්ලාස්ටික් නිසා සිදුවන දූෂණය අවම කිරීමට ශ්‍රී ලංකාවේ මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ ව සාකච්ඡා කිරීම වැදගත්. 2017 වසරේ සිට 2023 වසර දක්වා විශේෂ ගැසට් පත්‍රයක් නිකුත් කරමින් ජාතික පාරිසරික පනතට අනුව නීතිමය පදනමකින් පළාත් මට්ටමින් එක් වරක් පමණක් භාවිතයට ගත හැකි ප්ලාස්ටික් අයිතම තහනම් කිරීමට පියවර ගෙන තිබෙනවා. 2017 වසරේදී මයික්‍රෝන 20ට අඩු තුනී පොලිතින් භාවිතය තහනම් කිරීමට, පොලිතින් ලන්ච් ෂීට් තහනම් කිරීමට, HDPEවලින් සාදන ලද ෂොපින් බෑග් තහනම් කිරීමට, ප්ලාස්ටික් අඩංගු කසළ හෝ පහසුවෙන් දැවෙන වෙනත් ද්‍රව්‍ය එළිමහනේ දහනය තහනම් කිරීමට, සැරසිලිවලට යොදා ගන්නා ආකාරයේ පොලිතින් තහනම් කිරීමට පියවර ගැනුණා. 2021 වසරේදී ප්ලාස්ටික් ද්‍රව්‍ය හඳුනා ගැනීමේ ප්‍රමිති නිකුත් කිරීමටත් එක් වරක් පමණක් භාවිත කළ හැකි තෝරා ගත් ප්ලාස්ටික් අයිතම තහනම් කිරීමටත් වධානය යොමු වී තිබෙනවා. වරක් පමණක් භාවිත කළ හැකි ප්ලාස්ටික් අයිතම තහනම් කිරීමත් බෝතල් ලේබල් කිරීම සඳහා PVC භාවිත කිරීම තහනම් කිරීමත් බෝතල්වල අමතර මුද්‍රාවක් ලෙස පොලිතින් හෝ වෙනත් දිරාපත් නොවන ද්‍රව්‍ය භාවිත කිරීම තහනම් කිරීමත් ෂොපින් බෑග් සඳහා අය කිරීමත් 2023 වසරේදී සිදු වී ඇති අතර 2025 වසරේදී නව රාජ්‍ය චක්‍රලේඛයක් නිකුත් කරමින් ප්ලාස්ටික් භාවිතය අවම කිරීමට පියවර ගෙන තිබෙනවා.

ඉදිරියේදීත් ප්ලාස්ටික් භාවිතය මෙරට අධෛර්යමත් කිරීමට නිෂ්පාදකයා භාණ්ඩයේ ජීවන චක්‍රය අවසාන වන තෙක් ඊට වගකිව යුතු පාර්ශ්වය බවට පත් කිරීමේ Extended Producer Responsibility (EPR) සංකල්පය හඳුන්වා දීමට අපේක්ෂා කරනවා. එසේ ම සියලු ම ආජ්‍ය ආයතනවල ප්ලාස්ටික් අවම කිරීම සඳහා මූලික සැලසුමක් නිර්මාණය කිරීමත් පරිසර හිතකාමී නිෂ්පාදන භාවිතයට මිනිසුන් පෙළඹවීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමත් ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලසුමට (2021 - 2030) අනුව ක්‍රියා කිරීමත් ඉදිරි ක්‍රියාමාර්ග වනු ඇති.



# ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණය විසඳුමක් නොවෙයි

සෙසු බොහෝ රටවලට සාපේක්ෂ ව ජෛව විවිධත්වය හා ස්වාභාවික සම්පත් අතින් ඉතා සුවිශේෂ ස්ථානයක ශ්‍රී ලංකාව පසුවෙනවා. මීට ප්‍රධාන වශයෙන් බලපාන්නේ ශ්‍රී ලංකාව භූගෝලීය වශයෙන් පිහිටා ඇති ස්ථානය. ශ්‍රී ලංකාවට වසර පුරා මෝසම් වාර දෙකකින් වර්ෂාපතනය ලැබීම තවත් හේතුවක්. භූමියක ජීවයක් පැවතීමට නම් ජලය යහමින් පැවතීමත් වැදගත්. මෝසම් වැසි නිසා ශ්‍රී ලංකාවේ ජෛව පැවැත්මට අත්‍යවශ්‍ය මේ ජල සාධකය මනා ව පවතිනවා. දිවයින වටා ම පවතින මුහුදු තීරය, ක්‍රමයෙන් උස් වෙමින් මධ්‍යම කඳුකරය දක්වා දිවෙන භූ විෂමතාව, හිමපතනයක් හැරුණු විට අත්විඳීමට හැකි අනෙකුත් සියලු ම කාලගුණ තත්ත්ව පැවතීම මෙන් ම මේ කාලගුණ හා දේශගුණ තත්ත්වවලට අනුගත සදාහරිත නිවර්තන වැසි වනාන්තර, කඳුකර වනාන්තර යනාදී පරිසර පද්ධති රැසක් ද දැක ගැනීමට පුළුවන්. මේ සෑම පරිසර පද්ධතියකට ම ආවේණික වූ සතුන් මේ භූමියේ දැක ගැනීමටත් ලැබෙනවා.

මීට වසර මිලියන ගණනකට පෙර සිට සිදු වූ පාරිසරික විපර්යාසවල ප්‍රතිඵලයක් විදිහටයි ශ්‍රී ලංකාවට මෙබඳු ඉහළ ජෛව ගුණයෙන් යුතු පරිසර පද්ධතියක් උරුම ව තිබෙන්නේ. පැංජියානු සංකල්පයට අනුව ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අයත් ඉන්දු ඕස්ට්‍රේලියානු භූ තැටිය මුල් කාලීන ව ඇන්ටාටිකානු භූ තැටිය හා සම්බන්ධ ව පැවතුණා. එහිදී යම්කිසි කාල පරාසයක් තුළ මැඩගස්කරය හා ඉන්දු ඕස්ට්‍රේලියානු භූ තැටිය සම්බන්ධ ව එය පැවතුණු බවත් සඳහන්. පසුකාලීන ව ඇන්ටාටිකානු මහද්වීපයෙන් වෙන් වී උඩු අතට ගමන් කර යුරේසියානු භූ තැටියේ ගැටීමේ ප්‍රතිඵලයක් ලෙස වත්මන් භූ තැටිය නිර්මාණය වී තිබෙනවා. එලෙසින් කාලාන්තරයක් සිදු වූ භූ තැටියේ විකාශනය නිසාත් මෙරට පරිසර පද්ධති එකතු කරගත් ඇතැම් ලක්ෂණ පවතිනවා. මේ සියලු දේ සමග මෙරට පවතින ඉතාමත් සීමිත භූමි ප්‍රමාණයේ විශාල ප්‍රමාණයක ජෛව විවිධත්වයක් පෙන්වීම තවත් සුවිශේෂ කාරණාවක්.

මෙලෙසින් ඉහළ පාරිසරික වටිනාකමක් හිමි වන මෙරට පරිසර පද්ධතිය අද වන විට පාරිසරික වශයෙන් අභියෝග රැසකට මුහුණදෙමින් සිටිනවා. පරිසරයට අහිතකර දේ අප බොහෝ විට අහිතකර බව දැනුවත් වෙනවා. එහෙත් අප පරිසර හිතකාමී විදිහට සලකන දේ පවා අත්තනෝමතික විදිහට භාවිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පරිසරයට අහිතකර වී තිබීම ගැන සාකච්ඡා කිරීමත් වැදගත්. නිදසුනක් වශයෙන් පුනර්ජනනීය විදුලි නිෂ්පාදනයක් ලෙසින් අප සලකන ජල විදුලි බලාගාර සඳහා ස්වාභාවික ජල ප්‍රවාහවලට දරාගත නොහැකි බලාගාර සංඛ්‍යාවක් ස්ථානගත කළහොත් ගංගාවල ජීවය පවත්වා ගැනීමට ප්‍රමාණවත් ජල අවශ්‍යතාව නොමැති වීමෙන් ඒ ආශ්‍රිත ස්වාභාවික පද්ධතිය ම විනාශ වී යනවා. ඒ වගේ ම මන්නාරම් ප්‍රදේශයේ ස්ථාපනය කර තිබෙන සුළං විදුලි බලාගාරවල විදුලි පංකා ගතහොත් ඒවා ප්‍රධාන වශයෙන් මෙරටට සංචාරක පක්ෂීන් සංක්‍රමණය වන මර්මස්ථානයකයි සවිකර තිබෙන්නේ. විදුලිය නිෂ්පාදනයේදී සූර්ය කෝෂ ගොවිපොළ වඩාත් පරිසර හිතකාමී ක්‍රමවේදයක් වුවත් පවතින ශාක ප්‍රජාව විනාශ කරමින් ස්ථාපනය කිරීමට යාමෙන් සිදු වන්නේ මෙරට ඉතා සීමිත භූමි ප්‍රදේශයක ව්‍යාප්ත ව තිබෙන වනාන්තර පද්ධතිය තවදුරටත් විනාශ වී යාම. එම නිසා පරිසර හිතකාමී දේ පවා නිවැරදි ව පරිසරයට හානි වන ලෙස යොදා ගැනීමත් අභියෝගවලට මුහුණදීමට ගන්නා තීරණ පරිසර පද්ධතියට අගතියක් නොවන අයුරින් ගැනීමටත් විමසිලිමත් වීම කාලීන අවශ්‍යතාවක්. දේශගුණ වෙනස්වීම් නිසාත් මේ වනවිට ශ්‍රී ලංකාවට අභියෝග ගණනාවකට මුහුණදීමට සිදු ව තිබෙනවා.





**ඉමදුව ප්‍රියදර්ශන**
පරිසරවේදී

කාබන් විමෝචනය වැඩි වීමත් ස්වාභාවික හරිත වනාන්තර පද්ධති එළි කිරීමත් නිසා දේශගුණික විපර්යාස ඔස්සේ ඇති වන ගෝලීය උණුසුම ඉහළ යාම, වෙරළ ඛාදනය වැඩි වීම, දිගුකාලීන නියං, කෙටි කාලයකදී පරිසර පද්ධතිවලට දරා ගැනීමට නොහැකි තරමේ අධික වර්ෂාපතන ඇති වීම වැනි බලපෑම් තවදුරටත් තීව්‍ර වෙමින් පවතිනවා. මේ සියලු දේ අවසානයේ පාරිසරික වශයෙන් මානව පැවැත්මට බාධා පමුණුවන උපද්‍රව බවට පත් වනවා.

මෙවර ජගත් පරිසර දින තේමාව බවට පත් ව තිබෙන 'ප්ලාස්ටික් නිසා ඇතිවන පරිසර දූෂණය අවසන් කිරීම' යන්න මේ වන විට ලෝකයේ ම ව්‍යසනයක් බවට පත් ව තිබෙන තවත් ගෝලීය ගැටලුවක් ආමන්ත්‍රණය කෙරෙනවා. බොහෝදෙනා ප්ලාස්ටික් පරිසරයට, මිනිසුන්ගේ සෞඛ්‍යයට අහිතකර බව දන්නා නමුත් ප්ලාස්ටික් යන්න පාරිසරික වශයෙන් මිනිස් පැවැත්මට ප්‍රශ්නයක් වී තිබෙන ආකාරය පිළිබඳ නිසි අවබෝධයකින් ක්‍රියා කරන්නේ නැහැ. සැබවින් ම ප්ලාස්ටික් සඳහා විසඳුමක් මේ වන තෙක් ලැබී නැහැ.

ප්ලාස්ටික් සැකසී තිබෙන්නේ ප්ලාස්ටික් කුඩා අංශු විශාල ප්‍රමාණයක් එකතු එකතු වීමෙන්. එම නිසා ප්ලාස්ටික් පාරජම්බුල කිරණ හෝ වෙනත් වියෝජක මාදිලියක් හමුවේ ඉතාමත් පහසුවෙන් නැවතත් ක්ෂුද්‍ර ප්ලාස්ටික් බවට පත් වීම පමණයි මූලික ව ම සිදු වන්නේ. එලෙසින් ක්ෂුද්‍ර ප්ලාස්ටික් බවට පත්වන අංශු වසර දහස් ගණනකටත් වඩා කාලයක් පරිසරයේ එයාකාරයෙන් ම පැවතීමේ හැකියාව තිබෙනවා. ඇතැම් ලවණමය සංඝටකවලට පවා ගමන් කළ නොහැකි පටක හරහා මේ ක්ෂුද්‍ර ප්ලාස්ටික්වලට ගමන් කිරීමේ හැකියාව පවතිනවා. අද වන විට ක්ෂුද්‍ර ප්ලාස්ටික් මිනිස් ශුක්‍රාණුවල පවා අන්තර්ගත ව තිබෙන බව සොයාගෙන තිබෙනවා. මෙලෙසින් සෛලගත වන ක්ෂුද්‍ර ප්ලාස්ටික් නිසා අවසානයේ පිළිකා ඇති වීමේ අවදානම පවා වර්ධනය කෙරෙනවා. අද වන විට ප්ලාස්ටික් දූෂණය අවම කිරීම සඳහා ඒවා ප්‍රතිචක්‍රීයකරණය කිරීම විසඳුමක් බව බොහෝ දෙනා සිතනවා. එහෙත් මේ ප්‍රතිචක්‍රීයකරණ වැඩපිළිවෙළ නිසා තවදුරටත් සිදු වන්නේ ප්ලාස්ටික්වලින් ක්ෂුද්‍ර ප්ලාස්ටික් සැකසීම වඩාත් වේගවත් කිරීමක්. එම නිසා මීට විසඳුම් ලෙස සිදු කළ හැකි වඩාත් සාධනීය පිළියමක් වන්නේ බාහිර පරිසරයේ තිබෙන ප්ලාස්ටික් වියෝජක කාරකවලට හසු නොවන ලෙස ප්ලාස්ටික් සීල් කර තැබීම. ඒ අනුව ගොඩනැගිලි ඉදි කිරීම්වල සැකිලි පිරවුම් ලෙස භාවිත කිරීමෙන් පරිසරයට හානියක් ඇති නොවන පරිදි වෙනත් දෙයක් නිර්මාණය සඳහා අමුද්‍රව්‍ය ලෙස ප්ලාස්ටික් භාවිත කිරීමට හැකියාව තිබෙනවා.

ප්ලාස්ටික් ඉල්ලුම සහ භාවිතය අවම කිරීමට විවිධ විකල්ප හඳුන්වා දීමටත් පුළුවන්. නිදසුනක් විදිහට මෙරට පරිසර පද්ධතිවලට ආක්‍රමණශීලී ශාකයක් (Invasive Plant) වන ජපන්ජබර ශාකය කෙඳි සහිත ශාක අතරින් වඩාත් ඉහළ ගුණාත්මක බවකින් යුතු ශාකයක් බවට හඳුනාගෙන තිබෙනවා. එබැවින් මේ ශාකය භාවිතකොට පරිසර හිතකාමී ගමන් මලු, වෙනත් කෙඳි ආශ්‍රිත ව නිමැවුම් සිදු කිරීමේ හැකියාව තිබෙනවා. එසේ ම හණ වර්ග, කෙසෙල්, උණ ශාක, පොල්කටු වැනි දේ උපයෝගී කරගෙන ප්ලාස්ටික්වලින් නිෂ්පාදනය කරන භාණ්ඩවලට විකල්ප භාණ්ඩ වෙළෙඳපොළට සකසා නිකුත් කිරීමටත් පුළුවන්.





# පාරිසරික ගැටලු

## ගෝලීය ව කියවා ගත යුතුයි

පරිසරය, පෘථිවියේ පවතින ජීවමය සහ අජීවමය ද්‍රව්‍යවල සංයුතියක්. මානව වර්ගයාගේ පැවැත්ම සහ දියුණුව රඳා පවතින්නේ පරිසරයේ පැවැත්ම මත. හුස්ම ගන්න වායුවේ සිට, අප කන බොන දෑ සිට උෂ්ණත්වය, සීතල, වර්ෂාව වැනි දේශගුණික සාධක පවා රඳා පවතින්නේ පරිසර සමතුලිතතාව මත. සාගරවල ඇති ඇසට නොපෙනෙන හරිත ප්ලවාංග අපට හුස්ම ගැනීමට අවශ්‍ය ඔක්සිජන් වායුවෙන් 50%ක් නිරන්තරයෙන් නිපදවනවා. මීට අමතර ව වනාන්තර මේ සඳහා විශාල වශයෙන් දායක වනවා.

ජලය පානයට සුදුසු වන අයුරින් පරිසරයේ පවතින්නටනම් සමතුලිතතාවෙන් යුතු ජල චක්‍රයක් පැවතීම වැදගත්. එලෙසින් බීමට සුදුසු පානීය ජලය ලොව පුරා පවතින්නේ 0.01%ක ප්‍රමාණයක්. අද වන විට ලෝක ජනගහනයෙන් බිලියන 2ක් පමණ පානයට සුදුසු ජලය නොමැති වීමේ හිඟයට මුහුණදෙමින් සිටිනවා. ආහාර සුරක්ෂිතාව තහවුරු කර ගත හැකි වන්නේ ද පරිසරය සුරැකීමෙන්. කෘෂිකර්මාන්තය හා ධීවර කර්මාන්තය මුළුමනින් ම පරිසරයේ සුරක්ෂිතතාව මත රඳා පවතින ආහාර නිෂ්පාදන කර්මාන්ත දෙකක්. ලොව නිෂ්පාදනය වන ආහාරවලින් 75%ක් ම නිෂ්පාදනය කිරීමට ජෛව ගෝලයේ ක්‍රියාකාරකම් හේතු වනවා. ඒ අනුව පරිසරයේ ජෛව විවිධත්වය වැඩිවන තරමට ජීවීන් අතර පවතින අන්තර් ක්‍රියාකාරී සබඳතා මත ආහාර නිපදවීමේ හැකියාව ඉහළ යනවා. වර්තමානයේ බොහෝ පරිසර වේදිකාවල කතාබහට ලක්වන අධික ගෝලීය උෂ්ණත්වය පාලනය කිරීමටත් පරිසරය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනවා. මිනිසාගේ සෞඛ්‍යය හා පරිසරය අතරත් ඉතා සමීප සම්බන්ධතාවක් දකින්නට පුළුවන්. පරිසර අසමතුලිතාව හේතුකොටගෙන ඇති වන අනපේක්ෂිත ගංවතුර, නායයෑම්, දිගු කාලීන නියං තත්ත්ව මානව පැවැත්මට විශාල තර්ජනයක් ඇති කරනවා. එම නිසා පරිසරය හා මානව වර්ගයාගේ පැවැත්ම අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවත්නක්.

මිනිසාගේ ක්‍රියාකාරකම් සහ නීතිමය වශයෙන් පවතින දුර්වලතා නිසා ඇතිවන බහුසාධක ගැටලුවක් ලෙස පරිසර දූෂණය හඳුන්වා දීමට පුළුවන්. ශ්‍රී ගංකාවේ වනාන්තර ගහනය 1956 වසරේදී 44%ක් ව පැවතුණු නමුත් වර්තමානය වන



ආචාර්ය
**රංගිකා බණ්ඩාර**
අධ්‍යක්ෂිකා
Eco Check Global
තිරසර සංවර්ධන ආයතනය

විට එය 22% -23% දක්වා අඩු වී තිබෙනවා. ඊට බලපාන ලද ප්‍රධාන හේතුවක් වන්නේ කෘෂිකර්මය සහ විවිධ සංවර්ධන ව්‍යාපෘති. මේවා පාංශු ඛාදනය, නාය යෑම්, ජෛව විවිධත්වයට හානි වීම් යනාදිය සඳහා වැඩි වශයෙන් බලපා තිබෙනවා. කසළ කළමනාකරණයේ දුර්වලතා නිසා දිනකට ටොන් 7000කට වඩා අධික ගෘහස්ථ මූලික ව කසළ නිපදවෙන අතර ඉන් නිසි පරිදි බැහැර කිරීම සිදු වන්නේ 50%කටත් වඩා අඩු ප්‍රමාණයක්. වැඩිමනක් කසළ අක්‍රමවත් ලෙස පරිසරයට එකතු වීම නිසා විවිධ ලෙඩ රෝග ඇති වීම්, ජලය අපවිත්‍ර වීම් යනාදිය සිදු ව තිබෙනවා. නාගරීකරණය වීමත් සමග කසල කළමනාකරණ ගැටලුව පවතින්නේ තවදුරටත් උග්‍ර වෙමින්. පාරිසරික නීති යාවත්කාලීන නොවීම, ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදවල පවතින දුර්වලතා, නඩුවලට ගත වන අධික කාලය, මහජන අවබෝධය ඉතා අවම වීම සහ මුදල් සඳහා මිනිසාගේ වන අසීමිත ආශාව හා පටු ආත්මාර්ථකාමී ආකල්ප නිසා මෙබඳු ගැටලුවලින් පරිසරය සංරක්ෂණය අපහසු වී තිබෙනවා.

පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය අද වන විට තනි තනි වශයෙන් රටවලට සිදු කළ හැකි කාර්යයක් නොවෙයි. ඒ අනුව ජාතික සීමාවෙන් ඔබ්බට යමින් පරිසර දූෂණය, දේශගුණ වෙනස්වීම් නිසා ඇති වන බලපෑම්වලට මුහුණදීමට ගෝලීය ප්‍රජාවට සිදු ව තිබෙනවා. එබැවින් පරිසර සංරක්ෂණය තවදුරටත් ජාතික වගකීමක් පමණක් නොව සමූහ ජාත්‍යන්තර වගකීමක් ද වනවා. එහිදී පාරිසරික ගැටලු සාමූහික ගෝලීය ගැටලුවක් වශයෙන් කියවා ගත යුතුයි. පරිසරයට හානි පමුණුවන කෙලෙසින්, කුමන ස්ථානයකදී සිදු වුවත් එහි බලපෑම අත්විඳීමට සිදු වන්නේ සමස්ත ගෝලීය ප්‍රජාවට ම. එම නිසා මේ පාරිසරික ගැටලු ගෝලීය වශයෙන් සලකා බැලිය යුතු වනවා. වර්තමානය වන විට පාරිසරික ගැටලු සඳහා ජාත්‍යන්තරික සම්මුති, මූල්‍යමය උපකාර, තාක්ෂණික හුවමාරු සහ ප්‍රතිපත්තිමය සහයෝගිතාව වැනි කාරණා කෙරෙහි රටවල අවධානය යොමු වීම මෙහි ප්‍රතිඵලයක්. නිදසුනක් ලෙස ලෝක ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම පාලනය කිරීමට 'පැරිස් සම්මුතිය - 2015' (Paris Agreement) ) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමට දායක වන ක්‍රියාකාරකම් පාලනය කිරීමට ලෝකයේ රටවල් 170ක ජාතික දළ දායකත්වය හඳුනා ගනිමින් ඒවා යාවත්කාලීනකොට ක්‍රියාත්මක කිරීම අරඹා තිබෙනවා. තිරසර සංවර්ධන අරමුණු (Sustainable Development Goals), ඕසෝන් ස්ථරය ආරක්ෂා කිරීමට මොන්ට්‍රියල් ප්‍රොටෝකෝල් ගිවිසුම (Montreal Protocol, 1987), හරිත දේශගුණ අරමුදල (Green Climate Fund - GCF), Global Environment Facility (GEF) දේශගුණික බලපෑම්වලින් පීඩා විඳින රටවලට ආධාර ලබා දෙනවා.

මෙවර පරිසර දින තේමාව 'ප්ලාස්ටික්වලින් සිදුවන පරිසර දූෂණය අවසන් කිරීම'. මෙහිදී ඇසට නොපෙනෙන ක්ෂුද්‍ර ප්ලාස්ටික් ජලය, වාතය, පස හරහා මිනිස් සිරුරට හා ආහාර පානවලට ඇතුළු වී මිනිසාගේ මොළයට, හෘදය, අක්මාව වැනි අවයව තුළ තැන්පත් වීමත් මව්කිරි සහ නූපන් කලල තුළ දැකගත හැකි වීමත් මහා ඛේදවාචකයක්. වෙනත් බොහෝ රටවල මෙන් ශ්‍රී ලංකාවේත් විශ්වවිද්‍යාල මට්ටමින් අණු ප්ලාස්ටික් පිළිබඳ ව විවිධ පර්යේෂණ සිදු කෙරෙනවා. මේ පර්යේෂණ ඔස්සේ ශ්‍රී ලංකාවේ පවා විවිධ හැඩ, ප්‍රමාණ, ඒවා බහුල ව ඇති ආහාර වර්ග, විවිධ රූපලාවන්‍ය ද්‍රව්‍ය පිළිබඳ හඳුනාගෙන තිබෙනවා. එලෙස ම ක්ෂුද්‍ර ප්ලාස්ටික් බවට ඝන ප්ලාස්ටික් පත් වන ක්‍රියාවලිය, උෂ්ණත්වය, විවිධ රසායනික වර්ග හඳුනාගෙන තිබෙනවා. එවැනි තත්ත්වවලට භාජනය නොවන ආකාරයෙන් ප්ලාස්ටික් නිසි කළමනාකරණයකින් බැහැර කිරීමටත් ප්‍රතිචක්‍රීයකරණය කළ යුතු ආකාර පිළිබඳවත් සැලකිලිමත් වෙමින් සිටිනවා. ප්ලාස්ටික් භාවිතය අවම කිරීමට ප්ලාස්ටික් වෙනුවට භාවිත කළ හැකි වෙනත් විකල්ප කෙරෙහි ගෝලීය ජනතාවගේ අවධානය යොමු වෙමින් පවතිනවා. ඒ අනුව මෑතකාලීන ව සිදු කරන ලද පර්යේෂණයකදී ජලයේ දියවී විනාඩි කිහිපයකින් විනාශ වී යන සිලි සිලි බෑග් වර්ගයක් සොයාගෙන තිබෙනවා. ප්ලාස්ටික් දිරාපත් කරමින් ඒවා ආහාරයට ගන්නා දිලීර වර්ග පිළිබඳ ශ්‍රී ලංකාවේත් ලෝකයේත් පර්යේෂණ සිදු කෙරෙමින් පවතිනවා. විශ්වවිද්‍යාලවලින් ප්ලාස්ටික් නිසා ඇති විය හැකි අහිතකර බලපෑම් අවම කිරීමට මෙලෙසින් විශාල දායකත්වයක් සැපයුවත් එම පර්යේෂණ දත්ත, වාර්තා නිසියාකාර ව ප්‍රතිපත්ති සම්පාදනයට හා තීන්දු ගැනීමට යොදා ගැනීමේදී විවිධ අක්‍රමිකතා මතු වීම ගැටලුවක්.

පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය අද වන විට තනි තනි වශයෙන් රටවලට සිදු කළ හැකි කාර්යයක් නොවෙයි. ඒ අනුව ජාතික සීමාවෙන් ඔබ්බට යමින් පරිසර දූෂණය, දේශගුණ වෙනස්වීම් නිසා ඇති වන බලපෑම්වලට මුහුණදීමට ගෝලීය ප්‍රජාවට සිදු ව තිබෙනවා. එබැවින් පරිසර සංරක්ෂණය තවදුරටත් ජාතික වගකීමක් පමණක් නොව සමූහ ජාත්‍යන්තර වගකීමක් ද වනවා.



# මහින්දාගමනයේ සංදේශය



සමාජීය විද්‍යාපති රාජකීය පණ්ඩිත පූජ්‍ය
**බෝපැත්තේ සෝමානන්ද හිමි**
කථිකාචාර්ය
කැලණිය විශ්වවිද්‍යාලය

අප රටේ සියලු අගයන්හි උත්තරීතර පිළිගැනීම වන්නේ ථෙරවාදී බුදු දහම. එය ලොව වෙනත් කිසිදු රටකට නොමැති අතිවිශිෂ්ට උරුමයක්. බුදුන් වහන්සේ එදා දඹදිව උපත ලද ථෙරවාද බුදු දහමේ පරම උරුමය හිමි වූ රට ලෙසයි ශ්‍රී ලංකාව විරාජමාන වන්නේ. නිර්මල සම්බුදු දහම සිරිලකට උරුම වූ පොසොන් පොහෝ දිනය අපට බොහෝ වැදගත් වන්නේ ඒ නිසා. සිංහල බෞද්ධ සංස්කෘතිය පදනම් ව ගොඩනැගුණු මහා ජන සමාජය විස්තාරණය වන්නේ ද ඒ අනුව නිසා පොසොන් පොහෝ දිනයේ ඇති වැදගත්කම ඉතා ඉහළයි.

මෙවර පොසොන් උත්සවය අර්ථාන්විත ව හා උත්කර්ෂවත් ව සැමරීමට රාජ්‍ය අනුග්‍රහය ලැබීම වැදගත්. ඒ, 2023 වසරේ සිට රාජ්‍ය පොසොන් උත්සවය නවතා දමා තිබූ පසුබිමක. 'අනුබුදු දහමින් ලොව ම නිවේවා' යන තේමාව රැගත් 2025 රාජ්‍ය පොසොන් උත්සවය මෙරට ප්‍රථම රාජධානිය වූ අනුරාධපුරය කේන්ද්‍ර ව පැවැත්වීමට සැලසුම් කළේ ඒ අනුව. මේ, මෙවර තේමාව අනුව දක්වන විද්වත් අදහස් දැක්වීමක්.

මිහිඳු මහරහතන් වහන්සේ ඇතුළු ධර්මදූත කණ්ඩායම එදා මිස්සක පව්වෙන් ලක්දිවට වැඩම කරවීම ඓතිහාසික වනවා සේ ම රාජ්‍ය තාන්ත්‍රික ව වූ සුවිශේෂ සිදුවීමක්. බොහෝදෙනා එය එකවර සිදු වූ ප්‍රාතිහාර්යාත්මක දෙයක් ලෙස වටහා ගෙන තිබුණ ද සත්‍ය වශයෙන් ම එය දෙරටේ අන්‍යෝන්‍ය අවබෝධය පරිදි රාජ්‍ය තාන්ත්‍රික දැනුවත්භාවයෙන් යුතු ව සිදු වූවක්. ක්‍රි. පූ 3 වැනි සියවසේ සිදු වූ මේ උත්කෘෂ්ට සිදුවීම මෙරට ඉතිහාසයේ වැදගත් ම සංධිස්ථානය. අප රටේ පැරණි ඓතිහාසික හා පුරාවිද්‍යා මූලාශ්‍ර නිවැරදි ව පරිශීලනය කළ විට ඒ බව සනාථ වනවා. එය ඉන්දියානු අශෝක අධිරාජයාගේ, ථෙරවාදී මහරහතුන් වහන්සේලාගේ මැදිහත්වීම මත සිදු වූවක්.

මිහිඳු මහරහතන් වහන්සේ
ඇතුළු ධර්මදූත කණ්ඩායම
එදා මිස්සක පව්වෙන්
ලක්දිවට වැඩම කරවීම
ඓතිහාසික වනවා සේ ම
රාජ්‍ය තාන්ත්‍රික ව වූ සුවිශේෂ
සිදුවීමක්. බොහෝදෙනා
එය එකවර සිදු වූ
ප්‍රාතිහාර්යාත්මක දෙයක් ලෙස
වටහා ගෙන තිබුණ ද සත්‍ය
වශයෙන් ම එය දෙරටේ
අන්‍යෝන්‍ය අවබෝධය
පරිදි රාජ්‍ය තාන්ත්‍රික
දැනුවත්භාවයෙන් යුතු ව
සිදු වූවක්.

අද අප පොසොන් උත්සවය සමරන විට බොහෝ අවස්ථාවල සිදු වන්නේ ආමිෂය මූලික කර ගත් සැමරුම්. තොරණ, පහන්කූඩු, සැරසිලි, දන්සැල් ආදී බොහෝ දේ රට පුරා පැවැත්වුවත් සැබවින් ම සීල, භාවනා සහ ප්‍රතිපත්ති පූජාවට ලැබී ඇත්තේ අඩු වැදගත්කමක්. එය රටක් දියුණු කිරීමේදී එතරම් සුබ පිළිවෙතක් නොවෙයි. මිහිඳු මහ රහතන්වහන්සේ රැගෙන ආ සැබෑ සම්බුදු දහම් පණිවිඩය එය නොවන බවවත් වටහා ගැනීමටයි අප උත්සුක විය යුත්තේ.

බොහෝ දෙනා ධර්මය හා ඒ ආශ්‍රිත පරිසරය නිසි ලෙස වටහා නොගැනීම නිසා විමුක්ති මාර්ගයෙන් ඈත් වීමට සිදු වනවා. එයයි නූතනයේ අප අත්දකින සහ රටේ සිදුවන හානිය. ගස් ගල් අදහමින් සිටි ජනතාවක් ආධ්‍යාත්මික දහම් මාර්ග යකට පරිවර්තනය වනු දැකීමයි මිහිඳු මාහිමියන්ගේ අපේක්ෂාව වූයේ. රටේ ජනතාව සිංහල ද දෙමළ ද මුස්ලිම් ද බර්ගර් ද යන්න නොව මේ ආධ්‍යාත්මික දර්ශනය ඒ කවර ජාතියකට වුවත් පොදුවේ පිළිගත හැකි ක්‍රමවේදයක්. කුමන ජාතියක අයකු වුවත් වැරදි, පස්පව්, අකුසල් නොකරන්නේනම් එයයි බෞද්ධ

පිළිවෙත. එයයි මෙහි මුල් බැස ගත් දහමේ සැබෑ අරුත. ලෝකයේ යථාර්ථය සාමාන්‍ය ජනතාවට තේරුම් කර දීමට උන් වහන්සේ මෙරටට වැඩම කළා යන්නයි අප ලබන ගැඹුරු අවබෝධය.

ලෝකය දෙස විමසිලිමත් ව බැලීමත් මහින්දාගමනයේ යථාර්ථවාදීත්වය නුවණින් වටහා ගැනීමත් අප කළ යුත්තක්. මහින්දාගමනයෙන් සිදු වූ ආධ්‍යාත්මික පරිවර්තනය තව ම නිසි ලෙස අර්ථවත් වී නැති බවයි ඉන් ගම්‍ය වන්නේ. අප බොහෝදෙනා අවබෝධයට වඩා අනවබෝධයයි සාමූහික ව වපුරන්නේ. එය මෙරට සියලු ජනතාව විසින් ම අවධාරණය කර ගත යුත්තක්. අප මනස හා සිත මූලික ව දකින දේ ලෝක ධර්මතාවෙන් අවබෝධ කර ගැනීමයි මෙහිදී ප්‍රත්‍යක්ෂ කර ගත යුත්තේ. ධර්මයෙන් පුද්ගලයාත් පුද්ගලයාගෙන් ධර්මයත් දැක නිවැරදි මඟ පිය නැඟීමයි අප කළ යුත්තේ.

මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කර දෙසූ සූත්‍ර ධර්ම පිළිබඳත් අප අවධානය යොමු කිරීම වැදගත්. චූල්ල හත්ථි පදෝපම සූත්‍රයෙන් තෙරුවන් කෙරෙහි වූ විශ්වාසයේ ඉහළ ගෞරවය කෙතෙක් ද යන්න පැහැදිලි කරවනවා. පේත වත්ථු, විමාන වත්ථු, බාලපණ්ඩිත, දේවදූත වැනි සූත්‍රවලින් පෙන්වා දුන්නේ අකුසලයෙන් ඈත්වී කුසලයට නැඹුරු වෙන ජීවිත ම අප සකසා ගත යුතු ය යන්න. නැතහොත් අයහපතේ නොයෙදී යහපතේ ම යෙදීම. කෙනකුට නිරතුරු ව කුසලයේ ම නිරත විය හැකිනම් එය ඉතා වැදගත්. හැකි හැම විටෙක ම යහපත ම, නිවැරදි දේ ම කළ හැකි වීමයි දියුණුවේ මඟ.

ලෝකය දෙස විමසිලිමත් ව බැලීමත් මහින්දාගමනයේ යථාර්ථවාදීත්වය නුවණින් වටහා ගැනීමත් අප කළ යුත්තක්. මහින්දාගමනයෙන් සිදු වූ ආධ්‍යාත්මික පරිවර්තනය තව ම නිසි ලෙස අර්ථවත් වී නැති බවයි ඉන් ගම්‍ය වන්නේ. අප බොහෝදෙනා අවබෝධයට වඩා අනවබෝධයයි සාමූහික ව වපුරන්නේ. එය මෙරට සියලු ජනතාව විසින් ම අවධාරණය කර ගත යුත්තක්. අප මනස හා සිත මූලික ව දකින දේ ලෝක ධර්මතාවෙන් අවබෝධ කර ගැනීමයි මෙහිදී ප්‍රත්‍යක්ෂ කර ගත යුත්තේ. ධර්මයෙන් පුද්ගලයාත් පුද්ගලයාගෙන් ධර්මයත් දැක නිවැරදි මඟ පිය නැඟීමයි අප කළ යුත්තේ.

ඕනෑ ම ජාතියක, ආගමක, කුලයක ජීවත්වන අයෙක් යම් හොඳ දෙයක් කරයි ද එය ම යහපත් දෙයක්. සීලයේ පිහිටා ජීවත්වීමෙන් විශාල ප්‍රයෝජන අත්පත් කර ගැනීමට හැකි වනවා. කය හා වචනයේ සංවරයයි සීලයේ පදනම. නිරතුරු ව තමාට කළ හැකි සෑම යහපතක් ම සිදු කරන්නට වග බලා ගැනීමෙන් බොහෝ යහගුණදම් ඌකෙනවා. හොඳ හිත දිනා ගැනීම අතින් අප රටක් ලෙස ලෝකයේ සිටින්නේ ඉහළ ම තැනක. එහෙත් එදාට වඩා අද තත්ත්වය වෙනස්. සමාජයේ පිරිහීම් බොහෝයි. අවර ගති බොහෝයි. ඒවා මුලිනුපුටා දැමීමෙන් ම අපට ජීවිතයේ හරි මඟ පෙන්වා දෙනවා. වටහා දෙනවා. කිසිවිටෙකත් අනුන්ට හිංසා පීඩා නොදෙන, නොකරන ජීවිතයක් අප ගෙවිය යුත්තේ. එහි සාරධර්ම වටිනාකම් සහ යහසිරිත්වලිනුයි අප පෝෂණය විය යුත්තේ. දරුවන්ට ඒ මඟයි පෙන්වා දිය යුත්තේ. එයයි හෙට දවසේ හිරු මඬල සේ විහිදී රට සශ්‍රීක කළ යුතු වනුයේ.

මහින්දාගමනයේ බලපෑම සදාචාරාත්මක සමාජ පරිවර්තනයක උරුමයයි අපට ගෙන දුන්නේ. එම බුදු වදන හරි හැටි අවබෝධ කර ගැනීමයි මේ කෙටි ජීවිතයේ අරමුණ විය යුත්තේ. මේ ජීවිතයේ අප ලබා නොගත් යම් අරුතක් වේ ද ඒ ධර්ම මාර්ගය අරුත් සාගරයක්. පහන් දහසක සම්බුද්ධාලෝකයක්. සැබෑ ම ජීවන දහමක්. සොබාදමේ උත්තරීතර දහමක්.

**නිශාන්ත පීරිස්**





# එළවලු පලතුරු සුව දෙයි නිරතුරු



රංගිකා අබේසේකර

ගෝලීය පෝෂණ ඉලක්ක වෙත යන ගමනේ යෙදෙන ශ්‍රී ලංකාවේ 2025 වසරේ 'ජාතික පෝෂණ මාසය' ජුනි මාසයට යෙදී තිබෙනවා. මෙවර එහි තේමාව වන්නේ 'එළවලු පලතුරු - සුව දෙයි නිරතුරු' යන්න.

ලෝක සෞඛ්‍ය සංවිධානය 'පෝෂණය' යන්නෙන් අර්ථ දක්වන්නේ ශරීර වර්ධනයට, ක්‍රියාශීලීබව හා ජීවිතය පවත්වා ගැනීමට පෝෂ්‍ය පදාර්ථ ලබාගැනීම. නිරෝගී මානව ප්‍රජාවකට පෝෂණය යන සාධකය ඉතා වැදගත්.

ලෝක සෞඛ්‍යය සම්මේලනය (World Health Assembly) 2025 වසරේ ගෝලීය පෝෂණ ඉලක්ක 6ක් හඳුන්වා දී තිබෙනවා. වයස අවුරුදු 05ට අඩු කුරු දරුවන්ගේ සංඛ්‍යාව 40%කින් අඩු කිරීම, ප්‍රජනක වයසේ කාන්තාවන්ගේ රක්තහීනතාව 50%කින් අඩු කිරීම, අඩු උපත් බර 30%කින් අඩු කිරීම, ළමා කාලයේ අධික බර අවම කිරීම, පළමු මාස 06 මව් කිරි දීමේ අනුපාතය අවම වශයෙන් 30%ක් දක්වා වැඩි කිරීම, ළමා කාලයේදී නාස්තිය 5%ට වඩා අඩු කිරීම ඊට අයත්.

ශ්‍රී ලංකාවේ පාසල් දරුවන් සහ වැඩිහිටි ප්‍රජාව පෝෂණය සම්බන්ධ විවිධාකාරයේ ගැටලුවලට මුහුණදෙන බවයි සෞඛ්‍ය අමාත්‍යාංශයේ පෝෂණ අංශ (අධ්‍යක්ෂ) විශේෂඥ වෛද්‍ය මොනිකා විජේරත්න සඳහන් කරන්නේ. අදහස් දක්වන ඇය; "ඇතැම් කලාපවල දරුවන් පෝෂණ ඌනතාවෙන් පෙළෙනවා. ඒ අතර මිටි බව, කෘශ බව, මන්දපෝෂණය, ස්ථූලතාව වැඩි වීමේ තත්ත්ව හඳුනාගෙන තිබෙනවා. දරුවන්ගේ සහ වැඩිහිටියන්ගේ ක්ෂුද්‍ර පෝෂක ඌනතා ද (හිමොග්ලොබින්, විටමින්, ඛනිජ ලවණ, විටමින් ඩී අඩුකම) නිරීක්ෂණය වනවා. මේ විෂම පෝෂණ තත්ත්වවලට විසඳුමක් ලෙසයි මෙවර තේමාව 'එළවලු පලතුරු - සුව දෙයි නිරතුරු' යනුවෙන් තෝරාගෙන තිබෙන්නේ. එළවළු සහ පලතුරු වැඩියෙන් පරිභෝජනයට ජනතාව උනන්දු කරවීම එහි ප්‍රධාන අරමුණක්.

මේ තේමාවට අනුව ප්‍රධාන පණිවිඩ හතරක් ලබාදීමටයි සෞඛ්‍ය අමාත්‍යාංශයේ පෝෂණ අංශය සැලසුම් කර තිබෙන්නේ. දිනකට අවම වශයෙන් පලතුරු සහ එළවලු 05ක්වත් පරිභෝජනය කිරීම (එළවළු වර්ග 02ක්, කොළ පැහැති එළවළුවක් සහ පලතුරු වර්ග 2ක් ඇතුළත් ව), එළවළු සහ පලතුරු සැකසීමේදී ඒවායේ පෝෂණ අගය ආරක්ෂා කර ගැනීම, දේශීය ව ලබාගත හැකි අඩු වියදම් පලතුරු සහ එළවළු තෝරා ගැනීම, සෞඛ්‍ය සම්පන්න කෙටි ආහාරයක් ලෙස පලතුරු සහ එළවළු පරිභෝජනය කිරීම ඊට අයත්. එළවළු සහ පලතුරු ශරීරයට වැඩියෙන් ගැනීමෙන් විවිධ වූ පෝෂණ අවශ්‍යතා සපිරෙනවා. එයින් සිදුවන්නේ ක්ෂණික ආහාර නිසා ඇතිවන සෞඛ්‍ය හානි අවම කරවීමක්.

2024 වසරේදී සිදු කළ ගෝලීය පාසල් සෞඛ්‍ය සමීක්ෂණයට සමගාමී ව සෞඛ්‍ය අමාත්‍යාංශයේ පෝෂණ අංශය හා සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය එක් ව ශ්‍රී ලංකාවේ අවුරුදු 13-17ත් අතර පාසල් සිසුන් යොදා ගනිමින් සමීක්ෂණයක් සිදු කළා. එම සමීක්ෂණ වාර්තාව අනුව 25%ක් ම දරුවන් සමීක්ෂණයට ලක්කිරීමට පෙර සතියේදී පලතුරු පරිභෝජනය කර නොතිබූ බවත් 3%ක් එළවළු පරිභෝජනය කර නොමැති බවත් විශේෂඥ වෛද්‍ය මොනිකා විජේරත්න සඳහන් කළ කාරණාවක්. නව යොවුන්වියේ දරුවන්ගේ ආහාර රටාව ද අතිශය වැදගත්. අනාගතේදී එම ආහාර රටාව වැඩිහිටියන් ලෙස ගොඩනැගීමේදී බලපානවා. මෙය සංවේදී විය යුතු තත්ත්වයක් බවයි වෛද්‍යවරුන්ගේ මතය.

නිරෝගි පුද්ගලයකුගේ දෛනික කැලරි අවශ්‍යතාව කැලරි 2000ක්. වයස, ස්ත්‍රී පුරුෂ බව, ශරීරයේ ප්‍රමාණය, ක්‍රියාකාරකම් මට්ටම සහ වැළඳී ඇති රෝග තත්ත්ව මත එක් එක් පුද්ගලයා ලබා ගත යුතු දෛනික කැලරි මට්ටම වෙනස්. කුස පුරවා ගැනීම මිස එයින් ලැබෙන පෝෂණය පිළිබඳ ජනතාවගේ අවබෝධය පවතින්නේ සතුටුදායක මට්ටමක නොවන බවයි වෛද්‍ය මොනිකා විජේරත්න සඳහන් කරන්නේ. මේ පිළිබඳ ජනතාව දැනුවත් කිරීම කාලීන අවශ්‍යතාවක්. නිවැරදි ආහාර රටාවකට ජනතාව ක්‍රමයෙන් අනුගත කළ හැක්කේ එවිට.

ශ්‍රී ලාංකික ජනතාව පෝෂණ ගැටලුවලින් පෙළීමට කරුණු කිහිපයක් බලපානවා. ඒ, ආදායමට සරිලන පරිදි ආහාර ලබා ගැනීමට නොහැකිවීම, පෝෂ්‍යදායී ආහාරවල මිල අධික වීම, වැරදි ආහාර රටා, කෙටි කෑම භාවිතයට හුරු වීම, කාර්යබහුලත්වය වැනි කාරණා.

2021 වසරේදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ බෝ නොවන රෝග පිළිබඳ අවදනම් සාධක සම්බන්ධ ව සමීක්ෂණයක් සිදු කර තිබෙනවා. එයට අනුව දිනකදී එළවළු හා පලතුරු සම්මත ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් පරිභෝජනය කර ඇති



එළවළු හා පලතුරු පරිභෝජනය කිරීමට උපදෙස් ලබා දී ආපනශාලාවල ක්ෂණික ආහාර තිබීමෙන් එලක් නැහැ. දැනුවත්භාවයෙන් චර්යාත්මක වෙනසක් ඇති කිරීම සඳහා පාසල් සහ වැඩපළ ආශ්‍රිත ආපනශාලා මාර්ගෝපදේශ හඳුන්වා දීම වැදගත්. සුදුසු ආහාර සුදුසු මිලකට ලබාදීම එහි අරමුණ බව වෛද්‍ය මොනිකා විජේරත්න සඳහන් කරන කාරණාවක්.

සමස්ත පුද්ගලයන් සිටින්නේ 68%ක්. සාමාන්‍යයෙන් සතියක පලතුරු ආහාරයට ගත් දින ගණනේ මධ්‍යන්‍යය සැලකුවිට සතියකට දින 03ක් පමණයි පලතුරු ආහාරයට එක් කරගෙන ඇත්තේ. සතියට ම එළවළු වර්ග 6ක් පමණක් ආහාරයට ගෙන තිබෙනවා.

එළවලු සහ පලතුරු වැඩි වශයෙන් ආහාර සඳහා එක්කර ගැනීමෙන් ශරීරයට ලැබෙන්නේ පිළිකා සහ මළ බද්ධය වැනි රෝග වැළැක්වීමට අවශ්‍ය ප්‍රතිඔක්සිකාරක. ක්ෂණික ආහාර භාවිතයේ සහ එළවළු පලතුරු පරිභෝජනයේ අඩුකම සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කරන විශේෂඥ වෛද්‍ය මොනිකා විජේරත්න; "ජනතාව වැඩියෙන් යොමු වී සිටින්නේ ක්ෂණික ආහාර භාවිතයට. මේ සඳහා නොයෙකුත් හේතු බලපානවා. විශේෂයෙන් කාර්යබහුල ජීවන ක්‍රමයක ආහාර පිළියෙල කර ගැනීමට මැලිකමක් දක්වන පිරිස් සිටිනවා. මේ පුරුද්ද බෝ නොවන රෝග සඳහා ප්‍රබල හේතුවක්. හෘදයාබාධ, අධිරුධිර පීඩනය, දියවැඩියාව, නොයෙකුත් පිළිකා තත්ත්ව ඊට අයත්. පෙර අවධිවල එම රෝග වැළඳුණේ වැඩිහිටියන්ට. වර්තමානය වන විට මේ රෝගවලට පාසල් දරුවන් බහුල ව ගොදුරුවන ආකාරය දක්නට පුළුවන්".

කුඩා කල ක්ෂණික ආහාර සඳහා පුරුදුවීමෙන් වැඩිහිටි අවධියේදී ලුණු, සීනි, පිටි යෙදූ ආහාර බහුල ව භාවිත කරනවා. සංස්කෘතික පරිසරයත් ආහාර රටාවට විශාල ලෙස බලපෑම් කරන්නක්. ජනතාවගේ ආහාර රටාව වෙනස් කිරීමට හෝ නිසි ක්‍රමවේදයකට යොමු කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශයට හෝ සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයට හෝ තනි ව කළ නොහැක්කක්. මේ සඳහා ජාතික පෝෂණ ප්‍රතිපත්තියක් ඔස්සේ පෝෂණ තත්ත්වය නගා සිටුවීමට බහු ආංශික ප්‍රවේශයක් අවශ්‍ය වනවා. ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන වෛද්‍ය මොනිකා විජේරත්න; "රටක් වශයෙන් ගන්නා ප්‍රතිපත්තිමය තීරණ මත එළවළු සහ පලතුරු භාවිතයට ජනතාව හුරු කරවීම හා ඒ සඳහා අවශ්‍ය ප්‍රවේශය වැඩි කිරීමට හැකියාව තිබෙනවා. ඒ සඳහා ප්‍රාදේශීය මට්ටමේ වෙළෙඳපොළ ඇති කිරීම, ඒවාට සහන සැලසීම, ගෙවතු වගාව ප්‍රවර්ධනය, කෘෂිකාර්මික නවෝත්පාදන හා ආහාර තාක්ෂණය සඳහා ආයෝජනය ඉතා වැදගත්".

කාලගුණ විපර්යාසවලට මුහුණදෙන රටක් නිසා වගා හානි හේතුවෙන් ආහාර සුරක්ෂිතතාවේදී ගැටලු මතුවනවා. ඒ ඒ කාලවලදී සුදුසු බෝග වර්ග මොනවාද යන්න තීරණය කර, ගොවියන් ඊට යොමු කිරීම වැදගත්. පසු අස්වනු හානිය සිදුවන්නේ බොහෝ විට බෙදා හැරීම් ක්‍රියාවලියේදී. ඊට පිළියම් යෙදීමෙන් ආහාර නාස්තිය අවම කිරීම වඩාත් කාලෝචිත ක්‍රියාවක්.

එළවළු හා පලතුරු පරිභෝජනය කිරීමට උපදෙස් ලබා දී ආපනශාලාවල ක්ෂණික ආහාර තිබීමෙන් එලක් නැහැ. දැනුවත්භාවයෙන් චර්යාත්මක වෙනසක් ඇති කිරීම සඳහා පාසල් සහ වැඩපළ ආශ්‍රිත ආපනශාලා මාර්ගෝපදේශ හඳුන්වා දීම වැදගත්. සුදුසු ආහාර සුදුසු මිලකට ලබාදීම එහි අරමුණ බව වෛද්‍ය මොනිකා විජේරත්න සඳහන් කරන කාරණාවක්.

ඇය පෙන්වා දෙන්නේ 2024 වසරේ දත්ත අනුව එක් එක් දිස්ත්‍රික්කවල පෝෂණ තත්ත්වයේ විශාල වෙනස්කම් පවතින බව. ඒ අනුව වතු සහ නාගරික ජනතාවගේ පෝෂණ තත්ත්වය වෙනස්. පෝෂණය සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු විය යුත්තේ කුමන පාර්ශ්වවලට ද? යන්න හඳුනාගෙන එළවළු සහ පලතුරු ඔවුන්ට සහන මිලට ලබා ගැනීමට හෝ වවුචර්පත්වලින් ලබා ගැනීමට අදාළ පාර්ශ්ව දැනුවත් කිරීම ඉදිරි ක්‍රියාමාර්ගයක්.

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ සඳහන් කරන්නේ ආහාරවල සුරක්ෂිතතාව, ආහාර පුරුදු හා පෝෂණ ආවේක්ෂණය ලෙස ධාරා 3ක් ඔස්සේ මීට අදළ ක්‍රියාකාරී සැලැස්ම සැකසීමට නියමිත බව. මෙහිදී පාසල් දරුවන්ගේ පෝෂණය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය සමග එක් ව විශේෂ වැඩපිළිවෙළකට යාම මූලික අපේක්ෂාවක්. එය පෙර වසරවල ද තිබූ වැඩසටහනක් වුවත් නිවැරදි ව ක්‍රියාත්මක වී නැහැ. ආකල්ප ඔස්සේ ආහාර රටාව සඳහා වන පරිවර්තනීය වෙනසක් කිරීමට ප්‍රවේශය ගන්නා බවත් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ අවධාරණය කරනවා.

සෞඛ්‍ය කෙරෙහි අවධානයක් සෑම පුද්ගලයකුට ම තිබීම වැදගත්. විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි ඉහළ අධ්‍යාපනයක් ඇති රටක ජනතාව පෝෂණය සම්බන්ධයෙන් මීට වඩා සැලකිලිමත් වීමයි අවශ්‍ය වන්නේ. මේ පිළිබඳ සියලු වගකීම් රජයට පමණක් පැවරීම සුදුසු නැහැ. පවතින පෝෂණ ගැටලු සඳහා රජය ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද ජනතාව ඒවා අනුගමනය නොකිරීම ඉතා අවාසනාවන්ත තත්ත්වයක්.

(සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ පැවති මාධ්‍ය සාකච්ඡාවක් ඇසුරින්)



# ස්ත්‍රීවාදයේ උත්කර්ෂය ගැහැනු ළමයි

කථිකාචාර්ය
**මනිෂ දුක්ගන්නාරාළ**

ආචාර්ය සුමිත්‍රා පීරිස් රචනා කර අධ්‍යක්ෂණය කළ 'ගැහැනු ළමයි' චිත්‍රපටය පසුගියදා කෑන්ස් සිනමා උලෙළේදී තිරගත වුණා. ලාංකේය සිනමාව පිළිබඳ ලෝක අවධානය යොමු වූ මේ චිත්‍රපට ප්‍රදර්ශනය මං විවර කළේ 'ගැහැනු ළමයි' චිත්‍රපටය පිළිබඳ නැවත සමාජ කතිකාවකට.

මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ සුප්පා දේවිය ද නෝර්වේජියානු ජාතික නාට්‍යකරුවකු වූ හෙන්රික් ඉබ්සන්ගේ නෝරා ද සුමිත්‍රා පීරිස්ගේ 'ගැහැනු ළමයි' චිත්‍රපටයේ කුසුමා ද අන්ත තුනක සිට එහෙත් එකට කියවීම වැදගත්. විශේෂයෙන් ලාංකේය සිනමාවේ ස්ත්‍රීවාදය උත්කර්ෂයට නැංවූ සිනමා අධ්‍යක්ෂවරිය ලෙස සුමිත්‍රා පීරිස් යම් සමාජ කතිකාවක් ඇති කළා.

ස්ත්‍රීවාදය පිළිබඳ අධ්‍යයනය කිරීමේදී එම විෂය පථයෙහි ද යම් ප්‍රභේද හඳුනා ගන්නට පුළුවන්. මාක්ස්වාදී ස්ත්‍රීවාදය පිළිබඳ අදහස උත්කර්ෂයට නැංවූ රචකයන් අතර සිටින Frigga Haug මාක්ස්වාදී ස්ත්‍රීවාදයේ ඉදිරි දැක්ම, එහි අඩුපාඩු හා දුර්වලතා පිළිබඳ රචනා කරමින් මෙසේ පවසා තිබෙනවා. "මාක්ස්වාදී ස්ත්‍රීවාදය අරමුණු කරන්නේ සමාජවාදී පරිවර්තනයේ කොටසක් ලෙස පීතෘමූලික ස්ත්‍රී පුරුෂ සබඳතා මුලිනුපුටා දැමීමට උත්සාහ කරමින් ස්ත්‍රීවාදී විප්ලවය මාක්ස්වාදයට සමපාත කිරීම ය. එය එක්තරා ආකාරයකට පුරුෂෝත්තම සමාජය ප්‍රශ්න කිරීමත් පුරුෂාධිපත්‍යය යටත් කරමින් දිනෙන් දින නැගෙන ස්ත්‍රීවාදී සංකල්පය උත්කර්ෂයකට නැංවීමත් වැනි ය." ගැහැනු ළමයි චිත්‍රපටයේ කුසුමාගේ චරිතය ඔස්සේ එක්තරා ආකාරයකට ගම්‍ය වන්නේ යට කී ස්ත්‍රීවාදයේ අධිපතිවාදී තත්ත්වය. නිමල් ගොඩනගා ගැනීමට උත්සාහ කරන ප්‍රේමනීය ලෝකය මනෝරාජ්‍යයක් බවට පත් කරමින් කුසුම් විසින් ගොඩනඟන ප්‍රතිතර්ක පීතෘමූලික ස්ත්‍රී පුරුෂ සබඳතා මුලිනුපුටා දැමීමක්.

"අපි යමුද ඇවිදින්න" යැයි නිමල් අසන ප්‍රශ්නයට උත්තර දෙමින් "මට ඔයා ව සැකයි. මට අවිශ්වාසයි. මම ඔයාට බයයි." යැයි පවසන කුසුමාගේ වචනවල ගම්‍යාර්ථය කුමක් ද? තම ඥාති සහෝදරයා වූ නිමල් එක් පසෙකින් ලේ ඥාතිත්වයත් අනෙක් පසින් ඇයගේ ප්‍රේමවන්තයා වීමෙන් ඇතිවන සම්බන්ධයත් යන දෙක ම ප්‍රශ්න කිරීම අධ්‍යක්ෂවරයාගේ දෘෂ්ටිවාදය තේරුම් ගැනීමට උපකාරී වන්නක්. පුරුෂාධිපත්‍යය ඓතිහාසික පන්ති සබඳතාවල ප්‍රාථමික ම අවස්ථාව බවට කාල් මාක්ස් සහ එංගල්ස් තර්ක කරනවා. ඒ පිළිබඳ ව දීර්ඝ වශයෙන් 1970 ගණන්වල ස්ත්‍රීවාදී සහ මාක්ස්වාදී අධ්‍යයන කවවල ඇති වූ මේ සාකච්ඡාව වර්ධනය වුණේ යම් මත විමර්ශනාත්මක අධ්‍යයන ක්‍රියාවලියක් ඔස්සේ. මාක්ස්වාදී ස්ත්‍රීවාදය යන්න පුළුල් ව විග්‍රහ කර බැලීමේදී අවබෝධ කර ගත හැක්කේ සම්ප්‍රදායික මාක්ස්වාදයෙන් වෙන්වීම සහ කාන්තා පීඩනයට මාක්ස්වාදී ප්‍රවේශය යෙදීම පිළිබඳ අරගල සහ පර්යේෂණ ක්‍රම නැවත අර්ථ දැක්වීම.


එක්තරා රාත්‍රියක නිමල් කුසුමා සොයා පැමිණෙනවා. එහිදී "කරුණාකරලා මෙතැනින් යන්න. වටපිටාවේ කවුරුවත් දැක්කොත් හොඳ නෑ. මම ගැනියක්නේ." යන ප්‍රකාශය එක්තරා ආකාරයකට ස්ත්‍රී චින්තනය ප්‍රශ්න කිරීමක්. එම ප්‍රකාශය ස්ත්‍රීවාදී තීක්ෂණ බුද්ධිය, මාක්ස්වාදය නව්‍යකරණයට ලක් කිරීමෙන් ඉදිරියට ගෙන යෑමට මැදිහත්වීමක් ඔස්සේ නොඑසේනම් විමර්ශනාත්මක ස්ත්‍රීවාදී කටයුතු නැවත සංකල්පනය කරන මැදිහත්වීම් ඔස්සේ ඉදිරියට යනවා. ග්‍රාම්‍ය දුප්පත් පවුලක ඉපදුණ ද කුසුමා තම නැගණියට වඩා විමර්ශනාත්මක දෘෂ්ටියකින් ප්‍රේමයත් සමාජ සම්බන්ධතාත් ඥාතිත්වයත් දෙස බැලීම පිරිමියකුගේ බසකට රැවටී ගැබ් ගන්නා සිය නැගණියගේ පසුගාමී ස්ත්‍රී චින්තනය දැඩි ව ප්‍රශ්න කිරීමක්.

ස්ත්‍රීවාදය ආරම්භ වූයේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ඇති කිරීමේ සමාජ ව්‍යාපාරයක් ලෙස. ඉන් බලාපොරොත්තු වූයේ කාන්තාවන් සවි බල ගැන්වීම සහ පීතෘමූලික සමාජ පද්ධතිවලට එරෙහි ව සටන් කිරීම. කලාව, සිනමාව, නාට්‍ය, චිත්‍ර මෙන් ම ලේඛන කලාවට ද වස්තු විෂය වූ ස්ත්‍රීවාදී සංකල්පය ලොව අග්‍රගන්‍ය සිනමා නිර්මාණ රැසකට මාතෘත්වය සපයා තිබෙනවා. 'ගැහැනු ළමයි' චිත්‍රපටයේ නිමල්ගේ මවගේ චරිතයත් කුසුම්ගේ මවගේ චරිතයත් පුරුෂයාගෙන් යැපීමේ ආර්ථිකයක් වෙනුවට ස්වයං ව ධනය

රැස් කිරීමෙන් තම දරු පවුල් රැක ගන්නා ආකාරය නිරූපණය කිරීමෙන් අධ්‍යක්ෂවරිය තමන්ගේ දෘෂ්ටිවාදාත්මක මැදිහත්වීම තේරුම් ගැනීමට ප්‍රේක්ෂකයාට ඉඩ සපයා තිබෙනවා. Liberal Feminism හෙවත් ලිබරල් ස්ත්‍රීවාදයේ ඉතිහාසයේදී කාන්තාවන්ට සහ පුරුෂයන්ට සමානාත්මතාව ලබාදීමට සමාන වැටුප්, සමාන රැකියා සහ අධ්‍යාපනය යන ක්ෂේත්‍රවල සමාන අයිතිවාසිකම් දිනා ගැනීම වෙනුවෙන් මතවාදී සටනක් කළා. ලිංගික අයිතිවාසිකම් අයිතිය මෙන් ම ගබ්සාව සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා කළ ඓතිහාසික සටන ලිබරල් ස්ත්‍රීවාදයේදී නිරූපණය වුණා.

කුසුමාගේ සහෝදරිය නිරූපිකාවක වීමේ සිහිනයෙන් විවිධ තරග සඳහා සහභාගි වන අතරතුර ගැබ් ගත්තා. එහෙත් කුසුමා සහ ඇගේ මව එක් ව බිළිඳා හදා වඩා ගන්නා ආකාරයත් ඔහුගේ පියා පිළිබඳ ව යම් ආකාරයේ පසුතැවීමක් තිබුණත් ඔහු ව සොයාගෙන නොයෑමත් එක්තරා ආකාරයකට විප්ලවීය කාන්තා චරිතයක ලක්ෂණ. තම අසනීප ස්වාමියාත් බලා ගනිමින්, බෙහෙත්හේත් දෙමින්, වැඩිමහල් දියණිය සහ බාල දියණිය පාසල් යවමින් දෙවැනි දියනියට නිරූපිකාවක වීමේ සිහිනය දැකීමට සලස්වන කුසුමාගේ මව කීර වෙළෙඳාමෙන් ලද සොච්චමෙන් විසල් සිහින දකිනවා.

චිත්‍රපටය අවසානයේ කුසුමාගේ පෙම්වතා, සහෝදරයා මෙන් ම ගුරුවරයා ද වන නිමල් ලබාදෙන සටහන් නිමල් අත ම තබමින් "කරුණාකරලා මට මගේ පාඩුවේ ඉන්න දෙන්න. මට වෙන මොකුත් ඕන නැහැ" යනුවෙන් පවසා ඇගේ කඳුළු වසන් කරමින් නිදහස් කිරිල්ලියක සේ අත්තටු සලමින් නික්ම යෑම අධ්‍යක්ෂවරියගේ අභිමතාර්ථ කූටප්‍රාප්තියකට පත් කිරීමක් වැනියි.





# රාජ්‍ය සේවා තරග විභාග අත්වැල

# නිවාඩු ගැන ටිකක් - 01



ඉදිරිපත් කිරීම
**නාලක දිසානායක**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
(පාර්ලිමේන්තු කටයුතු)
මහජන ආරක්ෂක හා
පාර්ලිමේන්තු කටයුතු
අමාත්‍යාංශය හා
අධ්‍යක්ෂ (පාලන) වැ.බ
රජයේ ප්‍රවෘත්ති
දෙපාර්තමේන්තුව

දෙසතිය පුවත් සඟරාවේ මෙවර කලාපයේ සිට තරග විභාග අත්වැල ඔස්සේ අප ඔබ වෙත ගෙන එන්නේ සාමාන්‍ය පරිපාලනයට අදාළ රාජ්‍ය නිලධාරීන් සහ සෙසු පාඨකයන් සඳහා වැදගත් වන විවිධ විවිධාන ඇතුළත් ලිපි පෙළකි. රාජ්‍ය නිලධාරීන් සඳහා නිවාඩු ලබාදීම හා සම්බන්ධයෙන් වන ආයතන විධිවිධාන සහිත ව ප්‍රශ්නෝත්තර ස්වරූපයෙන් එය ඉදිරිපත් කිරීමට අදහස් කෙරේ.

1. **රජයේ නිලධරයන්ගේ නිවාඩු සම්බන්ධ ව පවතින පොදු විධිවිධාන මොනවාද?**

- නිවාඩු යනු අයිතිවාසිකමක් නොව වරප්‍රසාදයකි.
- නිවාඩු අනුමත කරනු ලබන්නේ සේවයේ හදිසි වුමනාවලට යටත් ව වන අතර අනුමත කර ඇති නිවාඩු කාලය අඩු කිරීමට හෝ අවලංගු කිරීමට නිවාඩු අනුමත කරන බලධරයාට ඕනෑ ම විටෙක පුළුවනි.
- මෙරට නිවාඩු පොදු 125 (අ) දරන ආකෘතියෙන් හා පිටරට නිවාඩු පොදු 126 දරන ආකෘතියෙන් ඉල්ලුම් කළ යුතු ය.
- මෙරට නිවාඩුවක් නිවාඩුව ආරම්භවීමට යටත් පිරිසෙයින් දින 07කට පෙරත් පිටරට නිවාඩුවක් නිවාඩුව ආරම්භවීමට මාස 03කට පෙරත් අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු ය.
- අනුමත කරන ලද නිවාඩු පිළිබඳ රෙජිස්ටරයක් පොදු 190 ආකෘතියෙන් පවත්වාගෙන යා යුතු ය.

- අනියම් නිවාඩු ගණන් බැලීමේදී සෙනසුරාදා, ඉරිදා හා ප්‍රසිද්ධ නිවාඩු දින අත්හළ යුතු ය.

- විවේක නිවාඩු කාලය මෙරටින් බැහැර ව ගත කරන විට එම නිවාඩු කාලයට ගැනෙන සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දින ඊට ඇතුළත් වේ.

- අඩ වැටුප් නිවාඩු හෝ වැටුප් රහිත නිවාඩු කාලයට ගැනෙන සෙනසුරාදාවක්, ඉරිදාවක් හෝ රජයේ නිවාඩු දිනයක් පිළිවෙළින් අඩ වැටුප් හෝ වැටුප් රහිත නිවාඩු දින ලෙස ගණන් ගත යුතු ය.

- ඉහත විධිවිධානවලට අමතර ව රා.ප.ච.-8/2022හි විධිවිධාන කෙරෙහි අවධානය යොමු කිරීම ද විශේෂයෙන් වැදගත් වේ.

2. **නිලධරයකු ස්ථාන මාරු වී ගිය විටෙක පූර්ව සේවා ස්ථානයේ නව සේවා ස්ථානයට යැවෙන නිවාඩු වාර්තාවක ඇතුළත් විය යුතු දෑ මොනවාද?**

- නිලධරයා තම පළමු පත්වීමේ සිට එක් එක් අවුරුද්දේ ලබාගෙන ඇති මුළු විවේක/ අසනීප නිවාඩු ගණන, අඩ වැටුප් නිවාඩු ගණන හා වැටුප් රහිත නිවාඩු ගණන

- ස්ථාන මාරු වූ අදාළ අවුරුද්දේ ලබාගෙන ඇති සියලු ම අනියම් නිවාඩු ගණන

3. **පහත එක් එක් නිවාඩුව කෙටියෙන් විස්තර කරන්න.**

- අනියම් නිවාඩු

- මෙරටේදී ගත කිරීම සඳහා එක් වරකට දවස් 06කට වැඩි නොවන පරිදි අවුරුද්දේ උපරිම වශයෙන් දින 21ක් අනියම් නිවාඩු අනුමත කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට හැකි ය.

- මේ නිවාඩුව ලබා දෙන්නේ හුදෙක් අනියම් කරුණු මත කෙටි කාලයකට සේවයට පැමිණීමට නොහැකි විටදී ඒ සඳහා ඉඩ දීම පිණිස ය.

- විවේක නිවාඩු ලබාදීමේදී අවශ්‍ය වන පරිදි එම වර්ෂයෙහි අනියම් නිවාඩුවලට හිමිකම් ලබා ගැනීම සඳහා අලුතින් රාජ්‍ය සේවයට පත් කළ නිලධරයකුට අවම කාලයක් සේවය කිරීම අවශ්‍ය නොවේ.

- විවේක නිවාඩු

- රජයේ නිලධරයකුට එක් එක් අවුරුද්දක් සඳහා උපරිම වශයෙන් දින 24ක විවේක නිවාඩු ලබා දිය හැකි ය. සතියේ දින 07ක් වැඩ කිරීමට නියම වී ඇති නිලධරයන් සඳහා එම උපරිමය දින 28කි.

- වසර 02ක සමුච්චිත නිවාඩු ලබා ගැනීමට ඉඩ දිය හැකි ය. ඒ අනුව දින 24ක් හිමි නිලධාරියකුට වරකට උපරිම වශයෙන් දින 48ක හිමිකම ඇති අතර දින 28ක් හිමි නිලධාරින්ට දින 56ක හිමිකම
ඇත.

- නිවාඩුව දිවයිනෙන් බැහැර ව ගත කරන්නේනම්, නිවාඩු ලබා ගන්නා වසරේත් ඊට පෙර වසර දෙකකත් යන වසර තුනේ ම සමුච්චිත නිවාඩු, දින 24ක් හිමි නිලධාරියකුට උපරිම දින 72කට යටත් ව සහ දින 28ක් හිමි නිලධාරින්ට දින 84ක් ද ලබා ගැනීමට මාණ්ඩලික නිලධරයකුට ඉඩදිය හැකි ය.

- මෙරටදී ගත කරන විවේක නිවාඩු කාලයකට ඇතුළත් වන සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩුවලින් අඩු කරනු නොලැබේ. දිවයිනෙන් බැහැර ව ගත කරන විටදී ඒවා ද නිවාඩුවලින් අඩු කෙරේ.

- පළමුවරට පත්වීම් ලැබූ නිලධරයකුට සම්පූර්ණ වැටුප සහිත විවේක නිවාඩු ලබා ගැනීමට පෙර මාස 09ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

- සාමාන්‍යයෙන් යම් කිසි වසරක යටත් පිරිසෙයින් මාස 03ක් සිය තනතුරේ සේවය කරන තුරු එම නිලධරයාට එම වර්ෂය වෙනුවෙන් විවේක නිවාඩු දිය නොහැකි ය. එහිදී නිවාඩු දීමට අවශ්‍ය වේනම් වාර්ෂික නිවාඩුවලින් 1/3 බැගින් අනුපාතිකව නිවාඩු දීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට පුළුවනි.

- අසනීප නිවාඩු

- නිලධරයකු රෝගී වීම නිසා නිවාඩු ඉල්ලුම් කරන විට හෝ අසනීපය නිසා දින දෙකකට වඩා වැඩි කාලයක් සේවයට පැමිණීමට නොහැකි විට එම නිලධරයා, ළඟ ම සිටින වෛද්‍ය නිලධරයා ලවා තමා පරීක්ෂා කරවා ගත යුතු ය.

- පසුව රජයේ වෛද්‍ය නිලධරයකුනම් වෛද්‍ය 170, හෝ ආයුර්වේද වෛද්‍යවරයකුනම් ආයුර්වේද 44 ආකෘතියේ ලියන ලද සහතිකයක් හෝ පෞද්ගලික වෛද්‍ය වෘත්තිකයකු නම් තමා විසින් ම සාදාගත් ආකෘතියක හෝ ලියා අදාළ ආයතන ප්‍රධානියා වෙත යැවිය යුතු ය. ඉහත වෛද්‍ය සහතික මත ඕනෑ ම කාල පරිච්ඡේදයක සම්පූර්ණ වැටුප් සහිත, අඩ වැටුප් හෝ වැටුප් රහිත අසනීප නිවාඩු දිය හැකි ය. ලෙඩ රෝග සඳහා "වරකට දින 06ක්" දක්වා වූ නිවාඩු, නිලධරයාගේ කැමැත්ත පරිදි අනියම් නිවාඩුවලින් අඩු කළ හැකි ය.

➢ හිලවු නිවාඩු

- නිලධරයකු කිසියම් රජයේ නිවාඩු දිනයක හෝ සතියේ විවේක දිනයක ස්වකීය රාජකාරියේ යෙදීම අවශ්‍ය යැයි දෙපාර්තමේන්තු ප්‍රධානියා අදහස් කරන්නේනම් ඒ වෙනුවෙන් එම රජයේ නිවාඩු දිනයට හෝ සතියේ විවේක දිනයට නොවැඩි කාලයක් සඳහා එම නිලධරයාට හිලවු නිවාඩු දීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට සිය අභිමතය පරිදි හැකි ය.

- එම නිවාඩුව අදාළ නිලධරයාට හිමි සාමාන්‍ය නිවාඩුවලින් අඩු නොකෙරේ.

- නිවාඩු දිනයක වැඩ කර උපයාගන්නා හිලවු නිවාඩුව එම නිවාඩු දිනයේ සිට අවුරුද්දක් ඇතුළත ලබා ගත යුතු අතර, අවුරුද්දකින් පසුව එම නිවාඩුව අහෝසි වේ.

- මේ රටේ ගත කරන අනියම් හෝ විවේක නිවාඩු සමඟ හිලවු නිවාඩු ලබාගත හැකි අතර මෙරටින් බැහැර ව ගත කරන කිසිම ආකාරයක නිවාඩුවක් සමග හිලවු නිවාඩු ලබාගත නොහැකි ය. හිලවු නිවාඩු දීමෙන් රජයට කිසිම වියදමක් දැරීමට සිදු නොවන බවටත් දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය වැඩ කටයුතුවලට බාධාවක් නොවන බවටත් දෙපාර්තමේන්තු ප්‍රධානියා වග බලා ගත යුතු ය.

➢ හදිසි අනතුරු නිවාඩු සහ විශේෂ අසනීප නිවාඩු ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන හෝ නොදරන රජයේ නිලධරයකුට හෝ අධිකරණ නිලධරයකුට,

✓ ඔහුගේ රාජකාරි ඉටු කිරීමේදී හෝ

✓ රාජකාරි ඉටු නොකරන අවස්ථාවකදී වුව ද ඔහුගේ සාමාන්‍ය රාජකාරිවල විෂයය සීමාව ඇතුළත වූ යම් ක්‍රියාවක් කිරීමේ දී හෝ

✓ ඔහුගේ රාජකාරි ඉටු කිරීමෙහිලා යම් ක්‍රියාවක් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් හෝනිවසේ සිට සේවා ස්ථානය දක්වා හෝ සේවය නිම වී සේවා ස්ථානයේ සිට නිවස දක්වා හෝ යන ගමනකදී හෝ

✓ සේවා ස්ථානයේ සිට රාජකාරිවල නිරත වීම සඳහා යන හෝ ආපසු එන ගමනකදී හෝ තුවාල සිදුවුවහොත් හා එසේ තුවාල සිදුවීම

i. යම් නීතියක් හෝ දෙපාර්තමේන්තු නියමයක් හෝ රෙගුලාසිටක් හෝ උල්ලංඝනය වන අයුරින් ක්‍රියා කිරීම නිසා හා/ හෝ

ii. නිලධරයාගේ සහයක නොසැලකිලිමත්භාවය නිසා නොවේනම්,

➢ එසේ ලැබූ තුවාලයේ ස්වභාවය අනුව හා වෛද්‍ය මණ්ඩලයක නිර්දේශ අනුව, අදාළ අමාත්‍යාංශයේ ලේකම්ට, එම නිලධරයාට වසරක් දක්වා වැටුප් සහිත නිවාඩු සහ ඉන්පසුව මාස 06ක් දක්වා අඩ වැටුප් නිවාඩු අනුමත කළ හැකි ය.

✓ මෙම නිවාඩු නිලධරයාගේ සාමාන්‍ය නිවාඩුවලින් අඩු නොකළ යුතු ය.

✓ අවශ්‍ය වුවහොත් මෙම නිවාඩුවට අමතර ව තමාට හිමි ඉකුත් නිවාඩු ලබා ගැනීමට නිලධරයාට අවසර ඇත.

එමෙන් ම,

- නියම වශයෙන් ම සිය රාජකාරි කරමින් සිටියදී යම් නිලධරයකුට රෝගයක් වැළඳුණහොත් හා එසේ රෝගය වැළඳුණේ ඔහු නියම වශයෙන් සිය රාජකාරි කරමින් සිටියදී බවටත් ඔහුගේ ප්‍රමාද දෝෂයක් නිසා නොවන බවටත් නිශ්චය වශයෙන් ම ඔහුගේ රාජකාරි ස්වභාවය හේතුකොටගෙන බවටත් රජයේ වෛද්‍ය නිලධරයකු ඉදිරිපත් කරන සහතිකයක් මත අදාළ අමාත්‍යාංශ ලේකම්ට සෑහිමට පත්විය හැකිනම්, මාස 06ක් දක්වා වැටුප් සහිත විශේෂ නිවාඩු සහ ඉන් පසුව මාස 06ක් දක්වා අඩු වැටුප් නිවාඩු අනුමත කළ හැකි ය. මෙම නිවාඩු ද නිලධරයාගේ සාමාන්‍ය නිවාඩුවලින් අඩු නොකළ යුතු ය.

ඉතිරිය ඉදිරි කලාපයට....



# පිබිදෙන රග්බි

වර්නන් ගුණසේකර

රග්බි ලෝක කුසලානය - 2027 සඳහා ආසියාවේ ගමන ආරම්භ වන්නේ 2025 ජූනි මාසයේ. ඒ, 2025 ආසියානු රග්බි එමිරේට්ස් පිරිමි ශූරතාවලියට තියුණු මුහුණුවරක් ගෙන එමින්.

2014 වසරෙන් පසුව වඩාත් ම අතිශය වැදගත් තරගාවලිය බවට මේ වසරේ තරගාවලිය පත් ව තිබෙනවා. 2014 වසරේදී ජපානය ලැබූ ජයග්‍රහණයෙන් ඔවුන්ට 2015 ලෝක කුසලාන රග්බි තරගාවලිය සඳහා මං විවර වුණේ ආසියාවේ රග්බි ක්‍රීඩාවේ තත්ත්වය ඉහළට ඔසවා තැබූ සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්.

ජපානය දැනටමත් 2027 වසරේ පැවැත්වෙන ලෝක කුසලාන රග්බි තරගාවලියට සුදුසුකම් ලබා සිටියදී, කීර්තියට පත්වීමේ අභිලාෂයෙන් යුත් තවත් ජාතික කණ්ඩායම් හතරක් එනම් ශ්‍රී ලංකාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, හොංකොං සහ දකුණු කොරියාව දැන් සිටින්නේ ඕස්ට්‍රේලියාවේ පැවැත්වීමට නියමිත ගෝලීය රග්බි වේදිකාවේ ආසියාවේ අංක 1 ස්ථානය තහවුරු කරගැනීමට තරග තුනක පමණක් දුරකින්. ආසියානු රග්බි තරග බිමේ මේ ඉහළ ම ස්ථරයට උසස් වීමක් ලැබූ අලුත් ම කණ්ඩායමයි ශ්‍රී ලංකාව.

මේ තරගාවලියේ අනුශූරයන් වන කණ්ඩායමත් ලෝක කුසලාන තරගාවලියට සුදුසුකම් ලබා ගැනීමේ දඩයමේ තවදුරටත් රැඳී සිටිනු ඇත්තේ ඔවුන් අවසාන සුදුසුකම් ලැබීමේ තරගාවලියේ ස්ථානයක් වෙනුවෙන් අප්‍රිකාවේ අංක 2 කණ්ඩායමට එරෙහි තරගයක් සඳහා උසස් වීමක් ලබන බැවින්. මේ තීරණාත්මක තරගාවලිය පැවැත්වීමට නියමිත ව තිබෙන්නේ 2025 වසරේ නොවැම්බර් 8 සිට 18 දක්වා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඩුබායිහි 'ද සෙවන්ස්' ක්‍රීඩාංගණයේ.

ආසියානු රග්බි ශූරතාවලියෙන් ප්‍රදර්ශනය වන්නේ ආසියානු රග්බි ක්‍රීඩාවේ සිත්ගන්නා වර්ධනය සහ ගැඹුර. රග්බි ලෝක කුසලාන තරගාවලියට කණ්ඩායම් තුනක් ඉදිරිපත් කිරීමේ හැකියාව නිසා මේ දියුණුව වඩාත් වැදගත් වී තිබෙනවා.

ශ්‍රී ලංකාව ආසියානු රග්බි තරග බිමේ ඉහළ ම ස්ථරයට නැවත පැමිණියේ මැලේසියාව ලකුණු 59-19කින් අප්‍රේල් මාසයේ කොළඹදී පරාජය කරමින්. ශ්‍රී ලංකා රග්බි කණ්ඩායම එම තරගයේදී වේගවත්, ආක්‍රමණශීලී ක්‍රීඩාවකින් ලාංකේය රග්බි ලෝලීන් පිනවීමට සමත් වුණා.

මැලේසියාවට එරෙහි ව වාර්තා කළ මේ දැවැන්ත ජයග්‍රහණයත් සමග ශ්‍රී ලංකාව නවතම ලෝක ශ්‍රේණිගත කිරීමේ එක් පියවරක් ඉහළට තබමින් අංක 39 ස්ථානයට පිවිසියා. මේ අනුව ශ්‍රී ලංකාව දැන් ආසියාවේ ශ්‍රේණිගත ව සිටින්නේ අංක 04ට. ඒ, ජපානය, හොංකොං හා දකුණු කොරියාවට පමණක් පසුපසින් සිටිමින්. ආසියාවේ ඉහළ ම රග්බි කණ්ඩායම් හතර අතරේ සිටින එක ම දකුණු ආසියානු කණ්ඩායම වන්නේ ද ශ්‍රී ලංකාව.

ජපානය ලකුණු 72.95ක් ලබාගෙන ආසියාවේ පෙරමුණේ සිටින අතර හොංකොං ලකුණු 59.49ක් රැස් කරගෙන දෙවැනි ස්ථානයේත් දකුණු කොරියාව ලකුණු 50.77ක් ලබාගෙන තෙවැනි ස්ථානයේත් පසුවනවා. ආසන්නතම ජයග්‍රහණයෙන් පසුව ශ්‍රී ලංකාව ශ්‍රේණිගත ලකුණු 48.03ක් ලබාගෙන සිව් වැනි ස්ථානයේ පසුවන්නේ අනෙක් දකුණු ආසියානු රග්බි කණ්ඩායම්වලට වඩා බොහෝ ඉදිරියෙන් සිටිමින්.

මැලේසියාව පරාජය කිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවට ශ්‍රේණිගත කිරීමේ ලකුණු වැඩිවීමක් ලැබුණා පමණක් නොව එය ඔවුන්ට ආසියානු රග්බි ශූරතාවලියේදී ආසියාවේ හොඳම කණ්ඩායම් වන හොංකොං, දකුණු කොරියාව හා එක්සත් අරාබි එමීර් රාජ්‍යය යන කණ්ඩායම් සමග තරග කිරීමේ අවස්ථාව ද ලබා දුන්නා.

ශ්‍රී ලංකා රග්බි කණ්ඩායමේ මේ දියුණුව සිදු ව තිබෙන්නේ පසුගිය දෙවසර තිස්සේ අඛණ්ඩ ව පවත්වාගෙන පැමිණි දක්ෂතා හේතුවෙන්. පසුගිය වසරේ කොළඹදී පැවති ආසියානු රග්බි 1 කොටසේ ශූරයන් වීමට ද ශ්‍රී ලංකාව සමත් වුණා. එහිදී ඔවුන් අවසන් පූර්ව තරගයේදී ඉන්දියාවට එරෙහි ව ලකුණු 45-10ක් සහ අවසාන තරගයේදී කසකස්තානයට එරෙහි ව ලකුණු 45-7ක් වශයෙන් ඉතා පහසු ජයග්‍රහණ වාර්තා කළා.

මීට දෙවසරකට පෙර ලෝක රග්බි සම්මේලනයේ තහනමට ලක්වූ ශ්‍රී ලංකාව මෙසේ නැවත වරක් ශක්තිමත් ලෙස පහළොස් සාමාජික රග්බි තරග බිමට පිවිසීම අගය කළ යුතු කරුණක්. ඔවුන්ගේ ආසියානු රග්බි ශූරතාවලියේ දකුණු කොරියාව (ජූනි 13) හා එක්සත් අරාබි එමීර් රාජ්‍යය (ජූලි 4) සමග තරග කොළඹදීත් හොංකොංට එරෙහි තරගය (ජූනි 22) හොංකොංහිදීත් පැවැත්වීමටයි නියමිත.

ශ්‍රී ලංකා රග්බි සංගමයේ ප්‍රධානතම ඉලක්කය වී තිබෙන්නේ ජාතික කණ්ඩායමේ සංවර්ධනය බවත් රග්බි දැන් ජාතික ක්‍රීඩාවක් බවට පත් ව තිබෙන බවත් එම සංගමය 'දෙසතිය'ට ප්‍රකාශ කළා. "අපි දැන් පිට පළාත්වලිනුත් ක්‍රීඩකයන් හඳුනා ගනිමින් සිටිනවා. ඊට හොඳම උදාහරණයක් පසිඳු බණ්ඩාර. ඔහු අනුරාධපුරේ. වයස අවුරුදු 20යි. කොළඹ පාසලක ඉගෙනුම ලබන ඔහුට ඉහළ ම මට්ටමේ පුහුණුව ලබා දීමෙන් පසු පසිඳු පසුගියදා ශ්‍රී ලංකාවට පැමිණි නවසීලන්තයේ කිලෝග්‍රෑම් 85ට අඩු කණ්ඩායමට එරෙහි ව තරග කළා. මෙවැනි තව ක්‍රීඩකයන් ඉදිරියට ඒවි." යනුවෙන් ශ්‍රී ලංකා රග්බි සංගමය අදහස් දක්වන්නේ




අනාගතය පිළිබඳ සුබ පෙරනිමිති පහළ කරමින්.

පළාත් මට්ටමෙන් රග්බි ක්‍රීඩා කළ පාසල් ක්‍රීඩකයන් දැන් යාපනය, රජරට, වව්නියාව වැනි විශ්වවිද්‍යාලවල රග්බි ක්‍රීඩා කරනවා. දිවයිනේ තිබෙන සරසවි 16යේ ම දැන් රග්බි ක්‍රීඩා කරන බවත් අන්තර් විශ්වවිද්‍යාල රග්බි තරගාවලියක් ජූනි මස අග සිට ජූලි මස අග දක්වා පැවැත්වෙන බවත් එම සංගමය පවසනවා. ප්‍රාදේශීය මට්ටමේ ක්‍රීඩාවේදී වව්නියාවේ සාර්ථක ව පැවති තරගාවලියට එම ප්‍රදේශයේ රග්බි කණ්ඩායම් 08ක් සහභාගි වීම විශේෂත්වයක්.

**මැලේසියාවට එරෙහි ව වාර්තා කළ මේ දැවැන්ත ජයග්‍රහණයත් සමග ශ්‍රී ලංකාව නවතම ලෝක ශ්‍රේණිගත කිරීමේ එක් පියවරක් ඉහළට තබමින් අංක 39 ස්ථානයට පිවිසියා. මේ අනුව ශ්‍රී ලංකාව දැන් ආසියාවේ ශ්‍රේණිගත ව සිටින්නේ අංක 04ට. ඒ, ජපානය, හොංකොං හා දකුණු කොරියාවට පමණක් පසුපසින් සිටිමින්. ආසියාවේ ඉහළ ම රග්බි කණ්ඩායම් හතර අතරේ සිටින එක ම දකුණු ආසියානු කණ්ඩායම වන්නේ ද ශ්‍රී ලංකාව.**

ආසියානු රග්බි ශූරතාවලියෙන් පසුව එළඹෙන්නේ ශ්‍රී ලංකා ජ්‍යෙෂ්ඨ කණ්ඩායම සහභාගි වන ආසියානු සෙවන්ස් තරගාවලිය. සැප්තැම්බර්-ඔක්තෝබර් වකවානුවේ පැවැත්වෙන එම තරගාවලියට ආධාර වන තරගාවලි කිහිපයක් ම ඉදිරියේ පැවැත්වීමට රග්බි සංගමය සූදානමින් සිටිනවා.

පාසල් මට්ටමේ රග්බි ක්‍රීඩාවේ ප්‍රවර්ධනය ද සිදුවෙමින් පවතින බව පෙන්වා දෙන ශ්‍රී ලංකා රග්බි සංගමය අවුරුදු 20න් පහළ බාලක බාලිකා සත් සාමාජික ආසියානු තරගාවලියට සූදානම් කිරීම පිණිස සිසු සිසුවියන් නිදහස් කරන ලෙසට පාසල් රග්බි සංගමයට දන්වා ඇතැයි සඳහන් කරනවා. අගෝස්තු 9,10 දිනවල ඉන්දියාවේ බිනාර් නුවර පැවැත්වෙන මේ තරගාවලිය වෙනුවෙන් ශ්‍රී ලංකා සංචිතය තේරීම ජූලි 10 දිනට නියමිත ව තිබෙනවා.

ජාත්‍යන්තර තරග කැලැන්ඩරයේ ඊළඟට පිවිසෙන්නේ චීනයේ පැවැත්වෙන අවුරුදු 18න් පහළ බාලක බාලිකා ආසියානු සෙවන්ස් තරගාවලිය. "ඉදිරියේ සෑම මාසයක ම ලංකාවට රග්බි තියෙනවා" යනුවෙන් සංගමය පවසනවා.

කාන්තා රග්බි ක්‍රීඩාව ප්‍රවර්ධනය සඳහා ලෝක රග්බි සම්මේලනයේ අවධානය යොමු ව තිබීම ඉතා වැදගත්. මේ සම්බන්ධයෙන් රග්බි පන්දු 1000ක් ශ්‍රී ලංකාවට ලැබී තිබෙන අතර මේවා පාසල්වලට බෙදා දීමටයි නියමිත. දිවයිනේ දිස්ත්‍රික්ක 25න් ජාතික ක්‍රීඩිකාවන් 25 දෙනකු බඳවාගෙන ඔවුන් පාසල්වල සිටින ශාරීරික අධ්‍යාපන උපදේශකවරුන් සමග එක් ව පාසල් රග්බි ක්‍රීඩාව නැංවීමට යොදවන බව ද ශ්‍රී ලංකා රග්බි සංගමය සඳහන් කරනවා.

ආසියාවේ සංවිධානාත්මක සමාජ රග්බි ක්‍රීඩාවේ දීර්ඝතම සම්ප්‍රදාය තිබෙන්නේ ශ්‍රී ලංකාවට. 1879 වසර දක්වා ඈතට දිවෙන එහි උපත සිදුවූයේ එංගලන්තයේදී ලෝක රග්බි සංගමය ප්‍රථම වරට පිහිටුවා වසර 08කට පසුව.

ශ්‍රී ලංකාවේ අන්තර් සමාජ රග්බි ක්‍රීඩාව ඉතාමත් සාර්ථක ව පැවැතිය ද වර්තමානයේ කාන්තා රග්බි ක්‍රීඩාව තිබෙන්නේ යුද හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව සහ සී.ආර්.ඇන්ඩ් එෆ්.සී. යන ක්‍රීඩා සමාජවල පමණයි. දිවයිනේ කාන්තා රග්බි ක්‍රීඩාවේ දියුණුවට අතදීමට ඉදිරිපත් ව සිටින ලෝක රග්බි ආයතනය ශ්‍රී ලංකාවේ අනෙකුත් රග්බි ක්‍රීඩා සමාජවල ද කාන්තා රග්බි ආරම්භ කරන ලෙසට දන්වා තිබෙනවා.

දිවයිනේ සෑම රග්බි තරගාවලියක් ම පැවැත්වෙන්නේ අනුග්‍රාහකයන්ගේ පිහිටෙන් පමණක් බව ශ්‍රී ලංකා රග්බි සංගමය අවධාරණය කරන කාරණයක්.


# දිනූ අනුදි

**නුවන් කුමාර කටුගම්පල**

ඉන්දියාවේ හයිද්‍රාබාද්හි හයිටෙක්ස් (HITEX) ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ පැවති (2025 මැයි 31) 72 වැනි ලෝක රූ රැජින තරගයේ ශ්‍රී ලංකාව නියෝජනය කළේ නිරූපිකාවක්, සමාජ ක්‍රියාකාරිනියක් සහ රූපලාවන්‍ය ශිල්පිණියක් වන අනුදි ගුණසේකර. 2024 වසරේදී ශ්‍රී ලංකා රූ රැජින ලෙස කිරුළ පැලඳි ඇය කැලණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ උපාධිධාරිණියක්. රටවල් සහ ප්‍රදේශ 108ක තරගකාරියන් මෙවර ලෝක රූ රැජින තරගයට සහභාගි වුණා.

ලෝක රූ රැජින තරගයක කුසලතා (Miss World Talent), හිසට හිස (Miss World Head to Head) සහ බහුමාධ්‍ය (Miss World Multimedia) යන තරග අංශවල අවසන් වටය නියෝජනය කළ පළමු වැනි ශ්‍රී ලාංකික තරගකාරිය ද වීමේ වරම මෙවර ඇයට හිමි වුණා.

ලෝක රූ රැජින තරගාවලිය මහාද්වීප පාදක ආකෘතියකිනුයි ක්‍රියාත්මක වන්නේ. අප්‍රිකාව, ඇමරිකාව සහ කැරිබියන්, ආසියාව සහ ඕෂනියා, යුරෝපා යන මහාද්වීප කලාප හතර අතුරෙන් එක් මහද්වීපයකින් තරගකාරියන් දස දෙනා බැගින් ඉහළ ම ලකුණු ලබා ගන්නා 40 දෙනා මුලින් තෝරා ගැනෙනවා. ඒ අතරට තරගකාරී නොවන අංශයෙන් (Fast Track winners) සුදුසුකම් ලබන ජයග්‍රාහකයන් ද ඇතුළත්. ඉන්පසුවයි සෑම කලාපයකින් ම ඉහළම සුදුසුකම් ලාභිනියන් 05 බැගින් 20 දෙනකු තෝරා ගන්නේ. කලාපයකට ඉහළ ම ලකුණු ලබන 02 දෙනෙකු බැගින් 08 දෙනකු දක්වා තවදුරටත් අඩු වී පසුව එය ද කලාපයකින් එක් අයකු බැගින් අවසන් තරගකරුවන් 04 දෙනා දක්වා රැගෙන එනවා. ලෝක රූ රැජින ලෙස කිරුළ පලඳින්නේ ඔවුන් අතරින් එක් අයෙක්. අනෙක් තිදෙනා පළමු, දෙවැනි සහ තෙවැනි අනුශූරියන් ලෙස නම් කෙරෙනවා. එපරිද්දෙන් මෙවර තේරී පත්වූ ලෝක රූ රැජින වූයේ තායිලන්තයේ Opal Suchata Chuangsri.



ලෝක රූ රැජින Opal Suchata Chuangsri.





**දෙසතිය** පුවත් සඟරාව

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්

www.dgi.gov.lk www.news.lk

පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත

Department of Government Information
news.lk
GFU Sri Lanka

Rs. 100/-